පොල් සංවර්ධන අධිකාරිය
தெங்கு அபிவிருத்தி அதிகாரசபை
Coconut Development Authority

# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT
# 2023









කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
விவசாய மற்றும் பெருந்தோட்ட கைத்தொழில் அமைச்சு
Ministry of Agriculture and Plantation Industries

# පොල් සංවර්ධන අධිකාරිය

## වාර්ෂික වාර්තාව
## 2023

**කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය**

# පොල් සංවර්ධන අධිකාරිය

## අපගේ දර්ශනය

"පොල් කර්මාන්තය දළ දේශීය
නිෂ්පාදනය සඳහා
වැඩිලි ක්ෂේත්‍රයෙන් ඉහළතම
දායකත්වය ලබා දෙන්නා වීම සහ
නිෂ්පාදන අළෙවි විවිධාංගීකරණයේ දී
ගෝලීය නායකයා වීම"

## අපගේ මෙහෙවර

"ගෘහස්ථ පරිභෝජනය සහ කර්මාන්තය සඳහා
පොල් සහ පොල් නිෂ්පාදන සැපයුම
තහවුරු කිරීම මගින්,
පොල් කර්මාන්තය දීර්ඝ කාලීන වාණිජමය
ඵලදායීතාවය, තිරසාරත්වය හා ජාතික ආර්ථිකය
සඳහා ඉහළ දායකත්වයක් කරා
ගෙන ඒම සඳහා පහසුකම් සැපයීම"

# හැඳින්වීම

පොල් සංවර්ධන අධිකාරිය පිහිටුවීමට පෙර මුල් අවධියේ පොල් මණ්ඩලය නමින් ස්ථාපිත කර පසුකාලීනව එය පොල් සැකසුම් මණ්ඩලය, කෙඳි මණ්ඩලය හා පොල් අලෙවි මණ්ඩලය ලෙස විමධ්‍යගත කරන ලදී. පසුව එම සියළුම ආයතන එක් කොට සමස්ත පොල් කර්මාන්තයේ සංවර්ධනය සඳහා 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනතෙහි "පොල් සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ අධිකාරියක් පිහිටවනු ලැබිය යුතුය." යන 111 වන කොටසේ 24 වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ප්‍රධානම ව්‍යවස්ථාපිත ආයතනය පොල් සංවර්ධන අධිකාරිය වේ.

ඉන්පසු 1980 දී පොල් සංවර්ධන අධිකාරිය නමින් වර්තමාන ආයතනය පොල් සහ පොල් නිෂ්පාදන කර්මාන්ත සම්බන්ධ ප්‍රධාන ආයතනය වශයෙන් පිහිටුවන ලදී.

එමෙන්ම පොල් සංවර්ධන අධිකාරියට හිමි වූ බලතල අනුව පිරිසැකසුම්, තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ, දේශීය හා විදේශීය වශයෙන් අලෙවි සංවර්ධන හා පර්යේෂණ යන ක්ෂේත්‍රයන් හි සහ කර්මාන්තයට අදාල ප්‍රතිපත්ති සකස් කිරීමේ දී අමාත්‍යතුමාට සහය දැක්වීම යනාදී අනෙකුත් අනුබද්ධිත කාර්යයන් හි දී පොල් කර්මාන්තය හා සම්බන්ධ ප්‍රධාන ආයතනය වශයෙන් නියාමන බලතල භාවිතය, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම, මඟ පෙන්වීම, තාක්ෂණය ලබා දීම, ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය වන අනුමැතීන් සහ මූල්‍යාධාර ලබා දීම යනා දී කාර්යයන් හි නිරත වේ.

මෙයට අමතරව පිරිසැකසුම්, තත්ත්ව පාලනය හා තත්ත්ව ආරක්ෂණය, අලෙවිකරණය යනාදී අංශයන්ට අදාලව කර්මාන්තයේ නිරත සුළු, මධ්‍යම හා මහා පරිමාණ ව්‍යවසායකයින් සම්බන්ධ සංවර්ධන හා පහසුකම් සැලසීමේ කටයුතු, අධීක්ෂණ හා නියාමන කටයුතු ආදී ඍජු මෙහෙයුම් කාර්යයන්වලදී හා සමස්ත කර්මාන්තයේ උන්නතිය සඳහා වගකීම දැරීමට පොල් සංවර්ධන අධිකාරිය වෙත බලතල පැවරී ඇත.

අමාත්‍යාංශය විසින් පොල් කර්මාන්තය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රතිපත්ති හඳුනාගෙන සකස් කිරීමේදී ඒ සඳහා සහය දැක්වීමේ කාර්යයන් ඉටු කිරීමට අමතරව පොල් කර්මාන්තයේ පිරිසැකසුම් සහ අලෙවිකරණ අංශයන් සංවර්ධනය කිරීමේදී, අධීක්ෂණය කිරීමේදී මෙහෙයුම් කාර්යභාරය ක්‍රියාත්මක කිරීම උදෙසා කාර්යයමය වශයෙන් පොල් සංවර්ධන අධිකාරියේ සැකසුම් සංවර්ධන අංශය, තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය, අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය, මුදල් අංශය සහ පාලන අංශය යනුවෙන් ක්‍රියාකාරී අංශ 5 කින් සමන්විත වන අතර ඒ එක් එක් අංශය භාරව අධ්‍යක්ෂවරයෙක් කටයුතු කරයි. මෙම කාර්යයන් ඉටුකරගැනීමේ දී ඉංජිනේරු අංශය සහ අභ්‍යන්තර විගණන අංශය ඉහත අංශ වලට සහය වේ.

සභාපති ප්‍රධානියා වශයෙන් කටයුතු කරන අතර අධිකාරියේ වැඩ කටයුතු මෙහෙයවීම, අධීක්ෂණය සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස් කරනු ලබන ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා හරහා සියළුම අංශ වල අංශ ප්‍රධානීන් හරහා ඉටු කරනු ලබයි. මෙම අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 259 කි. 2023 වර්ෂයේදී සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව 188 ක් වූ අතර එම සේවක සංඛ්‍යාවෙන් 31 දෙනෙකු කළමනාකරණ මට්ටමේ අය වූහ.

# සභාපතිගේ සමාලෝචනය

ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය නියාමනය සඳහා පිහිටුවන ලද ප්‍රධානතම ආයතනය ලෙස රටේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා පොල් කර්මාන්තයේ දායකත්වය වර්ධනය කිරීමේ මූලික වගකීම පොල් සංවර්ධන අධිකාරිය සතු වේ. මේ සඳහා සුළු හා මධ්‍යම පරිමාණයේ සිට මහා පරිමාණ ව්‍යාපාර දක්වා නිෂ්පාදන ක්‍රියාවලීන් අධීක්ෂණය, නව තාක්ෂණික ක්‍රමවේද හඳුන්වාදීම, රසායනාගාර සේවා සැලසීම මෙන්ම දෙස් විදෙස් වෙළඳපල අවස්ථා පුළුල් කිරීම ඇතුළු කටයුතු රාශියක් අප විසින් සිදුකරනු ලබයි.

මෙම වසර තුල සෞදි අරාබි රාජ්‍ය වෙත කොහුබත් උපස්ථර අපනයනය කිරීමේදී අවශ්‍ය වන නිරෝධායන ක්‍රමවේදය පිළිබඳව දෙරට අතර එකඟතාවයක් ඇතිකරගැනීම මගින් එම නිෂ්පාදන සඳහා වෙළඳපල විභවතාවය පුළුල් කරගැනීමට හැකිවීම අප ලැබූ විශාල ජයග්‍රහණයකි. මීට සමගාමීව චීනයේ හයිනෑන් ප්‍රාන්තය සමග සබඳතා වර්ධනය කරගනිමින් පොල් ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන ප්‍රමාණය වැඩි කිරීමට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමටද අපට හැකි විය.

මෙම ජාත්‍යන්තර පරිශ්‍රමයන් අතරතුර උතුරු පළාතේ නව පොල් ත්‍රිකෝණයක් ස්ථාපනය කිරීම, තැඹිලි මව් ශාක වගාවක් පිහිටුවීම හා පටක රෝපණය මගින් ගුණාත්මක තැඹිලි පැළ ලබාගැනීමට අවශ්‍ය විද්‍යාගාර පිහිටුවීම වැනි කාර්යයන් සඳහා අපගේ සහෝදර ආයතන වලට අවශ්‍ය මූල්‍යමය සහයෝගය දැක්වීමටද අප ක්‍රියාකරන ලදී.

මේ අයුරින් 2023 වසරේදී පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනයෙන් ඇ.ඩොලර් මිලියන 700 ඉක්මවන අපනයන ආදායමක් රට තුලට ගෙන එන අතරම අනාගතයේදී මෙම අදායම තවදුරටත් වර්ධනය කරගැනීම සඳහා ශක්තිමත් අඩිතාලමක් සකස් කිරීමටද අපට හැකි විය. නුදුරු අනාගතයේදී ජෛව තාක්ෂණික ක්‍රමවේදයන්, නවීන නිෂ්පාදන ක්‍රියාවලීන් හා කෘතීම බුද්ධිය භාවිත කරමින් ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය නවමු මාවතක් කරා ගෙනයාමට මෙම වසර තුළ අප විසින් සිදුකල කර්තව්‍යය ඉවහල් වනු ඇති බව මාගේ විශ්වාසයයි.



මහාචාර්ය රොෂාන් පෙරේරා

සභාපති

# අධ්‍යක්ෂ ජනරාල්ගේ සමාලෝචනය

සමස්ත පොල් කර්මාන්තයේ සංවර්ධනය සඳහා පිහිටුවන ලද ප්‍රධානතම ව්‍යවස්ථාපිත ආයතනය පොල් සංවර්ධන අධිකාරිය වේ. පොල් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත අධීක්ෂණය, නියාමනය හා තත්ත්ව පාලනය සිදු කිරීම, අපනයනය හා බැඳි සියලු සේවාවන් සැපයීම හා අධීක්ෂණය, පොල් ආශ්‍රිත නිෂ්පාදන රට තුළ සහ රටින් පිටත ප්‍රවර්ධනය කිරීම මෙහි කාර්යභාරයන් අතර ප්‍රධාන තැනක් හිමි කර ගනී. පොල් සංවර්ධන අධිකාරිය පොල් කර්මාන්තයේ නියාමන ආයතනය ලෙස  මූලික වශයෙන් පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තවලට දායකත්වය සපයනු ලබන අතර ග්‍රාමීය ප්‍රදේශවල පොල් ආශ්‍රිත කර්මාන්තවල නියැලී සිටින සහ උනන්දුවක් දක්වන අය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම, ව්‍යවසායකයින් හඳුන්වාදීම සහ වෙළඳපල සම්බන්ධීකරණය සඳහා ද අධිකාරිය සැලකිය යුතු දායකත්වයක් සපයයි.

ශ්‍රී ලංකාව තුළ සමස්ත පොල් නිෂ්පාදනයෙන් 60%ක් පමණ ගෘහාශ්‍රිතව පරිභෝජනයට ද ඉතිරිය පොල් මඳ ආශ්‍රිත අපනයන කර්මාන්ත වන පොල්කිරි, දිසිඳි පොල්, පිටිකල පොල්කිරි, පොල්තෙල්, පොල්ක්‍රීම් ආදී වශයෙන් පොල් කර්මාන්තයට යොදා ගනී. පොල් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන විවිධ ශීර්ෂයන් යටතේ විවිධාංගීකරණ වූ අගයදාම ක්‍රියාවලියක් සහිත නිෂ්පාදන රාශියක් සිදු කරනු ලබයි. ලෝක වෙළඳපොළ තුළ පවත්නා ඉල්ලුමට සරිලන ඉහළ තත්ත්වයෙන් යුතු නිෂ්පාදන ඉදිරිපත් කිරීම මගින් ජාත්‍යන්තර වෙළඳපොළ ප්‍රවේශය  පුළුල් කිරීමට මග පෙන්වීම අධිකාරිය විසින් මෙම වසරේදී සිදුකර ඇත.

ශ්‍රී ලංකාවේ වාර්ෂික ගෙඩි පොල් අපනයනය ගෙඩි 14,127,000 ක් පමණ වන අතර තැඹිලි අපනයනය ගෙඩි 12,909,100 ක් පමණ වේ. මෙය පසුගිය වසර හා සසඳන විට ධනාත්මක වර්ධනයකි. පොල් මඳ ආශ්‍රිත කර්මාන්ත වලට අමතරව පොල් කටු අඟුරු හා ඒ අනුසාරයෙන් නිෂ්පාදනය කරන සක්‍රීය කාබන් පොල් ආශ්‍රිත නිෂ්පාදන අතර ප්‍රමුඛතාවයක් ගනී. එසේම පෙර වසර හා සැසඳීමේදී අපනයන ආදායමේ අඩුවක් දක්නට ලැබුණද පොල් ලෙල්ල ආශ්‍රිත නිෂ්පාදන අපනයන ආදායම කෙරෙහි සැලකිය යුතු දායකත්වයක් දක්වා ඇත. ලෝක ආර්ථික අර්බුදය ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රයට අහිතකර ලෙස බලපෑම් ඇති කල අතර, අභියෝග මධ්‍යයේ වුව ද, පොල් ආශ්‍රිත කර්මාන්ත 2023 වර්ෂයේ පොල් ආශ්‍රිත නිෂ්පාදන මගින් ලැබූ අපනයන ආදායම රු. මිලියන 228,720ක්, එනම් ඇමරිකානු ඩොලර් මිලියන 700 ක් පමණ වේ.

කුරුණෑගල, පුත්තලම, ගම්පහ කේන්ද්‍ර වූ සාම්ප්‍රදායික පොල් ත්‍රිකෝණය තුළ වැඩිම පොල් වගා ඝණත්වයක් දැකිය හැකි අතර එම ප්‍රදේශ වල පොල් ආශ්‍රිත කර්මාන්ත වැඩි ප්‍රමාණයක් ද කේන්ද්‍රගත වී තිබේ. මීට අමතරව මෙම වසරේ ජාත්‍යන්තර පොල් දිනයට සමගාමීව මෙම අධිකාරියේ මූල්‍ය දායකත්වයෙන් උතුරු පළාතේ යාපනය, මන්නාරම හා මුලතිව් දිස්ත්‍රික්ක ආශ්‍රිතව තවත් පොල් ත්‍රිකෝණයක් ස්ථාපිත කිරීමේ කටයුතු සාර්ථකව අවසන් කරන ලදී.

ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය නඟා සිටුවීම සඳහා නවීන තාක්ෂණය යොදාගනිමින්, විදේශ වෙළෙඳපොළේ වැඩි ඉල්ලීමක් ඇති භාණ්ඩ සඳහා ප්‍රමුඛතාව ලබාදෙමින්, දළ දේශීය නිෂ්පාදනය සඳහා වැවිලි ක්ෂේත්‍රයෙන් ඉහළතම දායකත්වය පොල් කර්මාන්තය තුළින් ලබා දීමට කටයුතු කළ හැකි ආයතනය බවට පත්වීම පොල් සංවර්ධන අධිකාරියේ අපේක්ෂාව වේ.

ජනක ප්‍රේමරත්න
අධ්‍යක්ෂ ජනරාල්

## 2023 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්

| | |
|---|---|
| ■ මහාචාර්ය රොෂාන් පෙරේරා මහතා | - සභාපති |
| ■ එම්.සී.එන්.බාලසූරිය මහත්මිය | - මුදල් අමාත්‍යාංශ නියෝජිත |
| ■ එන්.එස්.වනසිංහ මහතා (2023.05.23 සිට)<br>කේ.එම්.බී.ටී.කරුණාසේන මහත්මිය (2023.05.22 දක්වා ) | } අමාත්‍යාංශ නියෝජිත |
| ■ සමරසේන කලහේවත්ත මහතා (2023.09.07 සිට) | - සාමාජික |
| ■ ප්‍රියලත් කීඹියහෙට්ටිගේ මහතා | - සාමාජික |
| ■ උපාලි ධම්මික ද සිල්වා මහතා | - සාමාජික |
| ■ ඒ.එස්.බී.නාගහපිටිය මහතා | - සාමාජික |
| ■ ටී.එම්.ජූඩ් ඇන්ටන් පීරිස් මහතා | - සාමාජික |

## සභාපති ඇතුළු අංශ ප්‍රධානීන්

| | |
|---|---|
| මහාචාර්ය රොෂාන් පෙරේරා මහතා | - සභාපති |
| 1. ජනක ප්‍රේමරත්න මහතා | - අධ්‍යක්ෂ ජනරාල් |
| 2. එස්.එස්.පුරසිංහ මහත්මිය | - අධ්‍යක්ෂ (තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ) |
| 3. එම්.පී .සන්ධ්‍යා කාන්ති මහත්මිය | - අධ්‍යක්ෂ (මුදල්) |
| 4. පී.ඒ.කේ.සම්පත් සමරවික්‍රම මහතා | - අධ්‍යක්ෂ (අලෙවි සංවර්ධන හා පර්යේෂණ) (2023.09.03 දක්වා ) |
| එච්.එම්.ඩී.වාසුලා හේරත් මහත්මිය | - අධ්‍යක්ෂ (අලෙවි සංවර්ධන හා පර්යේෂණ) රා.ආ (2023.09.07 සිට) |
| 5. එස්.ඩබ්ලිව්.රසිකා මහත්මිය | - අධ්‍යක්ෂ (පරිපාලන) රා.ආ (2023.05.07 දක්වා) |
| ඒ.ආර්.කුලතුංග මහතා | - අධ්‍යක්ෂ (පරිපාලන) රා.ආ (2023.05.08 සිට) |
| 6. ඊ.ඩබ්.ඩී.වී.යූ.රම්‍යදාස මහතා | - අධ්‍යක්ෂ (සැකසුම් සංවර්ධන) රා.ආ |
| 7. ඩබ්. එම්. ටී. එස්. වීරසූරිය මහතා | - අභ්‍යන්තර විගණක (2023.03.01 දක්වා) |
| ටී.ඉෂානි බුද්ධිකා ආනන්ද මෙනවිය | - අභ්‍යන්තර විගණක රා.ආ (2023.03.16 සිට) |

# 2024.12.31 දිනට සංවිධාන ව්‍යුහය




කෙටි යෙදුම් :

1. ජ්‍යෙෂ්ඨ කළ. - ජ්‍යෙෂ්ඨ කළමණාකරණ මට්ටම
2. ස/නිඅධ්‍යක්ෂ - සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ
3. කළ. මට්. - කළමණාකරණ මට්ටම
4. අභ්‍යන්තර වි.නිලධාරී - අභ්‍යන්තර විගණන නිලධාරී
5. පරි. නිලධාරී - පරිපාලන නිලධාරී
6. ආර්. පර්. නිලධාරී- ආර්ථික පර්යේෂණ නිලධාරී
7. සැ. සං. නිලධාරී - සැකසුම් සංවර්ධන නිලධාරී
8. තත්. පාලන නිලධාරී- තත්ත්ව පාලන නිලධාරී
9. කණි.කළ. - කණිෂ්ඨ කළමණාකරණ මට්ටම
10. අලෙ. සං. හා. පර්. - අලෙවි සංවර්ධන හා පර්යේෂණ
11. තත්. පා. හා ආර. තත්ත්ව පාලන හා තත්.ආරක්ෂණ

## පටුන


| | | පරිච්ඡේද අංකය |
|---|---|---|
| 1. | සැකසුම් සංවර්ධන අංශය | 01 |
| 2. | තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය | 02 |
| 3. | අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය | 03 |
| 4. | පරිපාලන අංශය | 04 |
| 5. | මුදල් අංශය | 05 |
| 6. | අභ්‍යන්තර විගණන අංශය | 06 |
| 7. | විගණකාධිපති වාර්තාව | 07 |

# 01.සැකසුම් සංවර්ධන අංශය

1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 20 වගන්තිය ප්‍රකාරව, පොල් සංවර්ධන අධිකාරියේ අරමුණු, ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද නියෝගයක් මගින් අධිකාරිය වෙත පවරා තිබෙන අතර, ඉන් පොල් කර්මාන්තයේ නිෂ්පාදන ක්‍රියාවලිය, කාර්මික ක්‍රියාවලිය, පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන මෙරට සහ අපනයන වෙළඳපොළට යැවීම සම්බන්ධ අධීක්ෂණය කිරීමේ කටයුතු සහ කර්මාන්ත සංවර්ධනය කිරීමේ කටයුතු සැකසුම් සංවර්ධන අංශය මගින් සිදු කෙරේ.

ඒ යටතේ පසුගිය වර්ෂයේ මෙන්ම 2023 වර්ෂයේදී ප්‍රධාන වශයෙන් පහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සැකසුම් සංවර්ධන අංශය සැලසුම් සකස් කරන ලදී.

1. පොල් ආශ්‍රිත නිෂ්පාදන, නිෂ්පාදනය කිරීම සහ නිෂ්පාදනය කිරීමට සහාය වීම, නියාමනය කිරීම මගින් දේශීය හා ජාත්‍යන්තර ප්‍රමිති පිරිවිතර හා ගැලපෙන ලෙස සකස් කල නිෂ්පාදන අපනයනය සඳහා ඉදිරිපත් කිරීමට සහාය වීම.
2. දිසිඳි පොල් කර්මාන්තයේ සංවර්ධන කටයුතු එනම්, නවීන තාක්ෂණය භාවිත කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මෝල් සංවර්ධන අරමුදල හරහා දායකත්වය ලබා දීම.
3. ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරන සහ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන පොල් ආශ්‍රිත නිෂ්පාදන වල ගුණාත්මක තත්ත්වය පිළිබඳ ප්‍රමිති නියම කිරීම සහ ඒවා පවත්වා ගැනීම.
4. අගය වැඩිකල පොල් නිෂ්පාදන නිපදවීම සඳහා ශිල්පීය සහාය සහ මූල්‍ය සහාය ලබාදීම.
5. පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා කාරක හා ප්‍රාග්ධන පහසුකම් සලසා දීම මගින් නිෂ්පාදන කාර්යක්ෂමතාව, සඵලත්වය ඉහල නංවාලීම හා ඒකක පිරිවැය අවම කිරීම.
6. පොල් ආශ්‍රිත නිෂ්පාදකයින් සඳහා ඇති නව ප්‍රවණතා, තාක්ෂණය හා පර්යේෂණ සඳහා ප්‍රේරණය ඇති කිරීම හා නිපුණතා වර්ධනය සඳහා දේශීය හා විදේශීය තාක්ෂණය වෙත කර්මාන්තකරුවන් යොමු කිරීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා නිලධාරීන් පුහුණු කිරීම.
7. අවිධිමත් පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත නඟා සිටුවීම සඳහා දායකත්වය ලබා දීම.

මෙම සැලසුම්කරණයෙන් පොල් සංවර්ධන අධිකාරියේ මෙහෙවර හා දැක්ම පදනම් කර ගනිමින්, තිරසාර සංවර්ධනය ඉලක්ක කර ගනිමින් නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය වර්ධනය කිරීම හා ඉලක්කගත අපනයන ආදායම් වර්ධනය කර ගැනීම මූලික වශයෙන් අපේක්ෂා කරන ලදී.

ඒ අනුව, 2023 වර්ෂයේ ඉහත සඳහන් කල සැලසුම් ක්‍රියාවට නැංවීම සඳහා සැකසුම් සංවර්ධන අංශය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පහත පරිදි වේ.

## 1. පොල් ආශ්‍රිත කර්මාන්ත, නිෂ්පාදකයෙකු ලෙස ලියාපදිංචි කිරීම

මේ තුළින් රටේ පවත්නා නීතිරීති හා රෙගුලාසි අනුව කර්මාන්තය පවත්වා ගෙනයාමට කර්මාන්තකරුවන් යොමු කරවීම ප්‍රධාන අරමුණ වේ. 2023 වර්ෂයේ පොල් ආශ්‍රිත නිෂ්පාදකයන් හා සැකසුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා පෙර වර්ෂයේදී මෙන් ලියාපදිංචි දිනයේ සිට වර්ෂයක කාලයක් ලබාදෙන ලදී. ලියාපදිංචිය වඩාත් පහසු කරලීම පිණිස මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ ලියාපදිංචිය ඉල්ලුම් කිරීමට කර්මාන්තකරුවන්ට අවස්ථා සලසා දෙන ලදී.

සියලුම පොල් මද ආශ්‍රිත නිෂ්පාදන සඳහා (සම්ප්‍රදායික පොල්තෙල්, කොප්පරා, පොල්පැණි, පොල් සීනි හැර), ISO 22000 • 2018 ආහාර ආරක්ෂණ කළමනාකරණ පද්ධති සහතිකයත්, සියලුම කොහුබත් උපස්ථර සඳහා යහපත් නිෂ්පාදන භාවිතාවන් (GMP) පිළිබඳ සහතිකයත් ලබා ගැනීම අනිවාර්යය කෙරුණි. එම අවශ්‍යතා සම්පූර්ණ කරන ලද කර්මාන්තකරුවන් පහත පරිදි අධිකාරිය සමග ලියාපදිංචි වී ඇත.

වගුව 1: 2023 වර්ෂයේ කර්මාන්තකරුවන්ගේ ලියාපදිංචිය

| | නිෂ්පාදන වර්ගය | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|
| 1 | දිසිඳි පොල් | 44 | 49 | 53 |
| 2 | පොල් ක්‍රීම්/ කිරම | 18 | 16 | 15 |
| 3 | පොල් තලප | 13 | 16 | 20 |
| 4 | කොප්පරා පොල්තෙල් | 133 | 110 | 146 |
| 5 | නැවුම් පොල්තෙල් | 49 | 47 | 48 |
| 6 | සුදු පොල්තෙල් | 60 | 81 | 83 |
| 7 | MCT තෙල් | 2 | 3 | 3 |
| 8 | MCT පවුඩර් | 2 | 1 | 2 |
| 9 | කාබනික පොල්තෙල් | 5 | 6 | 5 |
| 10 | පොල් වතුර | 24 | 25 | 20 |
| 11 | පොල් විනාකිරි | 1 | 1 | 1 |
| 12 | කුරුටු පොල්තෙල් | 47 | 34 | 29 |
| 13 | පොල්කිරි | 26 | 28 | 28 |
| 14 | පිටිකළ පොල්කිරි | 6 | 6 | 7 |
| 15 | පොල්කිරි ආශ්‍රිත නිෂ්පාදන | 6 | 7 | 8 |
| 16 | පොල් බටර් | 8 | 9 | 9 |
| 17 | පොල් සීනි | 8 | 7 | 9 |
| 18 | පිරිපහදු කරන ලද පොල්තෙල් | 10 | 10 | 7 |
| 19 | පොල් රා | 1 | 1 | 1 |
| 20 | මෘදු කාරක ජෙල් | 1 | 1 | 1 |
| 21 | කොප්පරා | 27 | 27 | 19 |
| 22 | පොල් තැවරුම | 5 | 5 | 4 |
| 23 | දිසිඳි පොල් නැවත ඇසුරුම | 8 | 8 | 14 |
| 24 | පොල් සිරප් | 3 | 3 | 2 |
| 25 | ගාන ලද මදපොල් | 1 | 1 | 3 |

| | | | | |
|---|---|---|---|---|
| 26 | පොල් පැණි | 11 | 9 | 9 |
| 27 | පොල්කිරි සැකසුම්කරු | 2 | 3 | 3 |
| 28 | පොල් ඇමිනෝ | 6 | 8 | 6 |
| 29 | පොල් ජෑම් | 1 | 1 | 1 |
| 30 | දිසිඳි පොල් (පතුරු) | 1 | 1 | 1 |
| 31 | පොල් වතුර පවුඩර් | 2 | 2 | 2 |
| 32 | නැවුම් පොල්තෙල් පවුඩර් | 1 | 1 | 1 |
| 33 | නැවුම් පොල්තෙල් (කුරුටු සමග) | 2 | 1 | 0 |
| 34 | දිසිඳි පොල් (පතුරු - කුරුටු සහිත) | 2 | 3 | 6 |
| 35 | පොල් පිටි | 16 | 13 | 17 |
| 36 | පොල් ආශ්‍රිත මද්‍යසාර | 3 | 4 | 4 |
| 38 | පොල් සම්බෝල | 1 | 1 | 1 |
| 38 | සක්‍රීය කාබන් | 9 | 9 | 9 |
| 39 | අගය එකතුකල සක්‍රීය කාබන් | 1 | 1 | * |
| 40 | කොහු /කොහු මෝල් | 226 | 217 | 148 |
| 41 | පොල්කටු අඟුරු කැට | 6 | 9 | 7 |
| 42 | Hub ක්‍රියාකරු | 1 | 1 | 1 |
| 43 | පොල්කටු ගුරු | 30 | 32 | 32 |
| 44 | පොල්කටු කැබලි / පවුඩර් | 6 | 5 | 7 |
| 45 | පොල් කටු ආශ්‍රිත විසිතුරු භාණ්ඩ | 11 | 7 | 7 |
| 46 | නිමි භාණ්ඩ | 125 | 111 | 108 |
| 47 | කොහුබත් උපස්ථර | 139 | 139 | 168 |
| 48 | කෙඳි අතරමැදි නිපැයුම් | 47 | 53 | 50 |
| 49 | වෙනත් | 9 | 9 | 35 |
| | එකතුව | 1166 | 1143 | 1160 |

පසුගිය වසරට සාපේක්ෂව, නිෂ්පාදන ලියාපදිංචියේ සුළු වර්ධනයක් දක්නට ඇත. පෙර වර්ෂවල පරිදිම පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීම සඳහා අධිකාරියේ ලියාපදිංචිය ලත් නිෂ්පදකයෙකුගෙන් නිෂ්පාදන මිලදී ගැනීම අනිවාර්යය කර ඇති බැවින්, ලියාපදිංචිවීම් වලින් 75% කට වඩා වැඩි ප්‍රමාණයක් වර්ෂයේ මුල් කාර්තුවේදී සිදු වී ඇත.



රූපය 1 : පොල් ලෙල්ල ආශ්‍රිත කර්මාන්ත ව්‍යාප්තිය



රූපය 2 : පොල් මද ආශ්‍රිත කර්මාන්ත ව්‍යාප්තිය

රූපය 3 : පොල් කටුව ආශ්‍රිත කර්මාන්ත ව්‍යාප්තිය



## 2. පොල් ආශ්‍රිත නව කර්මාන්ත ආරම්භ කිරීමේදී, පොල් වගාවේ ව්‍යාප්තියට සාපේක්ෂව කර්මාන්ත ව්‍යාප්ත කිරීම සඳහා මැදිහත් වීම

පොල් වගාවට සාපේක්ෂව කර්මාන්ත ව්‍යාප්ත කිරීමේ අරමුණ ඇතිව, නව ව්‍යාපාර ලියාපදිංචියේදී, අදාල ප්‍රදේශය තුළ කර්මාන්තයක් ආරම්භ කිරීම සඳහා ඇති විභවතාවය අධ්‍යයනය කිරීමෙන් අනතුරුව ඒ සඳහා අනුමැතිය ලබාදීමට අධිකාරියේ සහාය ලබා ගන්නා ලෙස කරන ලද ඉල්ලීමට අනුව, 2023 වර්ෂයේදී ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් පොල් ආශ්‍රිත කර්මාන්ත ආරම්භ කිරීම වෙනුවෙන් නව ව්‍යාපාර ලියාපදිංචි සහතික ලබා ගැනීමට අයදුම්කල කර්මාන්තකරුවන් 214 දෙනෙකු සඳහා පොල් සංවර්ධන අධිකාරියේ විරුද්ධත්වයක් නොමැති බවට වූ නිර්දේශය සහිත ලිපි නිකුත් කර ඇත.

ඒ අනුව, 2023 වර්ෂයේදී ව්‍යාපාර ලියාපදිංචිය සඳහා නිර්දේශය ලබාදුන් පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන් අතරින් දිස්ත්‍රික්ක අනුව සහ ලියාපදිංචිය අයදුම්කළ පොල් ආශ්‍රිත කර්මාන්තය අනුව කර්මාන්තකරුවන් සංඛ්‍යාව පහත පරිදි වේ.

වගුව 2: 2023 වර්ෂයේ ව්‍යාපාර නාම ලියාපදිංචිය සඳහා අවසරය ලබාදීම.

| දිස්ත්‍රික්කය/ නිෂ්පාදනය | ඉදල් කොහු | කාර්මික පොල්තෙල් | කොප්පරා | කොප්පරා පොල්තෙල් | කොහු කෙඳි | කොහු ලණු | කොහු බේල් | ටුවයින් | පාපිසි | පොල් පැණි | පොල්කටු අඟුරු | පොල්ලෙලි කැබලි | මිශ්‍ර කොහු | විසිතුරු භාණ්ඩ | විනාකිරි | සුදු පොල්තෙල් | සුදු කොප්පරා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කුරුණෑගල | 1 | 9 | 8 | 19 | 32 | 1 | 1 | 2 | | | 6 | 15 | 22 | | | 8 | 1 | 125 |
| කොළඹ | | | | 2 | | | | | | | | | | 1 | | | | 3 |
| ගම්පහ | | | 2 | 11 | 2 | | | | | 1 | | 6 | | | | 2 | | 24 |
| ගාල්ල | | | 1 | 17 | 1 | | | | 1 | | 1 | | | 1 | | 3 | | 25 |
| නුවර | | | | | | | | | | | | | | | | 1 | | 1 |
| පුත්තලම | | | 2 | 3 | 4 | | | | | | | 1 | | | | | | 10 |
| පොලොන්නරුව | | | 1 | | | | | | | | | | | | | | | 1 |
| බදුල්ල | | | | | | | | | | | | | | | | | | 0 |
| මාතර | 2 | | 2 | 6 | 1 | | | | | | 1 | 2 | | | 1 | | | 15 |
| හම්බන්තොට | | | 1 | 6 | 1 | 1 | | 1 | | | | | | | | | | 10 |
| එකතුව | 3 | 9 | 17 | 64 | 41 | 2 | 1 | 3 | 1 | 1 | 8 | 24 | 22 | 2 | 1 | 14 | 1 | 214 |

පොල් ආශ්‍රිත නව කර්මාන්ත ආරම්භ කිරීමේදී පොල් ත්‍රිකෝණයෙන් පරිබාහිරව ආරම්භ කර එම ප්‍රදේශ වල නිපදවනු ලබන පොල්, කර්මාන්ත අංශය සඳහා යොදා ගැනීමට කර්මාන්තකරුවන් වැඩි උනන්දුවක් ඇති කිරීමට පොල් සංවර්ධන අධිකාරිය අපේක්ෂා කරයි. ඒ සඳහා ක්ෂේත්‍ර නිලධාරීන් මගින් උපදෙස් හා තාක්ෂණික දැනුම ලබාදීමත්, නව කර්මාන්ත පොල් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කිරීමත්, සිදුකිරීමට නියමිතය.

## 3. නියාමන කටයුතු සඳහා පොල් ආශ්‍රිත කර්මාන්ත පරීක්ෂා කිරීම, නිෂ්පාදනයන්ගේ / අපනයන තොග නියැදි ලබා ගැනීම, විශ්ලේෂණය කිරීම සඳහා යොමු කිරීම හා අවශ්‍ය උපදෙස් ලබාදීම

අධිකාරිය වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යයක් ලෙස මෙම කර්තව්‍යය හැඳින්විය හැක. ඒ අනුව, ක්‍රියාත්මක වෙමින් පොල් සංවර්ධන අධිකාරියේ සැකසුම් සංවර්ධන අංශය පෙර වර්ෂවල මෙන්ම 2023 වර්ෂයේ ද, පොල් ආශ්‍රිත කර්මාන්ත පරීක්ෂා කිරීම, ආදර්ශ ලබා ගැනීම, විශ්ලේෂණය සඳහා යොමු කිරීම හා අවශ්‍යතාවය පරිදි කර්මාන්තකරුවන් වෙත තාක්ෂණික උපදෙස් ලබාදීම සිදු කරන ලදී. අධිකාරියේ ලියාපදිංචි නිෂ්පාදන ආයතන, ලියාපදිංචි අවස්ථාවේදීම පරීක්ෂාවට ලක් කෙරෙන අතර, නිෂ්පාදන වර්ගය අනුව එම කර්මාන්ත දෛනිකව, මාසිකව, කාර්තු වශයෙන් පරීක්ෂාවට ලක්කර ඇත. එහිදී, අහඹු ලෙස නියැදි පරීක්ෂාවක් සිදු කිරීම සඳහා සැකසුම් සංවර්ධන අංශය විසින් නියැදි ලබා ගැනීම හා විශ්ලේෂණය සඳහා අධිකාරියේ රසායනාගාරය වෙත යොමු කිරීම ද සිදු කරන ලදී. එම විශ්ලේෂණ වාර්තාවල ප්‍රතිඵල මත අදාල පරිදි කර්මාන්තකරුවන් වෙත තාක්ෂණික උපදෙස් ලබාදීම ක්ෂේත්‍ර නිලධාරීන් හරහා සිදු කෙරුණි.

මෙම වසරේදී, විවිධ නිෂ්පාදන නියැදි 8380 ක් ලබාගෙන විශ්ලේෂණ කටයුතු වෙත යොමු කිරීමට සමත්ව ඇත. මෙම විශ්ලේෂණ මත පදනම්ව අදාල නිෂ්පාදනයන්ගේ තත්ත්වය ඉහල නැංවීම සඳහා කටයුතු කරන ලදී. එමගින් ලෝක වෙළඳපොළට තරඟකාරී නිෂ්පාදන යොමු කරවීම අධිකාරියේ ප්‍රධාන අපේක්ෂාවයි.

ප්‍රධාන පරීක්ෂා කිරීම් වලට අමතරව, පොල් මද ආශ්‍රිත කර්මාන්ත සඳහා ISO • 22000 ආහාර සුරක්ෂිතතාව පිලිබඳ තත්ත්ව සහතික ක්‍රමවේදය සහ පොල් මද නොවන කර්මාන්ත සඳහා යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) තත්ත්ව පද්ධති යන අන්තර්ජාතික තත්ත්ව සහතික ලබා ගැනීමේ ක්‍රමවේදයන්හි විගණන කටයුතු සඳහා දායකත්වය ලබා දීම තුළින් නිෂ්පාදන ක්‍රියාවලිය සහ නිමි නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, එම නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර පිළිගැනීමක් ලබා ගැනීමට දායකවීමද සැකසුම් සංවර්ධන අංශය හරහා සිදුකරන ලදී. ශ්‍රී ලංකා ප්‍රතීතන ආයතනය (SLAB) හා IFA (International Accreditation Forum) යන ආයතන වල ප්‍රතීතනය වූ සහතිකකරණ ආයතන විගණන කටයුතු පවත්වන විට අධිකාරිය නියෝජනය කරමින්, විගණනය සඳහා පුහුණුව ලත් ක්ෂේත්‍ර නිලධාරියෙකු ඒ සඳහා යොමු කරන අතර එම නිලධාරියා විසින් ලබාදෙන නිරීක්ෂණ වාර්තාවට අනුව අදාල ආයතනයන්හි පවතින දුර්වලතා නිවැරදි කිරීමට කටයුතු කිරීම සඳහා යොමු කරන ලදී. 2023 වර්ෂය අවසාන වන විට කර්මාන්ත 38 ක ISO 22000 • 2018 විගණන පරීක්ෂණ සඳහා සහභාගී විය. 2023 වර්ෂය අවසාන වන විට කර්මාන්ත 64 ක GMP විගණන පරීක්ෂණ සඳහා සහභාගී විය.

TIEP ක්‍රමවේදය ඔස්සේ ආනයන හා අපනයනය වන පොල්තෙල් පරීක්ෂා කිරීම ද සැකසුම් සංවර්ධන අංශය හරහා සිදු කෙරුණි. මෙහිදී බහාලුම් 251 ක නියැදි රසායනාගාර පරීක්ෂාවන්ට යොමුකර ඇත. 2023 වර්ෂය අවසාන වනවිට සැකසුම් සංවර්ධන අංශයේ ක්ෂේත්‍ර නිලධාරීන් විසින් පරීක්ෂා කිරීම් 15000 ක් පමණ සිදුකර ඇත.

## 4. ක්ෂුද්‍රජීවී සහ භෞතික තත්ත්ව සහතික නිකුත් කිරීම තුළින් පොල් ආශ්‍රිත නිෂ්පාදනවල ප්‍රමිති පිරිවිතර පවත්වා ගැනීම සඳහා කර්මාන්තකරුවන් යොමු කිරීම

සැකසුම් සංවර්ධන අංශයේ සේවා සමායෝජන ඒකකය මගින් සපයනු ලබන ඉහත සඳහන් සේවාව තුළින්, අපනයනකරුවන් වෙත තම නිෂ්පාදන අපනයනයේදී නිෂ්කාශන කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදු කරගැනීමට මෙම සහතිකපත් ලබා දීම සිදුකෙරේ. මෙම තත්ත්ව සහතික නිකුත් කිරීම නිෂ්පාදන වල විශ්ලේෂණ පිරිවිතර හා ඍජුව සම්බන්ධ වන බැවින් තත්ත්වයෙන් උසස් නිෂ්පාදන සිදු කිරීමට ඔවුන් නිතැතින්ම පෙළඹේ.

2023 වර්ෂය තුල දිසිදි පොල් මෙට්‍රික් ටොන් 31,927 ක් නිෂ්පාදනය කර ඇති අතර ඉන් ක්ෂුද්‍රජීවී සහ භෞතික පරාමිතීන් විශ්ලේෂණය කිරීම සඳහා දෛනික දිසිදි ආදර්ශ 7507 ක් සැකසුම් සංවර්ධන අංශය වෙත ලැබී ඇත. ඒ මත පදනම්ව අපනයන සහතික 3,516 ක් නිකුත් කර ඇත.

**වගුව 3: දිසිදි පොල් අපනයන තොග සඳහා ක්ෂුද්‍රජීවී හා භෞතික තත්ත්ව විශ්ලේෂණ සහතිකපත් නිකුත් කිරීම**

| සහතික වර්ගය | නිකුත් කල සහතිකපත් ගණන | |
|---|---|---|
| | 2022 | 2023 |
| සැල්මොනෙල්ලා රහිත බවට | 456 | 1,639 |
| භෞතික තත්ත්ව විශ්ලේෂණ | 456 | 1,639 |
| ඇෆ්ලටොක්සින් රහිත බවට | 113 | 101 |
| සල්ෆර්ඩයොක්සයිඩ් රහිත බවට | 119 | 137 |
| මුළු ගණන | 1,144 | 3,516 |

මීට අමතරව, අපනයනකරුවන් සහ නිෂ්පාදකයින් විසින් අවශ්‍යතාව මත ගෙනවිත් භාරදෙන පොල් ආශ්‍රිත නිෂ්පාදන ආදර්ශ විශ්ලේෂණ කටයුතු සඳහා රසායනාගාරය වෙත යොමු කිරීමෙන් අනතුරුව ලද ප්‍රතිඵල ලේඛන අනුව පහත පරිදි විශ්ලේෂණ වාර්තා සහතික නිකුත් කර ඇත.

වගුව 4: කර්මාන්තකරුවන්ගේ ඉල්ලීම අනුව ලැබෙන ආදර්ශ සඳහා ප්‍රතිඵල වාර්තා නිකුත් කිරීම

| නිෂ්පාදන වර්ගය | නිකුත් කල වාර්තා ගණන | | |
|---|---|---|---|
| | 2021 | 2022 | 2023 |
| කොහු/කොහුබත් | 437 | 337 | 347 |
| පොල්තෙල් | 411 | 294 | 269 |
| දිසිදි පොල් | 11 | 06 | - |
| මේදය තරමක් ඉවත් කල දිසිදි පොල් | 14 | 25 | 61 |
| පොල් කිරි | - | 03 | 26 |
| පුන්නක්කු | 14 | 09 | - |
| පොල් ක්‍රීම්/ කිරම | 03 | 03 | 02 |
| තැඹිලි | 06 | 01 | - |
| පොල් වතුර | 04 | 04 | - |
| පොල්කටු අඟුරු | 02 | 02 | 07 |
| පොල් | 01 | - | - |
| වෙනත් | - | - | 10 |

## 5. සැකසුම් සංවර්ධන අංශයේ නිලධාරීන්ගේ හා කර්මාන්තවල සේවයේ නියුතු තාක්ෂණික සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂම හා ඵලදායී ලෙස සේවා නියුක්තිය සඳහා නිපුණතා සංවර්ධනය කිරීම

2023 වසර තුළදී සැකසුම් සංවර්ධන අංශයේ නිලධාරීන් සඳහා පුහුණු පාඨමාලා 07 ක් ද, පොල් ආශ්‍රිත නිෂ්පාදන සිදුකරන කර්මාන්තකරුවන් සඳහා පුහුණු පාඨමාලා 04 ක් ද පවත්වා ඇත.මේ සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (Sri Lanka Standard Institute), අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (Sri Lanka Accreditation Board - SLAB), UNIDO ආයතනය, SGS ආයතනය, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය (NIPM) යන ආයතන මගින් ලබාදී ඇත. මෙම පුහුණු පාඨමාලා අතරින්, එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය (United Nations Industrial Development Organization - UNIDO) සහ SGS ආයතනය මගින් ලබාදුන් පාඨමාලා නොමිලයේ ලබාදුන් අතර, අනෙකුත් පාඨමාලා සඳහා පමණක් අධිකාරිය විසින් මුදල් වැය කර ඇත.

මෙම පුහුණු පාඨමාලා සඳහා තාක්ෂණික පුහුණු පාඨමාලා, අපනයනය පිළිබඳ පුහුණු පාඨමාලා සහ කාර්යාල කටයුතු පිළිබඳ පාඨමාලා ඇතුළත් වූ අතර ඒ පිළිබඳව විස්තර පහත දක්වා ඇත.

වගුව 5: සැකසුම් සංවර්ධන අංශයේ නිලධාරීන් වෙත ලබාදෙන ලද පුහුණු වැඩසටහන්

| පුහුණු පාඨමාලාව | පාඨමාලාව පැවැත්වූ ආයතනය |
|---|---|
| ISO 17025 · 2017 | එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය - UNIDO |
| තත්ත්ව කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය - SLSI |
| ලිපිගොනු කළමනාකරණය පිළිබඳ වැඩමුළුව | ජාතික වැවිලි කළමනාකරණ ආයතනය - NIPM |
| පොල් වගාව සහ කළමනාකරණය | පොල් වගා කිරීමේ මණ්ඩලය- CCB |
| ISO 171020 · 2017 අභ්‍යන්තර විගණන | ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය - SLAB |
| ISO 17020 · 2012 | එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය - UNIDO |
| ISO 50001) බලශක්ති කළමනාකරණ | SGS ආයතනය පද්ධතිය හඳුන්වාදීම. |

සැකසුම් සංවර්ධන අංශයේ නිලධාරීන්ගේ තාක්ෂණික දැනුම වර්ධනය කිරීමේ වැඩසටහනට අමතරව, කර්මාන්තකරුවන්ගේ දැනුම වර්ධනය කිරීම පිණිසද පහත පරිදි වැඩසටහන් පොල් ත්‍රිකෝණය ආශ්‍රිතව සිදු කරන ලදී.

වගුව 6: කර්මාන්තකරුවන් වෙත ලබාදෙන ලද දැනුවත් කිරීම්

| දැනුවත් කිරීමේ වැඩසටහන | ප්‍රදේශය |
|---|---|
| අධිකාරිය විසින් නිකුත්කරන ලද නීතිරීති සහ රෙගුලාසි පිළිබඳව කර්මාන්තකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන | ගම්පහ |
| අධිකාරිය විසින් නිකුත්කරන ලද නීතිරීති සහ රෙගුලාසි පිළිබඳව කර්මාන්තකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන | කුරුණෑගල |
| අධිකාරිය විසින් නිකුත්කරන ලද නීතිරීති සහ රෙගුලාසි පිළිබඳව කර්මාන්තකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන | පුත්තලම |
| පොල් ගෙඩි අපනයනකරුවන්ගේ ප්‍රගතිය සහ ඉදිරි වර්ෂයේ සැලසුම් | පුත්තලම |

## 6. සැකසුම් සංවර්ධන අංශයේ පරීක්ෂණ ඒකකය වෙත පරීක්ෂා කිරීම් සඳහා වූ ISO 17020 · 2012 ප්‍රතීතන/අනුකූලතා සහතිකය ලබා ගැනීමට කටයුතු කිරීමත් ඒ හරහා පරීක්ෂණ කටයුතු ගෝලීය වශයෙන් පිළිගත් ක්‍රමවේදය අනුව සිදු කිරීම

දිසිඳි පොල් නිෂ්පාදනය සඳහා නියැදි ලබාගැනීම සහ පරීක්ෂා කිරීම් වෙනුවෙන්, පරීක්ෂණ ආයතන සඳහා එකී අනුකූලතාව පිළිබඳ තක්සේරුව ලබාගැනීම සඳහා වූ අන්තර්ජාතික ප්‍රමිති සහතික පද්ධතිය වනුයේ ISO 17020 · 2012 තත්ත්ව සහතික පද්ධතියයි. ඉහත ප්‍රමිති නොයෙකුත් පරීක්ෂණ ආයතනයන්හි ක්‍රියාපටිපාටීන් විධිමත් ලෙස පවත්වාගෙන යාම සඳහා උපකාරී වන්නා වූ අවශ්‍යතාවන් ඉදිරිපත්කොට ඇත. යම් ආයතනයක් ඔවුන් විසින් කරගෙන යනු ලබන පරීක්ෂණ කටයුතුවල අනුකූලතාවය වඩාත් අපක්ෂපාතී ලෙස සහ අඛණ්ඩව පවත්වාගෙන යාම පිණිස මෙය ඉවහල් වේ. මෙමගින් ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ විශ්වසනීයත්වයක් ගොඩනැගේ.

ඒ අනුව, සැකසුම් සංවර්ධන අංශය මගින් අනුකූලතා සහතිකය දිසිඳි පොල් නියැදි ලබාගැනීම සහ පරීක්ෂා කිරීම් සඳහා ලබාගැනීමට අදාල කටයුතු ආරම්භ කරන ලදී. ඒ අනුව, එම අනුකූලතා සහතිකය (ISO 17020 · 2012) 2020 මාර්තු මස 01

දින සැකසුම් සංවර්ධන අංශය විසින් ලබාගෙන ඇත. මෙමගින්, අවසන් නිෂ්පාදනයේ දී සිදුවන අපගමනයන් සහ ගැටලුකාරී තත්ත්වයන් මගහරවා ගැනීමට මහෝපකාරී වේ. මෙම අනුකූලතා සහතිකය ලබාගෙන වර්ෂ 03ක් ගතවී ඇති බැවින්, 2022 දෙසැම්බර් මස 21 සහ 22 දෙදින අලූත් කිරීම සඳහා විගණනය පවත්වා, අනුකූලතා සහතිකය තවදුරටත් ඉදිරියට ලබා ගන්නා ලදී.

මෙයට අමතරව 2023 වසර තුළදී, දිසිදි පොල් නිෂ්පාදන වලට අමතරව, නැවුම් පොල්තෙල්, පොල්වතුර, පොල්කිරි සහ කොහුබත් උපස්ථර සඳහා අනුකූලතා සහතිකය ලබාගැනීමට අදාල කටයුතු සිදු කෙරුණි. මෙය අනුකූලතා සහතිකය ලබා ගැනීමේ වැඩසටහනෙහි විෂය පථය පුළුල් කිරීමක් වන අතර, ඒ සඳහා ඉහත දැක්වූ පුහුණුවීම් සඳහා සහභාගී වූ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් අදාළ නිෂ්පාදන වලට අනුකූලව අත්පොත්, ලේඛන සහ වාර්තා සකස් කරමින් පවතී.

සැකසුම් සංවර්ධන අංශයේ මෙම ප්‍රමිති සහතිකය ලබාගැනීමේ කටයුතු සඳහා ක්‍රියාකරන පරීක්ෂණ ඒකකයට අදාල නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ පරීක්ෂකවරුන් සහ පරීක්ෂකවරුන් අනුකූලතා තක්සේරු පිලිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ (Sri Lanka Accreditation Board - SLAB), ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ Sri Lanka Standard Institute&, UNIDO ආයතනයේ පුහුණුවීම් සඳහා සහභාගි කරවා ඇති අතර ඉදිරියටද මීට අදාළ පුහුණුවීම් ලබාදීමට නියමිතව ඇත.

## 7. ප්‍රමිතියෙන් යුක්ත පොල්තෙල් නිෂ්පාදනය සඳහා කර්මාන්තකරුවන් යොමු කරවීම, සහාය වීම හා ගුණාත්මක පොල්තෙල් පරිභෝජනය සම්බන්ධව පාරිභෝගිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ග්‍රාමීයව සිදුකරන පොල්තෙල් නිෂ්පාදනය සඳහා බහුලවම යොදාගනු ලබන ක්‍රමවේදය වනුයේ කොප්පරා මගින් තෙල් සිඳීමේ ක්‍රමයයි. එහිදී ප්‍රමිතියෙන් තොර පුස් බැඳුන නරක්වූ කොප්පරා භාවිත කිරීම නිසා නිපදවනු ලබන පොල්තෙල් ද ආහාරයට නුසුදුසු ප්‍රමිතියෙන් තොරවීම ගැටලුවකි. තවද නිසි තාක්ෂණික ක්‍රමවේදයන් යොදා නොගෙන සිදුකරන පොල්තෙල් නිෂ්පාදනය නිසා වෙනත් කර්මාන්තයක් සඳහා යොදාගත හැකි පොල් ප්‍රමාණයක් අපතේ යාම ද මෙහිදී සිදුවේ.

එමෙන්ම වෙළෙඳපොළෙහි පරිභෝජනය සඳහා අලෙවි කරන පොල්තෙල්වල ඇෆ්ලටොක්සීන් විෂ රසායනික අඩංගු බව සනාථ වීමත්, මෙවැනි විෂ සහිත ප්‍රමිතියෙන් තොර ආහාර පරිභෝජනය නිසා නොයෙකුත් බෝ නොවන රෝග බහුල වීමට හේතු වන බව සනාථ වීමත් නිසා පොල්තෙල්වල ප්‍රමිතිය පිළිබඳව ජනතාව තුල වැඩි උනන්දුවක් ඇතිවී ඇත.

මේ හේතුවෙන් වෙළෙඳපොළෙහි අලෙවි කරනු ලබන ප්‍රමිතියෙන් යුක්ත පොල්තෙල් හඳුනාගැනීමත්, පොල්තෙල් කර්මාන්තායතන උසස් තත්ත්වයේ නිෂ්පාදන සිදුකිරීමට, උනන්දු කරවීම සඳහාත් ඉලක්ක කර, 2019 වර්ෂයේදී පොල්තෙල් සඳහා තරු 05 ලාංඡනය ලබාදීමට කටයුතු කරන ලදී. ඒ අනුව මේ වන විට පොල්තෙල් කර්මාන්ත 17 ක් සඳහා තරු ලකුණු සහතිකය ලබා තිබුණද එය වෙළඳපොල අවශ්‍යතාවය සපුරාලීමට ප්‍රමාණවත් නොවේ. මෙහිදී හඳුනාගත් ප්‍රධාන කරුණ වූයේ තරු ලකුණ ලබාගැනීම සඳහා සුදුසු ආයතන ඉතා සීමිත බව හා බොහොමයක් කර්මාන්තායතනය අපේක්ෂිත ප්‍රමිතියෙන් තොර වන බවය. මෙම ගැටලුව හේතුවෙන් ප්‍රමිතියෙන් යුක්ත පොල්තෙල් නිපදවීම පිලිබඳව කර්මාන්තකරුවන් දැනුවත් කිරීම වැදගත් බව හඳුනා ගන්නා ලදී.

ග්‍රාමීය පොල්තෙල් කර්මාන්තායතන නව තාක්ෂණික ක්‍රමවේදයන්ට අනුව වැඩිදියුණු කර ප්‍රමිතියෙන් යුත් පොල්තෙල් නිපදවීමට කර්මාන්තකරුවන් යොමු කිරීම සඳහා 2023 වර්ෂයේදී දිස්ත්‍රික් මට්ටමින් ගුණාත්මක පොල්තෙල් නිෂ්පාදනය පිළිබඳ කර්මාන්තකරුවන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදී. එහිදී කුරුණෑගල, මහනුවර, මාතලේ, අනුරාධපුර, පොලොන්නරුව, මාතර, රත්නපුර සහ කෑගල්ල යන දිස්ත්‍රික්ක 8 ආවරණය වන පරිදි වැඩසටහන් 7ක් පවත්වන ලද අතර ඒ සඳහා කර්මාන්තකරුවන් 451 දෙනෙකු සහභාගී විය.

එහිදී පොල් සංවර්ධන අධිකාරිය නිර්දේශ කරන පරිදි ප්‍රමිතිගත පොල්තෙල් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ග්‍රාමීය පොල්තෙල් නිෂ්පාදනයේ දුර්වලතා හඳුනාගෙන ඒවා නව තාක්ෂණ ක්‍රම මගින් වැඩිදියුණු කිරීමත්, පරිසර හිතකාමී බලශක්ති භාවිතයත් සහ ඉදිරියේදී යාවත්කාලීන වෙතැයි අපේක්ෂිත ආහාර අණ පනත් වලට ගැලපෙන පරිදි ඇසුරුම් කල පිරිසුදු පොල්තෙල් සඳහා ජනතාව උනන්දු කරවීමත් එහිදී අවධාරණය කෙරිණි.මෙම පුහුණු වැඩසටහන්වලදී දැනුවත් කිරීමට අමතරව ඉදිරි පසුවිපරම් කටයුතු සඳහා දත්ත ලබාගැනීමත් සහ කර්මාන්තකරුවන් පොල් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කරවීමත් අපේක්ෂා කරන ලදී. ඒ හරහා දිවයින පුරා ඇති පොල්තෙල් කර්මාන්තායතන පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කිරීමත්, ඒ මගින් නිවැරදි නිෂ්පාදන තොරතුරු ලබාගැනීමත් සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීමටත් අපේක්ෂා කරයි.

*රූපය 4,5 : පුහුණු වැඩසටහන් සඳහා පොල්තෙල් කර්මාන්තකරුවන්ගේ සහභාගි වීම*



**පොල්තෙල් ආදර්ශ විශ්ලේෂණය**

(i) **පොල් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කරන පොල්තෙල් කර්මාන්තායතන වල ආදර්ශ විශ්ලේෂණ ක්‍රියාවලිය**

සැකසුම් සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන පොල්තෙල් නිෂ්පාදනය කරනු ලබන කර්මාන්තායතන ලියාපදිංචි කිරීමේ වැඩසටහනේ අංගයක් ලෙස 2023 වර්ෂයේ අධිකාරියේ ලියාපදිංචි වන ආයතනවල නිෂ්පාදනය කරනු ලබන පොල්තෙල්වල ගුණාත්මකභාවය මැන බැලීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ SLS 32 : 2017 ට අනුරූපව පොල්තෙල්වල ඇෆ්ලටොක්සීන් අගය පරීක්ෂා කිරීම සඳහා කර්මාන්තායතන 153 ක් උපයෝගී කරමින් විශ්ලේෂණ වාර්තා ලබා ගන්නා ලදී.

ඒ ඒ ආයතනවල පරීක්ෂා කරනු ලැබූ ශ්‍රී ලංකා පිරිවිතරයන්ගෙන් අපගමනය වන අවස්ථාවන් අධ්‍යනය කර නිවැරදි කර ගැනීම සඳහා කර්මාන්තකරුවන් යොමු කරන ලද අතර, විශ්ලේෂිත තොරතුරු පදනම් කර ගනිමින් අදාළ වැඩසටහනේ ඉදිරි කටයුතු 2024 දී සිදු කරගෙන යනු ලැබේ.

(ii) **වෙළෙඳපොළෙහි අලෙවි කරනු ලබන පොල්තෙල් පරීක්ෂා කිරීම**

වෙළෙඳපොළෙහි පරිභෝජනය සඳහා අලෙවි කරනු ලබන පොල්තෙල්වල ප්‍රමිතිය සොයා බැලීම සඳහා 2023 වර්ෂයේ ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පොල්තෙල් නියැදි 101 ක් පරීක්ෂා කරන ලදී .

ඒ අනුව 2023 වර්ෂයේදී වෙළෙඳපොළේ අලෙවි කරන පොල්තෙල් වල අහඹු ලෙස ලබාගත් නියැදි වල පරීක්ෂණ වාර්තා අනුව තත්ත්වය පහත පරිදි වේ.

වගුව 7 : පොල්තෙල් විශ්ලේෂණ තොරතුරුවල සාරාංශය

| | | |
|---|---|---|
| පරීක්ෂා කල නියැදි ගණන | 101 | - |
| ප්‍රමිතියට අනුකූල නියැදි ගණන | 62 | 61% |
| ප්‍රමිතියට අනුකූල නොවන නියැදි ගණන | 39 | 39% |
| ඇෆ්ලටොක්සීන් අගය අනුමත ප්‍රමිති පරාසය ඉක්මවා ඇති නියැදි ගණන | 25 | 25% |
| ඇෆ්ලටොක්සීන් අඩංගු සම්පූර්ණ නියැදි ගණන | 62 | 61% |
| ඇෆ්ලටොක්සීන් අඩංගු නොමැති නියැදි ගණන | 39 | 39% |
| පොල්තෙල් සමග මිශ්‍ර කර ඇති නියැදි ගණන | 20 | 20% |

ඉහත නියැදි පරීක්ෂණ ප්‍රතිඵල අනුව වෙළෙඳපොළෙහි අලෙවි කරනු ලබන පොල්තෙල් වලින් 25% ක අනුමත ප්‍රමිති පරාසය ඉක්මවා ඇෆ්ලටොක්සීන් අඩංගු බවත්, 61% ක කුමන හෝ ප්‍රමාණයකින් ඇෆ්ලටොක්සීන් අඩංගු බවත් නිරීක්ෂණය වේ. මෙහිදී නාගරික ප්‍රදේශවලින් බැහැර ග්‍රාමීය ප්‍රදේශවල අලෙවි කරන පොල්තෙල්වල වැඩි වශයෙන් ඇෆ්ලටොක්සීන් අඩංගු වීම සැලකිය යුතු කරුණකි. මෙම විශ්ලේෂණ තොරතුරු හා 2024 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහනේ ප්‍රතිඵල මත පදනම්ව, පොල්තෙල් නිෂ්පාදනය සම්බන්ධ ප්‍රතිපත්තිමය තීරණ ගෙන ඒ අනුව ක්‍රියාත්මක වීමට අධිකාරිය අපේක්ෂා කරනු ලැබේ.

(iii) **තරු ලාංඡනය ලබාදීම සඳහා ආදර්ශ විශ්ලේෂණය**

වෙළෙඳපොළෙහි අලෙවි කරනු ලබන ප්‍රමිතියෙන් යුක්ත පොල්තෙල් හඳුනාගැනීමත්, පොල්තෙල් කර්මාන්තායතන උසස් තත්ත්වයේ නිෂ්පාදන සිදුකිරීම උනන්දු කරවීම සඳහාත් ඉලක්ක කර 2019 වර්ෂයේදී පොල්තෙල් සඳහා තරු 05 ලාංඡනය ලබාදීමට කටයුතු කරන ලදී.

*රූපය 6 : ප්‍රමිතිගත පොල්තෙල් සඳහා ලබාදෙනු ලබන ලාංඡනය*



මෙහිදී පරීක්ෂා කරනු ලබන නියැදි වල ප්‍රමිති පරාමිතීන්ට අමතරව නිෂ්පාදන ක්‍රියාවලියද පරීක්ෂා කර පහත පරිදි තරු 05 ලකුණ ලබාදීම සිදු කරයි.

1. පොල්තෙල් මුඩුවී නොමැති බව
2. වෙනත් තෙල් වර්ග සමග මිශ්‍ර නොකරන බව
3. අහිතකර ලෙස ඇෆ්ලටොක්සීන් අඩංගු නොමැති බව
4. කිසිඳු රසායනික ද්‍රව්‍යයක් නිෂ්පාදනය සඳහා යොදා නොගන්නා බව
5. කර්මාන්තශාලාව සහ නිෂ්පාදන ක්‍රියාවලිය පොල් සංවර්ධන අධිකාරියේ නීතිරීති වලට අනුකූල බව (මෙහිදී පොල් මද වියලීම සඳහා වියලුම් යන්ත්‍ර භාවිත කිරීම වැදගත් වේ.)

යන කරුණු මත සුදුසු කර්මාන්ත හඳුනාගැනීම සිදු කරයි. ඒ අනුව මේ වනවිට ආයතන 17ක් තරු ලකුණු සහතිකය ලබා ඇති අතර, ලාංඡනය ලබාගත් ආයතන වල නිෂ්පාදනය කර ඇසුරුම් කරනු ලබන පොල්තෙල් සඳහා ලේබලයේ තරු ලාංඡනය භාවිතයට අවසර ලබාදී ඇත.

ඒ අනුව ප්‍රමිතියෙන් යුතු පොල්තෙල් නිෂ්පාදනයට නිෂ්පාදකයින් යොමු කරවීම හා ඒ මගින් පොල්තෙල් කර්මාන්තය නගාසිටුවීම අරමුණු කරගනිමින් ක්‍රියාත්මක කරන ලද, අවසන් පාරිභෝගිකයා අරමුණු කරගනිමින් වෙළඳපොලට නිකුත් කරනු ලබන පොල්තෙල්වල නිෂ්පාදන ක්‍රියාවලිය ද සැළකිල්ලට ගනිමින් සමස්ථ ප්‍රමිතිය පිළිබඳව තරු 5 කින් යුතු ප්‍රමිති සහතිකරණයකින් යුතු ලාංඡනයක් නිකුත් කිරීමේ ව්‍යාපෘතිය අඛණ්ඩ ලෙස 2023 වසරේ ද ක්‍රියාත්මක කරන ලදී.

2023 වසරේ තරු ලකුණ සඳහා නියැදි 18 ක් පරීක්ෂා කරන ලදී. එමෙන්ම නියැදි පරීක්ෂාවන්ට අනුව ආයතන 4ක් තරු ලකුණ සඳහා අයදුම්පත් සම්පූර්ණ කර ලබා දී ඇත. එයින් එක් ආයතනයක් 2023 වසර අවසානය වනවිට තරු ලකුණ ලබාගැනීමේ නියමිත සුදුසුකම් සපුරා තිබිණි.

## 8. HS කේත (HS Code) නොමැති අපනයන නිෂ්පාදන සඳහා නිෂ්පාදන පිරිවිතර (Product Specification) සකස් කිරීම

HS කේතයන් නොමැති පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීමේදී වෙනත් පී කේතයන් යොදා ගනිමින් අපනයනය සිදු කිරීම, අපනයන ප්‍රමාණයන් හා ලැබෙන ආදායම නිෂ්පාදන වශයෙන් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීමෙන් රජයට ලැබෙන මුලු අපනයන ආදායම ගණනය කිරීමට නොහැකි වීම, රජයට ලැබෙන සෙස් නොලැබී යාම, සෑම පොල් ආශ්‍රිත අපනයනයක් සඳහාම ASYCUDA පද්ධතිය හරහා පොල් සංවර්ධන අධිකාරිය විසින් අනුමැතියක් ලබා දීම, ස්ථිර HS කේතයන් නොමැති නිෂ්පාදන අපනයනය කිරීමේදී පොල් සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබාදීමට නොහැකි වීම යන කරුණු මත පහත නිෂ්පාදන සඳහා HS කේත සකස් කිරීම සඳහා අවශ්‍ය වන මූලික ලේඛනය පොල් සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලදී.

1. මේදය අඩු කරන ලද පොල් - Low Fat DC
2. පොල් සීනි - Coconut Sugar
3. මධ්‍ය දාම පොල්තෙල් - Medium Chain Triglyceride coconut oil$ powder
4. පොල් තලප - Creamed Coconut (defined as Coconut paste in SLS Standard)
5. පොල් සිරප් - Coconut syrup
6. පොල් වතුර (අගය එකතු කරන ලද) - Coconut Water (Value added)
7. ගාන ලද පොල් - Grated coconut
8. Coconut Smiles

මෙහිදී මූලික නිෂ්පාදන පිරිවිතර සකස් කිරීම පොල් සංවර්ධන අධිකාරිය මෙන්ම ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, කාර්මික තාක්ෂණ ආයතනය පොල් පර්යේෂණ ආයතනය සහ කර්මාන්ත නියෝජනය කරමින් කමිටුවක් සහභාගීත්වයෙන් සිදු කෙරුණි.

උක්ත නිෂ්පාදන පදනම් කරගෙන හා අපනයන අවශ්‍යතාවය මත මේ වනවිට නිෂ්පාදන 12ක් සඳහා අවශ්‍ය වන මූලික ලේඛන සකස් කර ඇත.

## 9. පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන් සඳහා මහජන බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා එක්ව සහන පොළී ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම හා පොළී ප්‍රතිදාන ලබා දීම තුලින් කර්මාන්ත සංවර්ධනය කිරීම

මහජන බැංකුව හා ඒකාබද්ධව, "කප්රුක නිපැයුම් දිරිය" ණය යෝජනා ක්‍රමය 2012. 05.16 දින එම බැංකුව සමග අත්සන් කල අවබෝධතා ගිවිසුමකින් ද ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා ඒකාබද්ධව, "කප්රුක ජය ඉසුර" ණය යෝජනා ක්‍රමය 2015.02.25 දින එම බැංකුව සමග අත්සන් කළ අවබෝධතා ගිවිසුමකින් ද ලියාපදිංචියට කුඩා හා මධ්‍යම පරිමාණයේ කර්මාන්තකරුවන් ආකර්ෂණය කර ගැනීමට හා ඒ හරහා පොල් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කරා ලගා කරවීම අරමුණු කර ගනිමින් අඩු පොලී සහන ණය යෝජනා ක්‍රමයන් 2 ක් ආරම්භ කර පවත්වා ගෙනයනු ලැබේ.

මහජන බැංකුවේ "කප්රුක නිපැයුම් දිරිය" ණය යෝජනා ක්‍රමය මගින් බැංකුවේ වාණිජ පොලිය යටතේ එම ණය මුදල වාරික 60 කින් කර්මාන්තකරුවාට ගෙවීමට සලස්වා ඇත. ඔහු එකී වාරික නියමිත පරිදි බැංකුව වෙත ගෙවීමෙන් හා අදාල කාර්ය නියමිත පරිදි සිදුකල බවට සහතික කර ගැනීමෙන් අනතුරුව වර්ෂය අවසානයේ 6% ක පොළියක් කර්මාන්තකරුට හිමි වන ලෙස ඉතිරි පොළී මුදල අධිකාරිය විසින් බැංකුව හරහා කර්මාන්තකරු වෙත ප්‍රතිපූර්ණය කරනු ලැබේ. ප්‍රදේශීය සංවර්ධන බැංකුවේ "කප්රුක ජය ඉසුර" ණය යෝජනා ක්‍රමය මගින් ඍජුව කර්මාන්තකරුට 6%ක වාර්ෂික පොලියක් යටතේ ණය මුදල ලබා දෙයි. මෙම ණය යෝජනා ක්‍රම දෙකම ප්‍රති මූල්‍ය ණය යෝජනා ක්‍රම දෙකක් වේ.

මහජන බැංකුවේ "කප්රුක නිපැයුම් දිරිය" ණය යෝජනා ක්‍රමය යටතේ බැංකුව වෙත කර්මාන්තකරු වෙත ගෙවීමට ප්‍රතිපූර්ණය කරනු ලබන පොළී මුදල අධිකාරියට තත්කාලීන වියදමක් වෙයි. එනමුත් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ "කප්රුක ජය ඉසුර" ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ගන්නා කර්මාන්තකරුවන් විසින් ඍජුව 6% ක වාර්ෂික පොලියක් යටතේ ණය වාරික බැංකුවට ගෙවන බැවින් එකී පොලිය අධිකාරියට තත්කාලීන වියදමක් නොවේ. එනමුත් මෙම ණය යෝජනා ක්‍රම දෙකෙන්ම කර්මාන්තකරු බැංකුවට ගෙවන 6% ක පොලියෙන් අඩක් එනම් 3% ක පොළී ප්‍රමාණයක් අධිකාරිය විසින් බැංකුවට ගෙවනු ලැබේ.

එමෙන්ම පොල් සංවර්ධන අධිකාරිය හා ප්‍රදේශීය සංවර්ධන බැංකුව 2020.06.04 දිනැතිව අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමට අනුව එතෙක් ලබා දුන් රු. මිලියන 2.0 ක ණය මුදල රු. මිලියන 3.5ක් දක්වා වැඩි කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව රු. මිලියන 2.0 ක් දක්වා ණය මුදල් ලබාගෙන තිබු කර්මාන්තකරුවන් හට රු. මිලියන 3.5 ක් දක්වා වූ ඉතිරි ණය මුදල් ලබා දීමට 2020 වර්ෂය තුලදී කටයුතු කර ඇත. මේවන විට මහජන බැංකුව හා ඒකාබද්ධව, "කප්රුක නිපැයුම් දිරිය" ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක නොවන අතර, මෙතෙක් ණය මුදල් ලබාගත් කර්මාන්තකරුවන්ගේ පොළී ප්‍රතිදානය පමණක් සිදුවේ.

මෙම ණය යෝජනා ක්‍රම දෙක යටතේ ණය ලබා ගත් කර්මාන්තකරුවන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

වගුව 8 : ණය යෝජනා ක්‍රමයේ සමස්ථ ප්‍රගතිය

| වර්ෂය | මහජන බැංකුව | | ප්‍රදේශීය සංවර්ධන බැංකුව | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | ගණන | ණය මුදල රු. මිලියන | ගණන | ණය මුදල රු. මිලියන | ගණන | ණය මුදල රු. මිලියන |
| 2012 | 17 | 11.99 | - | - | 17 | 11.99 |
| 2013 | 67 | 47.35 | - | - | 67 | 47.35 |
| 2014 | 40 | 19.67 | - | - | 40 | 19.67 |
| 2015 | 31 | 17.54 | 06 | 7.42 | 37 | 24.96 |
| 2016 | 06 | 1.72 | 06 | 5.67 | 12 | 7.39 |
| 2017 | 02 | 1.50 | 05 | 8.40 | 07 | 9.90 |
| 2018 | 08 | 7.66 | 53 | 65.30 | 61 | 72.96 |
| 2019 | 07 | 5.65 | 59 | 70.86 | 66 | 76.51 |
| 2020 | 01 | 1.5 | 11 | 11.80 | 12 | 13.30 |
| 2021 | 00 | 00 | 31 | 36.15 | 31 | 36.15 |
| 2022 | 00 | 00 | 24 | 41.89 | 24 | 41.89 |
| 2023 | 00 | 00 | 67 | 65.15 | 67 | 65.15 |
| එකතුව | **179** | **114.58** | **262** | **312.64** | **441** | **427.22** |

වගුව 9: කර්මාන්ත වර්ගය අනුව වෙන් කල මුදල ප්‍රමාණ

| කර්මාන්ත වර්ගය | මද ආශ්‍රිත කර්මාන්ත | | කර්මාන්ත වර්ගය | මද නොවන කර්මාන්ත | |
|---|---|---|---|---|---|
| | කර්මාන්ත වර්ගය | ඒ සඳහා වෙන් කල මුදල | | කර්මාන්ත වර්ගය | ඒ සඳහා වෙන් කල මුදල |
| පොල්තෙල් | 39 | 58.2 | කොහු | 23 | 34.32 |
| | | | අඟුරු | 05 | 7.4 |
| **එකතුව** | **02** | **58.2** | **එකතුව** | **28** | **41.72** |

වගුව 10 : 2022 හා 2023 වසර වලට අදාළ පොලී ප්‍රතිදාන ගෙවීම්

| වර්ෂය | බැංකු නිර්දේශය | | | | | | අධිකාරියේ නිර්දේශය ලද | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පොලී සහන ගණන | | ණය මුදල (රු.මි) | | පොලී සහන මුදල (රු.මි) | | ගෙවූ පොලී සහන ගණන | | ගෙවූ පොලී සහන මුදල (රු.මි) | |
| | **2022** | **2023** | **2022** | **2023** | **2022** | **2023** | **2022** | **2023** | **2022** | **2023** |
| 1 වන කාර්තුව | 16 | 13 | 14.14 | 12.21 | 0.134 | 0.077 | 07 | 06 | 0.081 | 0.041 |
| 2 වන කාර්තුව | 13 | 12 | 12.15 | 11.21 | 0.134 | 0.089 | 08 | 08 | 0.092 | 0.069 |
| 3 වන කාර්තුව | 14 | 10 | 17.05 | 10.36 | 0.122 | 0.046 | 10 | 04 | 0.114 | 0.025 |
| 4 වන කාර්තුව | 15 | - | 13.71 | - | 0.107 | - | 10 | - | 0.085 | - |
| එකතුව | **58** | **35** | **57.05** | **33.78** | **0.497** | **0.212** | **35** | **18** | **0.372** | **0.135** |

වගුව 11 : 2022 හා 2023 වසර වලට මහජන බැංකුවට, අධිකාරිය විසින් ගෙවන ලද අදාළ පොලී ප්‍රතිදාන සාරාංශ

| වර්ෂය | **2022** | **2023** |
|---|---|---|
| බැංකුවේ නිර්දේශිත පොලී මුදල | 0.497 | 0.212 |
| අධිකාරිය මගින් ගෙවීම් | 0.372 | 0.135 |
| බැංකුවේ නිර්දේශයෙන් ගෙවීම්හි ප්‍රතිශතය | 74.84% | 63.67% |

වගුව 12 : මහජන බැංකුවේ කප්රුක නිපැයුම් දිරිය ණය මුදල් පියවීමේ විස්තර

| වර්ෂය | ණය ලාභීන් | | මුදල් පියවීම | | ගෙවීමට ඉතිරිව ඇති ණය මුදල් රු. මිලියන | |
|---|---|---|---|---|---|---|
| | අයදුම්කරුවන් ගණන | ණය මුදල රු. මිලියන | අයදුම්කරුවන් ගණන ණය | ණය මුදල රු. මිලියන | අයදුම්කරුවන් ගණන ණය | ණය මුදල රු. මිලියන |
| 2012 | 17 | 11.99 | 16 | 9.99 | 01 | 2.00 |
| 2013 | 67 | 47.35 | 67 | 47.35 | - | - |
| 2014 | 40 | 19.67 | 38 | 18.74 | 02 | 0.93 |
| 2015 | 31 | 17.54 | 14 | 5.19 | 17 | 12.35 |
| 2016 | 06 | 5.50 | 03 | 2.75 | 03 | 2.75 |
| 2017 | 02 | 1.50 | 01 | 0.50 | 01 | 1.00 |
| 2018 | 08 | 7.66 | - | - | 08 | 7.66 |
| 2019 | 07 | 5.05 | - | - | 07 | 5.05 |
| 2020 | 01 | 1.00 | - | - | 01 | 1.00 |
| 2021 | - | - | - | - | - | - |
| 2022 | - | - | - | - | - | - |
| එකතුව | 179 | 117.26 | 139 | 84.52 | 40 | 32.74 |

වගුව 13 : 2023 වසරේ කප්රුක ජය ඉසුර ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය

| | |
|---|---|
| 2023.12.31 දිනට අධිකාරිය වෙත ලද අයදුම්පත් ගණන | 67 |
| 2023 වසරේ ණය ලබා දී ඇති අයදුම්පත් ගණන | 35 |
| ඊට අදාළ ණය මුදල | 65,158,000.00 |

මෙම ණය යෝජනා ක්‍රම දෙක පිළිබඳව හා අධිකාරිය මගින් කර්මාන්ත ක්ෂේත්‍රයට ඉටුවෙන සේවාවන් පිළිබඳවත් පොල්කටු හා පොල් ලෙලි ව්‍යාපාරයන් ගෘහස්ථ මට්ටමින් ආරම්භ කරගනිමින් කර්මාන්ත ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ඨ විය හැකි ආකාරය පිළිබඳවත් වැඩමුළු පවත්වන ලදී .

එසේම ණය යෝජනා ක්‍රම වල ප්‍රගතිය මෙන්ම, ක්‍රියාත්මක කිරීමේදී බැංකු ආශ්‍රිතව පැන නගින ගැටළු ද සාකච්ඡා කරමින් ණය යෝජනා ක්‍රම මගින් කර්මාන්තකරුවන් මෙතෙක් අත් කරගෙන ඇති ප්‍රගතිය පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලදී.

මීට අමතරව මෙම ණය යෝජනා ක්‍රමයන් ක්‍රියාත්මක කිරීම සඳහා මූලික සුදුසුකමක් ලෙස අධිකාරියේ ලියාපදිංචිය ද බලපාන බැවින් ණය ලබා ගැනීමේ අරමුණ ඇතිව නව ලියාපදිංචිකරුවන් ලෙස ලියාපදිංචියේ වර්ධනයක් ද ඇති වී ඇත. එනම් ණය යෝජනා ක්‍රමය මෙන්ම අනෙකුත් සහනාධාර යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම තුළින්, කර්මාන්තකරුවන් අධිකාරියේ ලියාපදිංචිය සඳහා යොමු කිරීමද චක්‍රාකාරව සිදුවේ.

මෙම වසරේදී ණය මුදල් ලබා ගැනීමට වැඩිපුර යොමු වූ ක්ෂේත්‍රයක් වූයේ පොල්තෙල් කර්මාන්තයයි. එහිදි, නව යන්ත්‍රසූත්‍ර මිලදී ගැනීම, නව පොල්තෙල් කර්මාන්ත ආරම්භය සිදුවිය. ක්ෂේත්‍ර නිලධාරීන්ගේ පසු විපරම් වාර්තා පරීක්ෂාවේදී ද එකී කර්මාන්ත විශාල ප්‍රගතියක් ලබා ගෙන ඇති බවත්, උසස් නිෂ්පාදන සඳහා යොමු වී ඇති බවත් පැහැදිලි විය. තවද කොහු කර්මාන්තය සඳහා ද බැංකු ණය ලබා ගැනීමේ වැඩි නැඹුරුතාවයක් මෙම වර්ෂයේදී දක්නට ලැබුණි.

## 10. අවිධිමත් කර්මාන්ත සඳහා අගය වැඩි කල නිෂ්පාදන හඳුන්වාදීම සඳහා පුහුණු වැඩසටහන්, තාක්ෂණික හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, උපකරණ ලබා දීම, නිෂ්පාදන ගැණුම්කරුවන් සම්බන්ධ කිරීම හා පසු විපරම් කිරීම

පොල් ආශ්‍රිත නිෂ්පාදන විධිමත්ව සහ අවිධිමත්ව සිදු කරනු ලබන අතර, නිෂ්පාදන තුළින් ලබන අපනයන ආදායමින් 10% ක පමණ ප්‍රමාණයක් අවිධිමත්ව සිදු කරනු ලබන නිෂ්පාදන වලින් ලබා ගනී.

අවිධිමත්ව පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්ත සිදු කිරීම මගින්, ගුණාත්මකභවෙන් අඩු නිෂ්පාදන සිදු කිරීම මෙන්ම අමුද්‍රව්‍ය නාස්ති වීමක් සිදු වේ. එම තත්ත්වය අවම කිරීමේ අරමුණින් සහ ග්‍රාමීය ආර්ථිකය නංවාලීමේ අරමුණ ඇතිව ඒ ඒ ප්‍රදේශවල පොල් ආශ්‍රිත නිෂ්පාදන ආරම්භ කිරීමේ ඇති විභවතාවය සලකා බලා ඒ අනුව, ඒ ඒ ප්‍රදේශවල ගෘහස්ථව සිදු කළ හැකි තවාෂි බුරුසු, ඉදල් හා මුසුන්, කොහු ලණු නිෂ්පාදනය මෙන්ම පොල් කටු අඟුරු නිෂ්පාදනය කිරීම සඳහා වැඩසටහන් පවත්වන ලදී. ග්‍රාමීය ප්‍රදේශ වල ජීවත්වන අඩු ආදායම්ලාභීන් තෝරා ඔවුන් අතරින් පොල් ආශ්‍රිත නිෂ්පාදන සිදු කිරීමට කැමැත්තක් දක්වන පුද්ගලයින් සඳහා එම නිෂ්පාදන පිළිබඳව තාක්ෂණික දැනුම ලබා දී කණ්ඩායම් ගත කර ගැනුම්කරුවෙකු සම්බන්ධ කර එම ව්‍යාපෘති සිදු කරන ලදී.

උතුරු පළාත සඳහා නව පොල් ත්‍රිකෝණයක් යන සංකල්පය අනුව, පොල් වගාවට සාපේක්ෂව කර්මාන්ත ආරම්භ කිරීම හා ව්‍යාප්ත කිරීම අධිකාරියේ අරමුණයි. උතුරු පළාත තුළ පොල් වගාවේ ව්‍යාප්තිය, පොල් අස්වැන්න සහ කර්මාන්ත ව්‍යාප්තිය පහත පරිදි දැක්විය හැකිය.

වගුව 14 : උතුරු පළාතේ පොල් වගාවට සාපේක්ෂව කර්මාන්ත ව්‍යාප්තිය

| දිස්ත්‍රික්කය | | ජනගහනය පවුල් ඒකක | පොල් වගාව අක්කර | පොල් අස්වැන්න ගෙඩි මි. (2021) | පො.ස.අ. ලියාපදිංචි කර්මාන්ත ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 01 | යාපනය | 184,416 | 16279 | 32.51 | 02 |
| 02 | කිලිනොච්චිය | 118,906 | 4,318 | 38.44 | 07 |
| 03 | වව්නියාව | 171,511 | 9,319 | 9.92 | 02 |
| 04 | මුලතිව් | 91,947 | 10,819 | 24.92 | 01 |
| 05 | මන්නාරම | 99,051 | 7,027 | 7.88 | 0 |

ඒ අනුව, එම ප්‍රදේශයේ දැනට කර්මාන්තයට නොගෙන නාස්තිවන පොල් කටුවලින්, පරිසර හිතකාමී පොල්කටු දහන උඳුනක් හරහා පොල් කටු අඟුරු සෑදීම සඳහා ව්‍යාපෘතියක් හෙකාබ් පුද්ගලික සමාගම හා විශ්වමඩු සිවිල් ආරක්ෂක බලකාය (කිලිනොච්චිය) සමග එක්ව සිදු කරන ලදී. එමඟින් එම ප්‍රදේශයේ පවත්නා පොල්කටු, කර්මාන්තය සඳහා යොමු කරවීමත්, පොල්කටු අලෙවි කිරීම තුළින් එම ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික මට්ටම ඉහළ දැමීමත් අපේක්ෂා කෙරේ.

*රූපය 7, 8 : ඉදිකරන ලද පරිසර හිතකාමී දහන උදුන*





තවද උතුරු පළාත කේන්ද්‍ර කරගනිමින් තාක්ෂණික හුවමාරු වැඩසටහන් සිදු කරන ලදී. එහිදී ප්‍රදේශයේ පවත්නා කොහු කෙඳි උපයෝගී කරගනිමින් අත් ලණු නිෂ්පාදනය සහ එම ලණු වලට අගය එකතු කිරීමක් සිදු කර විසිතුරු පාපිසි නිෂ්පාදනය කිරීම ආරම්භ කරන ලදී.

රූපය 9, 10 : විසිතුරු පාපිසි නිෂ්පාදනය කිරීමේ පුහුණු වැඩසටහන





තවද, ආනයනය කරන ලද කොස්ස සඳහා ආදේශකයක් ලෙස භාවිතා කල හැකි ඇගිලි කොස්ස ජනතාව අතර නැවතත් ප්‍රචලිත කිරීමේ අරමුණින් උතුරු පළාත කේන්ද්‍ර කරගනිමින් වැඩසටහනක් ආරම්භ කරන ලදී . ඒ අනුව ඒ සඳහා ද තාක්ෂණික හුවමාරු වැඩසටහන් පවත්වන ලදී.

රූපය 11, 12 : ඇගිලි කොස්ස නිෂ්පාදනය කිරීමේ පුහුණු වැඩසටහන





ඌව පළාත තුල මොණරාගල දිස්ත්‍රික්කය කේන්ද්‍ර ගනිමින්, තවාෂි බුරුසු නිෂ්පාදනය කිරීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ ලද අතර ඒ සඳහා බුරුසු දග දමන උපකරණ කට්ටල 10 ක් ලබා දෙන ලදී. මෙම සම්පූර්ණ වැඩසටහනෙන් ප්‍රතිලාභ ලැබූ ප්‍රතිලාභීන් ගණන 452 කි.

# 02. තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය

රසායනාගාර පරීක්ෂණ සිදුකිරීම මගින් පොල් නිෂ්පාදන අපනයන තොග වල තත්ත්වය සහතික කිරීම, විවිධ ඉල්ලුම්කරුවන්ගේ අවශ්‍යතා පරිදි රසායනාගාර පරීක්ෂණ සිදුකරදීම, ජාත්‍යන්තරව පිළිගත් උසස් රසායනාගාර පරීක්ෂණ සේවාවක් සැපයීම සඳහා ISO:17025 ප්‍රතීතන තත්ත්වයට අදාළ කාර්යයන් පවත්වාගෙන යාම, විෂයානුබද්ධ පුහුණු වැඩසටහන් සඳහා රසායනාගාර කාර්ය මණ්ඩලය යොමු කිරීම, මාසික සැලැස්මක් යටතේ ජංගම රසායනාගාර සේවාව පවත්වාගැනීම තුළින් දිසිදි පොල් නිෂ්පාදනායතනයන්හි නිෂ්පාදන ක්‍රියාවලිය පරීක්ෂා කිරීම, ආදර්ශ පරීක්ෂා කිරීම සහ ප්‍රමිති අවශ්‍යතා පිළිබඳව උපදෙස් දීම, කර්මාන්තයේ අවශ්‍යතාව පරිදි විෂ ගතවූ ස්ථාන හදුනාගැනීමේ පරීක්ෂණ (swab) සිදුකිරීම සහ අධිකාරියේ සැකසුම් සංවර්ධන අංශය විසින් සිදුකරන පොල් නිෂ්පාදනාගාර නියාමනය කිරීමේ කාර්යය යටතේ රැස්කරනු ලබන විවිධ පොල් නිෂ්පාදන ආදර්ශ සඳහා රසායනාගාර පරීක්ෂණ සිදුකරදීම තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ ප්‍රධාන කාර්යභාරයයි. මෙම කාර්යභාරය ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂිකව සකස් කල ක්‍රියාකාරී සැලැස්මක් අනුව කටයුතු කරනු ලැබේ.

තත්ත්ව පාලන අංශයේ දී පරීක්ෂා කරනු ලබන සියලුම ආදර්ශ සැකසුම් සංවර්ධන අංශය විසින් රසායනාගාරය වෙත යොමුකරන අතර, ජංගම රසායනාගාරයෙන් රැගෙන එන ආදර්ශ ද සැකසුම් සංවර්ධන අංශය ට යොමුකරනු ලැබේ. පරීක්ෂණ සිදුකිරීමෙන් පසු සියලුම පරීක්ෂණ වාර්ථා සැකසුම් සංවර්ධන අංශය වෙත යොමුකරනු ලබන අතර එම අංශය විසින් අදාළ පාර්ශ්වයන් වෙත එකී වාර්ථා බෙදා හරිනු ලැබේ. නියාමන ආදර්ශයන්හි ප්‍රතිඵල අනුව හඳුනා ගන්නා ලද ප්‍රමිති අඩුපාඩු පිළිබඳව සැකසුම් සංවර්ධන අංශය දැනුවත් වන අතර පොල් නිෂ්පාදන කර්මාන්තයේ අඩුපාඩු මගහරවාගනිමින් නිෂ්පාදන කාර්යයන් විධිමත්ව සිදු කිරීමට අවශ්‍ය උපදෙස්, සැකසුම් සංවර්ධන අංශය විසින් එවැනි පාර්ශවකරුවන් වෙත ලබාදීම සිදුකරයි.

තත්ත්ව පාලන අංශය විසින් ඉහත කී පරීක්ෂණ කටයුතු වලට අමතරව අවශ්‍යතාව පරිදි සෙසු කාර්යයන් සඳහා ද සහභාගි වන අතර පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්හි වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්, වැඩමුළු සහ ප්‍රදර්ශන සඳහා සහභාගී වීම, ප්‍රති අපනයන තොග පරීක්ෂා කිරීම සඳහා කර්මාන්තශාලා අවශ්‍යතාව පරිදි නිරීක්ෂණය, වර්තමානයේ පවතින ශ්‍රී ලංකා ප්‍රමිතීන් යාවත්කාලීන කිරීම සහ දැනට ප්‍රමිතීන් නොමැති පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ප්‍රමිති සැකසීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමග සම්බන්ධ වී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ අධිකාරියේ ප්‍රමිති සැකසීමේ කාර්යයන් සඳහා සහභාගිවීම, පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ පවතින රසායනාගාරයන්හි සේවයේ නියුතු කාර්යය මණ්ඩලය උදෙසා පුහුණු වැඩසටහන් පැවැත්වීම, ඉල්ලීම් පරිදි අධ්‍යයන වැඩසටහන් පැවැත්වීම, විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා කාර්මික පුහුණු අවස්ථා සැපයීම සහ තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා දායකත්වය ලබාදීම සහ ඉල්ලීම් පරිදි දින 60-90 දිසිදි ආදර්ශ පරීක්ෂා කිරීම යනාදීය තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය විසින් සිදුකර ඇත.

ඉහත කී සියලුම කාර්යයන් තුළින් 2023 වසරේදී තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය විසින් ලබා ඇති ප්‍රගතිය විස්තරාත්මකව පහත ඉදිරිපත් කර ඇත.

**Q1: අපනයනය සහ දේශිය පරිභෝජනය සඳහා යොමු වන පොල් නිෂ්පාදනයන්හි තත්ත්වය සහතික කිරීම**

මෙරට පවතින සියළුම දිසිදි පොල් නිෂ්පාදනාගාර පොල් සංවර්ධන අධිකාරියෙහි ලියාපදිංචි වී ඇති අතර ඒවාහි දෛනිකව සිදුකරන දිසිදි නිෂ්පාදනයන්ගෙන් රැස්කර තත්ත්ව පාලන අංශයට සපයනු ලබන ආදර්ශ සඳහා සැල්මොනෙල්ලා පරීක්ෂාව සහ භෞතික පරීක්ෂණ 8ක් බැගින් රසායනාගාරයේදී පරීක්ෂා කෙරේ. දිසිදි පොල් අපනයනයේදී රේගුවෙන් නිදහස් කිරීම සඳහා මෙම පරීක්ෂණ වාර්තා අනිවාර්යය වන බැවින් ඉහල ප්‍රමුඛත්වයක් ලබාදී මෙම දෛනික දිසිදි ආදර්ශ පරීක්ෂා කිරීම සිදුකරනු ලැබේ.

අපනයනය නොවී මෙරට ඉතිරිවී ඇති දින 60 සහ දින 90 ඉක්මවූ දිසිදි නිෂ්පාදන ආදර්ශ ද 2023 වසරේදී මේ කාණ්ඩය යටතේ පරීක්ෂණ සඳහා යොමුවී ඇත. මෙවැනි ආදර්ශ 06ක අනු ආදර්ශ 2241 සහ පරීක්ෂණ 17928 ක් සිදුකර ප්‍රතිඵල වාර්ථා කර ඇත.

පූර්ව අපනයන ක්ෂුද්‍රජීවී විශ්ලේෂණය සිදුකිරීම සඳහා මද නොවන නිෂ්පාදන අතුරින් ප්‍රමුඛත්වය ගනු ලබන්නේ කොහුබත් ආශ්‍රිත නිෂ්පාදනයි.

**A: දිසිදි පොල් නිෂ්පාදනයන්හි පූර්ව අපනයන ක්ෂුද්‍ර ජීවී විශ්ලේෂණ සිදුකිරීම සහ සහතික කිරීම**

**වගුව 15 : දිසිදි පොල් නිෂ්පාදනයන්හි පූර්ව අපනයන ක්ෂුද්‍ර ජීවී විශ්ලේෂණ සිදුකිරීම**

| වර්ෂය | ඉලක්ක (ආදර්ශ) | ප්‍රගතිය (ආදර්ශ) | ආදර්ශ පරීක්ෂා කිරීමේ ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස | සැල්මොනෙල්ලා විෂ ගතවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 2022 | 7500 | 8530 | 114% | 0.45 (ආදර්ශ 38) |
| 2023 | 5000 | 7386 | 148% | 0.83 (ආදර්ශ 61) |

*ප්‍රස්ථාරය 01 : දිසිදි නිෂ්පාදනය හා ආදර්ශ ලැබීම*




| | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| ආදශර් ප්‍රමාණය | 9 | 2 | 41 | 38 | 61 |
| විෂගතවීම් ප්‍රතිශතය % | 0.09 | 0.03 | 0.53 | 0.45 | 0.83 |

*ප්‍රස්ථාරය 02 : දිසිදි පොල් දෛනික ආදර්ශයන් හි සැල්මොනෙල්ලා විෂ ගතවීම්*




| | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| ආදශර් ප්‍රමාණය | 10000 | 5935 | 7687 | 8530 | 7386 |
| නිෂ්පාදනය MT | 44081 | 25256 | 33289 | 43791 | 37988 |

## කොහුබත් ආශ්‍රිත නිෂ්පාදන

වගුව 16 : කොහු බත් ආශ්‍රිත නිෂ්පාදන

| වර්ෂය | ඉලක්කය (ආදර්ශ) | ප්‍රගතිය (ආදර්ශ) | පරීක්ෂණ ගණන ආදර්ශ | පරීක්ෂා කිරීමේ ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස | විෂගතවීමේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|
| | | | | | සැල්මොනෙල්ලා | ඊ - කෝලයි |
| 2022 | 1500 | 1645 | 1989 | 110% | 7.34 (ආදර්ශ 24) | - |
| 2023 | 1500 | 1546 | 1957 | 103% | 1.29 (ආදර්ශ 04) | 0.13 (ආදර්ශ 02) |

ප්‍රස්ථාරය 03 : කොහුබත් ආශ්‍රිත නිෂ්පාදනයන්හි ක්ෂුද්‍රජීවී පරීක්ෂාව




**B.** දිසිදි පොල් නිෂ්පාදනයන්හි පූර්ව අපනයන භෞත රසායනික පරීක්ෂා සිදු කිරීම සහ සහතික කිරීම.

දිසිදි පොල් හි වර්ණය, වර්ග කිරීම, තෙතමනය, රස, සුවඳ, අපද්‍රව්‍ය, කුරුටු, තෙල් බේරීම යන භෞතික හා සංවේදී පරීක්ෂා ලෙස පරීක්ෂණ සිදුකර ඇත.

ප්‍රස්ථාරය 04 : දෛනික දිසිදි පොල් නිෂ්පාදනයන්හි භෞත රසායනික පරීක්ෂාව



වගුව 17 : දිසිදි පොල් නිෂ්පාදනයන්හි පූර්ව අපනයන භෞත රසායනික පරීක්ෂා සිදුකිරීම

| වර්ෂය | ඉලක්කය (ආදර්ශ) | ප්‍රගතිය (ආදර්ශ) | පරීක්ෂණ ගණන | ආදර්ශ පරීක්ෂා කිරීමේ ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස | තත්ත්ව දෝෂ වාර්තා වීම |
|---|---|---|---|---|---|
| 2022 | 7500 | 8533 | 68424 | 114% | 5.3 (ආදර්ශ 457) |
| 2023 | 5000 | 7507 | 60056 | 150% | 6.15 (ආදර්ශ 462) |

**තත්ත්ව දෝෂ වාර්තා වීම පරාමිතිය අනුව දැක්වීම**

වගුව 18 : තත්ත්ව දෝෂ වාර්තා වීම පරාමිතිය අනුව දැක්වීම

| පරාමිතිය | එකඟ නොවූ ආදර්ශ | |
|---|---|---|
| | ගණන | % |
| වර්ණය | 76 | 16 |
| තෙල් බේරීම | 04 | 01 |
| දැවුනු කැබලි | 51 | 11 |
| තෙතමනය | 19 | 04 |
| බාහිර අපද්‍රව්‍ය | 09 | 02 |
| කුරුටු | 108 | 23 |
| වර්ග කිරීම | 307 | 66 |
| ගඳ හා සුවඳ | 52 | 11 |

(ඇතැම් ආදර්ශ පරාමිතීන් කිහිපයකින් ප්‍රමිතිය හා එකග නොවී ඇත)

**Q2. පොල් ආශ්‍රිත නිෂ්පාදන පරීක්ෂා කිරීමේ සේවා පවත්වා ගැනීම**

රසායනාගාර පරීක්ෂණ සේවා අවශ්‍ය වන ඉල්ලුම්කරුවන් විසින් අධිකාරිය වෙත ආදර්ශ භාරදී සැකසුම් සංවර්ධන අංශය හරහා පරීක්ෂණ ඉල්ලුම්කරනු ලැබේ. අවශ්‍ය පරාමිතීන්ට අනුව ක්ෂුද්‍රජීවී, රසායනික, භෞතික සහ සංවේදි පරීක්ෂා මේ යටතේ සිදු කෙරේ.

මීට අමතරව, පොල් නිෂ්පාදන අපනයන ප්‍රතික්ෂේප වීම මත විදේශයන්ගෙන් මෙරටට නැවත හරවා එවා ඇති පොල් නිෂ්පාදන නැව්ගත තොග සහ දේශීය හා විදේශීය පැමිණිලි මත ඉල්ලුම්කරනු ලබන ආදර්ශ පරීක්ෂා කිරීම ඉල්ලීම් පරිදි සිදුකෙරේ. පොල් ආශ්‍රිත නිෂ්පාදනකරුවන්, පාරිභෝගික ජනතාව, සුළු, මධ්‍යම හා මහා පරිමාණ වෙළඳ ප්‍රජාව සහ අපනයනකරුවන් ආදී වූ ඕනෑම කාණ්ඩයක් සඳහා පොල් ආශ්‍රිත නිෂ්පාදන පරීක්ෂා කිරීමේ සේවාව ලබාදේ.

වගුව 19 : පොල් ආශ්‍රිත නිෂ්පාදන පරීක්ෂා කිරීම

| වර්ෂය | ඉලක්කය (ආදර්ශ) | ප්‍රගතිය (ආදර්ශ) | පරීක්ෂණ ගණන | ආදර්ශ පරීක්ෂා කිරීමේ ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 2022 | 600 | 587 | 1185 | 98% |
| 2023 | 700 | 1094 | 1917 | 156% |

මේ යටතේ පරීක්ෂා කල සියළුම ආදර්ශ වර්ග පහත දැක්වේ.

*ප්‍රස්ථාරය 05 : පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් පරීක්ෂා කිරීමේ සේවාවන් පවත්වා ගැනීම*




පොල් ආශ්‍රිත නිෂ්පාදන පරීක්ෂා කිරීමේ සේවාව, ආදර්ශ අනුව විස්තර කිරීම

වගුව 20 : පොල් ආශ්‍රිත නිෂ්පාදන පරීක්ෂා කිරීමේ සේවාව, ආදර්ශ අනුව විස්තර කිරීම

| නිෂ්පාදන වර්ගය (ආදර්ශ ප්‍රමාණය) | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| දිසිදි පොල් | 18 | 08 | 11 | 06 | 42 |
| පුන්නක්කු | 01 | 03 | 14 | 11 | 05 |
| පොල් තෙල් | 213 | 335 | 411 | 301 | 269 |
| කොප්පරා | 01 | - | - | 01 | 01 |
| මද වශයෙන් මේදය ඉවත් කරන ලද දිසිදි පොල් | 66 | 51 | 22 | 25 | 61 |
| පොල් ක්‍රීම්/ කිරම | 05 | 03 | 03 | 03 | 02 |
| පිටි කල පොල් | - | 02 | - | - | 02 |
| පොල් කිරි | 02 | 03 | - | 03 | 26 |
| පොල් නොවන ආදර්ශ | 15 | 04 | 01 | 01 | - |
| දිසිදි පොල් ආදර්ශයන්හි ඇෆ්ලටොක්සින් හා සල්ෆර් ඩයොක්සයිඩ් | 667 | 453 | 300 | 232 | 238 |
| තැඹිලි වතුර | - | 05 | 06 | 01 | 06 |
| පොල් වතුර | - | - | 04 | 01 | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| ගෙඩි පොල් | - | - | 01 | - | - |
| ආනයනික පොල් මද | - | - | 03 | - | - |
| පොල් කටු අඟුරු | - | - | 02 | 02 | 07 |
| පොල් සීනි | - | - | - | - | 06 |
| විනාකිරි | - | - | - | - | 02 |
| දෛනික දිසිදි පොල්හි - සල්ෆර් ඩයොක්සයිඩ් පරීක්ෂාව | - | - | - | - | 135 |
| ප්‍රති අපනයනය සඳහා යොමුවන නිෂ්පාදන ආදර්ශ - (TIEP) -පොල්තෙල් | - | - | - | - | 249 |
| නැවත හරවා එවා ඇති නැව්ගත තොග - පොල්තෙල් | - | - | - | - | 02 |
| නැවත හරවා එවා ඇති නැව්ගත තොග - පොල් කිරි | - | - | - | - | 37 |
| නැවත හරවා එවා ඇති නැව්ගත තොග - පිටිකල පොල්කිරි | - | - | - | - | 01 |
| නැවත හරවා එවා ඇති නැව ගත තොග - පොල් ක්‍රීම් | - | - | - | - | 02 |
| නැවත හරවා එවා ඇති නැව්ගත තොග - කොහු බත් | - | - | - | - | 01 |
| පරීක්ෂා කර ඇති සම්පූර්ණ ආදර්ශ ගණන | 988 | 867 | 778 | 587 | 1094 |
| සිදුකර ඇති මුළු පරීක්ෂණ ගණන | 1666 | 1521 | 1571 | 1185 | 1917 |

**Q3. A) ISO/IEC 17025:2017 ප්‍රතීතන තත්ත්වයට අදාල කාර්යයන්**

පොල් සංවර්ධන අධිකාරියේ තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය මගින් නිකුත් කරනු ලබන පරීක්ෂණ සඳහා ජාත්‍යන්තර පිළිගැනීමක් ලැබෙන පරිදි හා පරීක්ෂණ කටයුතු නිවැරදිව, විධිමත්ව හා ක්‍රමානුකූලව සිදුකිරීම සඳහා, ISO/IEC 17025 : 2017 ප්‍රතීතන තත්ත්වයට අදාල කාර්යයන් අංශයෙහි පවත්වා ගෙන යනු ලැබේ.

ඒ අනුව වාර්ෂිකව උපකරණ ක්‍රමාංකනය කිරීම, වාර්ෂිකව උපකරණ සේවා කිරීම, ජාත්‍යන්තර හා දේශියව වෘත්තීය නිපුණතාවය පරීක්ෂා කිරීම වෘත්තිමය කුසලතා ඇගයීමේ පරීක්ෂණ සඳහා පෙනී සිටීම, (Inter laboratory, Intra laboratory Proficiency Test) අභ්‍යන්තර විගණන කටයුතු සිදුකිරීම, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් සිදුකරනු ලබන ඇගයීම් සඳහා පෙනී සිටීම යනාදී ප්‍රතීතන තත්ත්වය පවත්වා ගැනීමට අදාල වූ කාර්යයන් සිදුකර ඇත.

ප්‍රතීතන තත්ත්වය සඳහා රසායනාගාරයන්හි කටයුතු පවත්වා ගැනීමේ සතුටුදායක තත්ත්වය තක්සේරු කිරීමෙන් අනතුරුව 2026 ජුනි මස දක්වා ප්‍රතීතන තත්ත්වය රසායනාගාර සඳහා ප්‍රදානය කර ඇත.

2012 වසරේදී ආරම්භ කරනු ලැබූ ISO/IEC 17025 : 2017 ප්‍රතීතන තත්ත්වය ලබා ගැනිමේ වැඩසටහන ක්‍රම ක්‍රමයෙන් පුළුල් කර ඇති අතර 2023 වසර වනවිට පහත දක්වා ඇති පරීක්ෂණ සඳහා ප්‍රතීතන තත්ත්වය ලබා ගැනීමට කටයුතු කර ඇත.

මේවන විට සමස්ත වශයෙන් පොල් නිෂ්පාදන 13ක පරීක්ෂණ වර්ග 12ක් සඳහා ISO/IEC 17025 : 2017 ප්‍රතීතන තත්ත්වය හිමිකර ගෙන ඇත.

වගුව 21 : පොල් ආශ්‍රිත නිෂ්පාදන වල ප්‍රතීතන තත්ත්වය හිමිකර ගෙන ඇති පරීක්ෂණ වර්ග

| නිෂ්පාදනය | | ප්‍රතීතන තත්ත්වය හිමිකර ගෙන ඇති පරීක්ෂණ වර්ග |
|---|---|---|
| 1 | පොල් තෙල් | දිලීර හා පුස්, සම්පූර්ණ සනාවාස සංඛ්‍යාව, සැපොනීකරන අගය, අයඩීන් අගය, නිදහස් මේද අම්ල ප්‍රමාණය |
| 2 | දිසිදි පොල් | සැල්මොනෙල්ලා, කෝලිෆෝම් සංඛ්‍යාව, ඊ-කෝලයි සංඛ්‍යාව, දිලීර හා පුස්, සම්පූර්ණ සනාවාස සංඛ්‍යාව |
| 3 | මේදය තරමක් ඉවත් කල දිසිදි | සැල්මොනෙල්ලා, කෝලිෆෝම් සංඛ්‍යාව, ඊ-කෝලයි සංඛ්‍යාව, දිලීර හා පුස්, සම්පූර්ණ සනාවාස සංඛ්‍යාව |
| 4 | පොල් කිරි | සැල්මොනෙල්ලා, කෝලිෆෝම් සංඛ්‍යාව, ඊ-කෝලයි සංඛ්‍යාව, දිලීර හා පුස්, සම්පූර්ණ සනාවාස සංඛ්‍යාව |
| 5 | පිටිකල පොල් කිරි | සැල්මොනෙල්ලා, කෝලිෆෝම් සංඛ්‍යාව, ඊ-කෝලයි සංඛ්‍යාව, දිලීර හා පුස්, සම්පූර්ණ සනාවාස සංඛ්‍යාව |
| 6 | පොල් කිරි ආශ්‍රිත නිෂ්පාදන | සැල්මොනෙල්ලා, කෝලිෆෝම් සංඛ්‍යාව, ඊ-කෝලයි සංඛ්‍යාව, දිලීර හා පුස්, සම්පූර්ණ සනාවාස සංඛ්‍යාව |
| 7 | පොල් වතුර | සැල්මොනෙල්ලා, කෝලිෆෝම් සංඛ්‍යාව, ඊ-කෝලයි සංඛ්‍යාව, දිලීර හා පුස්, සම්පූර්ණ සනාවාස සංඛ්‍යාව |
| 8 | කොහු බත් උපස්ථර | සැල්මොනෙල්ලා, කෝලිෆෝම් සංඛ්‍යාව, ඊ-කෝලයි සංඛ්‍යාව, දිලීර හා පුස්, සම්පූර්ණ සනාවාස සංඛ්‍යාව |
| 9 | කොප්පරා | සැල්මොනෙල්ලා, කෝලිෆෝම් සංඛ්‍යාව, ඊ-කෝලයි සංඛ්‍යාව, දිලීර හා පුස්, සම්පූර්ණ සනාවාස සංඛ්‍යාව |
| 10 | ගෙඩි පොල් | සැල්මොනෙල්ලා, කෝලිෆෝම් සංඛ්‍යාව, ඊ-කෝලයි සංඛ්‍යාව, දිලීර හා පුස්, සම්පූර්ණ සනාවාස සංඛ්‍යාව |
| 11 | පානීය ජලය | කෝලිෆෝම් සංඛ්‍යාව, ඊ-කෝලයි සංඛ්‍යාව, ක්ලෝරයිඩ්, ජලයේ මුළු කඨිනත්වය, කැල්සියම්, මැග්නීසියම් |
| 12 | පොල් තලප | සැල්මොනෙල්ලා, කෝලිෆෝම් සංඛ්‍යාව, ඊ-කෝලයි සංඛ්‍යාව, දිලීර හා පුස් |
| 13 | පොල් ක්‍රීම් | සැල්මොනෙල්ලා, කෝලිෆෝම් සංඛ්‍යාව, ඊ-කෝලයි සංඛ්‍යාව, දිලීර හා පුස් |

රූපය 13 : *ISO/IEC 17025:2017* ප්‍රතීතන තත්ත්වය


Certificate of Accreditation
Sri Lanka Accreditation Board for Conformity Assessment
hereby declares that
Chemical and Microbiology Laboratories
Quality Control and Quality Assurance Division
Coconut Development Authority
having being found to comply with the accreditation criteria for testing laboratories as described in ISO / IEC 17025: 2017, has been accredited as a Testing Laboratory under the field of
Chemical and Biological Testing
and has been assigned the accreditation number
TL 30-01
This certificate is issued on 30 June 2023 and is valid until
29 June 2026
The accreditation was granted for the first time to Chemical Laboratory on 12 June 2012 and to Microbiology Laboratory on 28 October 2015
The scope and conditions of accreditation are specified in the Schedule of Accreditation bearing the accreditation number appearing in this certificate.
Director/CEO
Sri Lanka Accreditation Board for Conformity Assessment
Colombo, Sri Lanka

**B)** පුහුණු වැඩසටහන් පැවැත්වීම

තත්ත්ව පාලන අංශයේ ආරම්භ කර ඇති ISO/IEC ප්‍රතීතන තත්ත්වයේ කටයුතු සඳහා සහ කාලීනව සංශෝධනය කර ඇති පොල් නිෂ්පාදන පරීක්ෂා කිරීමේ ක්‍රමවේද සඳහා අවශ්‍ය වන පුහුණුව රසායනාගාර සේවක පිරිස වෙත ලබාදී ඇත. වාර්ෂික සැලැස්මට අනුව පහත පරිදි ප්‍රගතිය ලබා ඇත.

වගුව 22 : පවත්වන ලද පුහුණු වැඩසටහන්

| | පුහුණු වැඩසටහන | පුහුණුව පැවැත්වූ ආයතනය | සහභාගිවූ සාමාජිකයන් ගණන |
|---|---|---|---|
| 1 | රසායනාගාර ආරක්ෂාව, GLP සහ ගිනි ආරක්ෂණ දැනුවත්භාවය සහ පුහුණුව පිළිබඳ වැඩමුළුව | කාර්මික තාක්ෂණ ආයතනය (ITI) | 05 |
| 2 | ISO/IEC 17025 • 2017 ප්‍රතිතන තත්වයේ සම්මත අවශ්‍යතා පිළිබඳ සාමාන්‍ය අවබෝධය ලබා ගැනීම පිළිබඳ පුහුණු වැඩසටහන | UNIDO - (ගාස්තු අයකර නොමැත) | 13 |
| 3 | ISO/IEC 17025 • 2017 ප්‍රතිතනයේ මාර්ගෝපදේශ ලේඛන සැකසීම පිළිබඳ පුහුණුව | UNIDO (ගාස්තු අයකර නොමැත) | 04 |
| 4 | AOAC 990.28 ක්‍රමවේදය අනුව දිසිදි පොල්හි සල්ෆර් ඩයොක්සයිඩ් ප්‍රමාණය නිර්ණය කිරීම පිළිබඳව පුහුණු පාඨමාලාව | කාර්මික තාක්ෂණ ආයතනය (ITI) | 04 |
| 5 | පොල් වතුර පරීක්ෂණ සහ සීනි සඳහා සම්ප්‍රදායික සහ HPLC විශ්ලේෂණ ක්‍රමය භාවිතය පිළිබඳ පුහුණුව | කාර්මික තාක්ෂණ ආයතනය (ITI) | 05 |
| 6 | රසායනික රසායනාගාර විශ්ලේෂණ දත්තවලට අදාල සංඛ්‍යාත්මක විශ්ලේෂණ ක්‍රම පිළිබඳ පුහුණුව | ශ්‍රී ලංකා රසායනාගාර පරීක්ෂණ පිළිබඳ සංගමය (SLATL) | 01 |
| 7 | ISO/IEC 17025 • 2017 ප්‍රතීතනයට අනුකූලව රසායනික හා ක්ෂුද්‍ර ජීවී විශ්ලේෂණය සඳහා තත්ත්ව ආරක්ෂණය පිළිබඳ පුහුණුව | UNIDO (ගාස්තු අයකර නොමැත) | 10 |
| 8 | BRC/GS සම්බන්ධ ගෝලීය ආහාර ප්‍රමිතීන් පිළිබඳ පුහුණු වැඩසටහන | UNIDO (ගාස්තු අයකර නොමැත) | 01 |

**Q4: අපනයනය සහා නිෂ්පාදනය වන පොල් නිෂ්පාදන කර්මාන්තයන්හි තත්ත්ව සුරක්ෂිත කිරීම.**

දිසිදි පොල් නිෂ්පාදන ක්‍රියාවලියෙහි ප්‍රමිතියානුකූල තත්ත්වය පරීක්ෂණාත්මකව නිර්ණය කිරීම සඳහා මාසිකව සැලසුම්කල වැඩසටහනකට අනුව ජංගම රසායනාගාරය භාවිත කරමින් ආදර්ශ රැස් කිරීම, කර්මාන්තශාලා පරීක්ෂා කිරීම සහ ප්‍රමිතිය පවත්වා ගැනීමට අදාල උපදේශකත්වය සැපයීම මේ යටතේ සිදුකරනු ලැබේ. එම අවස්ථාවේදීම සිදුකරනු ලබන දිසිදි නිෂ්පාදනයෙන් ආදර්ශ රැස් කිරීම මාසිකව සිදුකරනු ලැබේ. මාස 6කට වරක් දිසිදි පොල් නිෂ්පාදනාගාරයක් ආවරණය වන පරිදි සැලැස්මක් අනුව පොල් සේදීමට ගන්නා ජලය පරීක්ෂා කිරීම සිදුකරයි.

වගුව 23 : අපනයනය සඳහා නිෂ්පාදනය වන පොල් නිෂ්පාදන කර්මාන්තයන්හි තත්ත්ව සුරක්ෂිත

| කාර්යය | 2022 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඉලක්ක (ආදර්ශ) | ප්‍රගතිය (ආදර්ශ) | පරීක්ෂණ ගණන | ආදර්ශ ප්‍රමිතියෙන් අපගමනය වීමේ ප්‍රතිශතය | ඉලක්ක | ප්‍රගතිය | පරීක්ෂණ ගණන | ආදර්ශ ප්‍රමිතියෙන් අපගමනය වීමේ ප්‍රතිශතය |
| 1.)දිසිදි ආදර්ශ පරීක්ෂා කිරීම | 350 | 331 (95%) | 965 | 87% | 250 | 326 (130%) | 1189 | 85% |

**ප්‍රමිතියෙන් අපගමනය වීම % පරාමිතීන් අනුව (ඇතැම් ආදර්ශ පරාමිතීන් කිහිපයකින් අසමත්වී ඇත)**

| පරාමිතිය | 2022 | 2023 |
|---|---|---|
| ඊකෝලි පැවතීම | 15% | 25% |
| කෝලිෆෝම් ප්‍රමිතිය ඉක්මවා යාම | 15% | 19% |
| සම්පූර්ණ සනාවාස සංඛ්‍යාව ප්‍රමිතිය ඉක්මවා යාම | 87% | 83% |
| සල්ෆර්ඩයොක්සයිඩ් ප්‍රමිතිය ඉක්මවායාම | - | 0.3% |

| කාර්යය | 2022 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 2)පොල් සේදීමට ගන්නා ජලය පරීක්ෂා කිරීම | 100 | 91 | 1051 | 40% | 100 | 93 | 930 | 41% |

**ප්‍රමිතියෙන් අපගමනය වීම % පරාමිතීන් අනුව ( ඇතැම් ආදර්ශ පරාමිතීන් කිහිපයකින් අසමත්වී ඇත.)**

| පරාමිතිය | 2022 | 2023 |
|---|---|---|
| **ක්ෂුද්‍රජීවී පරීක්ෂණ** | | |
| සැල්මොනෙල්ලා පැවතීම | අපගමනය වී නැත | 3% |
| ඊ-කෝලි පැවතීම | 10% | 11% |
| සම්පූර්ණ සනාවාස සංඛ්‍යාව ප්‍රමිතිය ඉක්මවා යාම | අපගමනය වී නැත | අපගමනය වී නැත |
| **රසායනික පරීක්ෂණ** | | |
| වර්ණය ප්‍රමිතිය ඉක්මවා යාම | අපගමනය වී නැත | අපගමනය වී නැත |
| නිදහස් ක්ලෝරීන් අවශේෂ ප්‍රමිතිය ඉක්මවා යාම | අපගමනය වී නැත | අපගමනය වී නැත |
| ක්ලෝරයිඩ් ප්‍රමිතිය ඉක්මවායාම | 3% | 3% |
| සම්පූර්ණ කඨිනත්වය ප්‍රමිතිය ඉක්මවායාම | 5% | 3% |
| pH නොගැලපීම | 27% | 22% |
| සම්පූර්ණ පෝස්පේට් ප්‍රමිතිය ඉක්මවායාම | 4% | 13% |
| සම්පූර්ණ යකඩ ප්‍රමිතිය ඉක්මවා යාම | අපගමනය වී නැත | අපගමනය වී නැත |
| ලෙඩ් ප්‍රමිතිය ඉක්මවා යාම | අපගමනය වී නැත | |
| කොපර් ප්‍රමිතිය ඉක්මවා යාම | අපගමනය වී නැත | |
| ක්‍රෝමියම් ප්‍රමිතිය ඉක්මවා යාම | අපගමනය වී නැත | |

ක්ෂේත්‍ර රාජකාරි වාර ගණන -

| ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|---|
| 400 | 408 | 400 | 493 |

විෂ ගතවීම සිදුවීමේදී කර්මාන්තශාලාවන්හි swab පරීක්ෂණ සිදු කිරීම

| | කාර්යය | පරීක්ෂා කිරීමේ ප්‍රගතිය (ආදර්ශ) | ප්‍රමිතියෙන් අපගමනය වීම (%) |
|---|---|---|---|
| 1 | M - 162 සිලෝන් කොකො ග්‍රීන්ස් | 14 | සැල්මොනෙල්ලා පැවතීම - 29 % |

**Q5. සැකසුම් සංවර්ධන අංශයේ නියාමන කාර්යයන්ට අදාලව පොල් නිෂ්පාදන විශ්ලේෂණය**

පොල් නිෂ්පාදන කර්මාන්තශාලා නියාමනය කිරීමේ ක්‍රියාකාරකම යටතේ සැකසුම් සංවර්ධන අංශය විසින් පොල් නිෂ්පාදන ඒකකයන්ගෙන් ආදර්ශ රැස්කර රසායනාගාර පරීක්ෂණ සිදු කිරීම සඳහා යොමුකරනු ලැබේ. මෙම ආදර්ශ පරීක්ෂා කර වාර්තා නිකුත් කරනු ලැබේ. එහිදී ප්‍රමිතියෙන් අපගමනය වන නිෂ්පාදන පිළිබඳව පරීක්ෂකවරුන් දැනුවත් වන අතර ඔවුන් විසින් කර්මාන්තකරුවන් දැනුවත් කරමින් පොල් නිෂ්පාදන ආයතනයන්හි අඩුපාඩු සකසා ගනිමින් උසස් තත්ත්වයේ නිෂ්පාදන බිහිකිරීමට අවශ්‍ය මග පෙන්වීම මෙවැනි ආදර්ශ පරීක්ෂා කිරීමෙන් අපේක්ෂා කෙරේ.

වගුව 24 : සැකසුම් සංවර්ධන අංශයේ නියාමන කාර්යයන්ට අදාලව පොල් නිෂ්පාදන විශ්ලේෂණය

| නිෂ්පාදනය | | 2022 ඉලක්ක (ආදර්ශ) | 2022 ප්‍රගතිය (ආදර්ශ) | 2022 පරීක්ෂණ ගණන | 2022 ආදර්ශ ප්‍රමිතියෙන් අපගමනය වීමේ ප්‍රතිශතය | 2023 ඉලක්ක (ආදර්ශ) | 2023 ප්‍රගතිය (ආදර්ශ) | 2023 පරීක්ෂණ ගණන | 2023 ආදර්ශ ප්‍රමිතියෙන් අපගමනය වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | i. පොල්තෙල් නිෂ්පාදනාගාරයන්ගෙන් රැස්කල ආදර්ශ | 60 | 82 (137%) | 246 | 18% | 200 | 19 (60%) | 57 | 26% |

**ප්‍රමිතියෙන් අපගමනය වීම**

| පරාමිතිය | 2022 | 2023 |
|---|---|---|
| අයඩින් අගය ප්‍රමිතිය ඉක්මවීම | 16% | 26% |
| නිදහස් මේද අම්ල ප්‍රමිතිය ඉක්මවීම | 2% | - |
| ඇෆ්ලටොක්සින් ප්‍රමිතිය ඉක්මවීම | 1% | - |

| නිෂ්පාදනය | | 2022 | 2023 ඉලක්ක (ආදර්ශ) | 2023 ප්‍රගතිය (ආදර්ශ) | 2023 පරීක්ෂණ ගණන | 2023 ආදර්ශ ප්‍රමිතියෙන් අපගමනය වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | ii. වෙළඳපල පොල්තෙල් | ආදර්ශ ලැබී නැත | - | 101 | 303 | 39% |

**ප්‍රමිතියෙන් අපගමනය වීම**

| පරාමිතිය | 2023 |
|---|---|
| මේද අම්ල සංයුතිය | 20% |
| ඇෆ්ලටොක්සින් ප්‍රමිතිය ඉක්මවීම | 25% |
| pH ප්‍රමිතිය ඉක්මවීම | නැත |

| | නිෂ්පාදනය | 2022 ඉලක්ක (ආදර්ශ) | 2022 ප්‍රගතිය (ආදර්ශ) | 2022 පරීක්ෂණ ගණන | 2022 ආදර්ශ ප්‍රමිතියෙන් අපගමනය වීමේ ප්‍රතිශතය | 2023 ඉලක්ක (ආදර්ශ) | 2023 ප්‍රගතිය (ආදර්ශ) | 2023 පරීක්ෂණ ගණන | 2023 ආදර්ශ ප්‍රමිතියෙන් අපගමනය වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2 | නැවුම් පොල්තෙල් | 25 | 30 (120%) | 150 | 100% | 50 | 74 (148%) | 370 | 74% |

**ප්‍රමිතියෙන් අපගමනය වීම**

| පරාමිතිය | 2022 | 2023 |
|---|---|---|
| අයඩින් අගය ප්‍රමිතිය ඉක්මවීම | 7% | 9% |
| තෙතමනය ප්‍රමිතිය ඉක්මවීම | 20% | 22% |
| දිලිර හා පුස් ප්‍රමිතිය ඉක්මවීම | 100% | 59% |
| නිදහස් මේද අම්ල ප්‍රමාණය මත | 10% | 3% |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 3 | කොහු බත් ආශ්‍රිත නිෂ්පාදන | 100 | 136 (136%) | 816 | 83% | 120 | 59 (49%) | 354 | 75% |

**<u>ප්‍රමිතියෙන් අපගමනය වීම</u>**

| පරාමිතිය | 2022 | 2023 |
|---|---|---|
| ඊ-කෝලි පැවතීම | 5% | 3% |
| සැල්මොනෙල්ලා පැවතීම | 6% | 5% |
| pH ප්‍රමිතිය ඉක්මවීම | 7% | 22% |
| සන්නායකතාව ප්‍රමිතිය ඉක්මවායාම | 37% | 17% |
| බාහිර අපද්‍රව්‍ය ප්‍රමිතිය ඉක්මවා යාම | 65% | 59% |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 4 | පොල් කෙඳි | 50 | 35 (70%) | 70 | 20% | 100 | 1 (1%) | - | - |

**<u>ප්‍රමිතියෙන් අපගමනය වීම</u>**

| පරාමිතිය | 2022 | 2023 |
|---|---|---|
| තෙතමනය ප්‍රමිතිය ඉක්මවීම | 20% | අපගමනය වී නැත. |
| අපද්‍රව්‍ය පැවතීම ප්‍රමිතිය ඉක්මවා යාම | 14% | |

| | නිෂ්පාදනය | 2022 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක (ආදර්ශ) | ප්‍රගතිය (ආදර්ශ) | පරීක්ෂණ ගණන | ආදර්ශ ප්‍රමිතියෙන් අපගමනය වීමේ ප්‍රතිශතය | ඉලක්ක (ආදර්ශ) | ප්‍රගතිය (ආදර්ශ) | පරීක්ෂණ ගණන | ආදර්ශ ප්‍රමිතියෙන් අපගමනය වීමේ ප්‍රතිශතය |
| 5 | පොල් කිරි | 80 | 80 (131%) | 240 | 44% | 80 | 74 (125%) | 222 | 14% |
| | පිටිකල පොල් කිරි | - | 25 | 100 | 40% | - | 26 | 104 | 54% |
| 6 | පොල්කටු අඟුරු | 10 | 14 (140%) | 42 | 79% | 20 | 1 (5%) | 3 | 100% |

**පොල් කිරි – ප්‍රමිතියෙන් අපගමනය වීම**

| පරාමිතිය | 2022 | 2023 |
|---|---|---|
| pH ප්‍රමිතිය ඉක්මවීම | 15% | 11% |
| තෙල් ප්‍රමාණය ප්‍රමිතිය ඉක්මවා යාම | 5% | 3% |

**පිටිකල පොල් කිරි – ප්‍රමිතියෙන් අපගමනය වීම**

| පරාමිතිය | 2022 | 2023 |
|---|---|---|
| pH ප්‍රමිතිය ඉක්මවීම | 16% | 15% |
| තෙල් ප්‍රමාණය ප්‍රමිතිය හා නොගැළපීම | 36% | 54% |

**පොල්කටු අඟුරු – ප්‍රමිතියෙන් අපගමනය වීම**

| පරාමිතිය | 2022 | 2023 |
|---|---|---|
| තෙතමනය ප්‍රමිතිය ඉක්මවීම | 43% | අපගමනය වී නැත |
| අළු ප්‍රමාණය ප්‍රමිතිය ඉක්මවා යාම | 7% | අපගමනය වී නැත |
| අපද්‍රව්‍ය පැවතීම ප්‍රමිතිය ඉක්මවා යාම | 50% | 100% |

| | නිෂ්පාදනය | 2022 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක (ආදර්ශ) | ප්‍රගතිය (ආදර්ශ) | පරීක්ෂණ ගණන | ආදර්ශ ප්‍රමිතියෙන් අපගමනය වීමේ ප්‍රතිශතය | ඉලක්ක (ආදර්ශ) | ප්‍රගතිය (ආදර්ශ) | පරීක්ෂණ ගණන | ආදර්ශ ප්‍රමිතියෙන් අපගමනය වීමේ ප්‍රතිශතය |
| 7 | මද වශයෙන් මේදය ඉවත් කල දිසිදි පොල් | 50 | 45 (90%) | 225 | 73% | 120 | 97 (81%) | 485 | 81% |

**ප්‍රමිතියෙන් අපගමනය වීම**

| පරාමිතිය | 2022 | 2023 |
|---|---|---|
| තෙතමනය ප්‍රමිතිය ඉක්මවීම | 36% | 9% |
| තෙල් ප්‍රමාණය ප්‍රමිතිය හා නොගැලපීම | 7% | 20% |
| සම්පූර්ණ ඝනාවාස සංඛ්‍යාව ප්‍රමිතිය ඉක්මවායාම | 67% | 79% |

| | නිෂ්පාදනය | ඉලක්ක (ආදර්ශ) 2022 | ප්‍රගතිය (ආදර්ශ) 2022 | පරීක්ෂණ ගණන 2022 | අපගමනය % 2022 | ඉලක්ක (ආදර්ශ) 2023 | ප්‍රගතිය (ආදර්ශ) 2023 | පරීක්ෂණ ගණන 2023 | අපගමනය % 2023 |
|---|---|---|---|---|---|---|---|---|---|
| 8 | පොල්තෙල් (ලියාපදිංචියේදී ඇෆ්ලටොක්සීන් පරීක්ෂා) | 110 | 124 (113%) | 124 | 4% | 120 | 153 (128%) | 153 | 7% |

**ප්‍රමිතියෙන් අපගමනය වීම**

| පරාමිතිය | 2022 | 2023 |
|---|---|---|
| ඇෆ්ලටොක්සීන් ප්‍රමිතිය ඉක්මවා යාම | 4% | 7% |

| | නිෂ්පාදනය | ඉලක්ක (ආදර්ශ) 2022 | ප්‍රගතිය (ආදර්ශ) 2022 | පරීක්ෂණ ගණන 2022 | අපගමනය % 2022 | 2023 |
|---|---|---|---|---|---|---|
| 9 | කොප්පරා | 10 | 4 (40%) | 12 | 75% | ආදර්ශ ලැබී නැත |

**ප්‍රමිතියෙන් අපගමනය වීම**

| පරාමිතිය | 2022 |
|---|---|
| නිදහස් මේද අම්ල ප්‍රමිතිය ඉක්මවා යාම | 25% |
| දිලීර හා පූස් ප්‍රමිතිය ඉක්මවා යාම | 75% |

| | නිෂ්පාදනය | ඉලක්ක (ආදර්ශ) 2022 | ප්‍රගතිය (ආදර්ශ) 2022 | පරීක්ෂණ ගණන 2022 | අපගමනය % 2022 | 2023 |
|---|---|---|---|---|---|---|
| 10 | පුන්නක්කු | | 2 | 4 | 100% | ආදර්ශ ලැබී නැත |

**ප්‍රමිතියෙන් අපගමනය වීම**

| පරාමිතිය | 2022 |
|---|---|
| නිදහස් මේද අම්ල ප්‍රමිතිය ඉක්මවා යාම | 50% |
| තෙල් ප්‍රමාණය ප්‍රමිතිය ඉක්මවා යාම | 50% |

## වෙනත් ක්‍රියාකාරකම්

1) දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සහභාගී වීම

වගුව 25 : සහභාගී වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්

| | සිදුකල කාර්යය | වැඩසටහන් ප්‍රමාණය |
|---|---|---|
| 1 | තාක්ෂණික හුවමාරු වැඩසටහන (Manufacturing of coir related substrate (Grow bags, Coir Pith briquettes & Coconut husk chips ) - කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මෙහෙයවීම | 01 |
| 2 | තාක්ෂණික හුවමාරු වැඩසටහන (Desiccated Coconut & Coconut Flour& ) කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මෙහෙයවීම | 01 |
| 3 | තාක්ෂණික හුවමාරු වැඩසටහන (Coconut shell charcoal& ) කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මෙහෙයවීම | 01 |
| 4 | තාක්ෂණික හුවමාරු වැඩසටහන (Virgin Coconut Oil Manufacturing) - කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මෙහෙයවීම | 01 |
| 5 | ගම්පහ දිස්ත්‍රික්කයේ කර්මාන්ත සංවර්ධනය උදෙසා One Stop Shop - Industry Clinic : Gampaha District නමින් සේවාවක් - කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මෙහෙයවීම | 01 |
| 6 | පොල්තෙල් කර්මාන්තය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - පොල් සංවර්ධන අධිකාරිය මගින් මෙහෙයවීම (අනුරාධපුරය, මහනුවර, උඩවලව, මාතලේ, මාතර, පොලොන්නරුව) | 06 |

2) වැඩමුළු සඳහා සහභාගී වීම

වගුව 26 : සහභාගී වන ලද වැඩමුළු

| | වැඩමුළුව |
|---|---|
| 1 | ගාමිණි කොරේ පදනම විසින් Sri Lanka Innovators' Forum · Paper on Agriculture වැඩමුළුව |
| 2 | SAARC Foods Annual Symposium - Gallface Hotel වැඩමුළුව |
| 3 | ගාල්ලේ පැවති Manusavi Diriya Foreign Ministry Programme වැඩමුළුව |
| 4 | Chinese Delegation from UHAN University සාමාජිකයන් සඳහා පැවැත්වූ වැඩමුළුව |
| 5 | Saudi Arabian Delegation from Agriculture Ministry Saudi Arabia සාමාජිකයන් සඳහා පැවැත්වූ වැඩමුළුව |
| 6 | UNIDO ආයතනයෙන් සංවිධානය කරන ලද BESPA Food Programme වැඩමුළුව |
| 7 | UNIDO ආයතනයෙන් සංවිධානය කරන ලද BESPA Food Technical Advisory Group Meeting වැඩමුළුව |

3) ප්‍රදර්ශනය සඳහා දායකත්වය ලබා දීම

පොල් නිෂ්පාදන ක්ෂේත්‍රය වෙනුවෙන් තත්ත්ව පාලන අංශයේ දායකත්වය පිළිබඳව දැනුවත් කිරීම සඳහා පහත ප්‍රදර්ශන සඳහා සහභාගී වී ඇත.

වගුව 27 : දායකත්වය දැක්වූ ප්‍රදර්ශන

| | |
|---|---|
| 1. | කර්මාන්ත සංවර්ධන මණ්ඩලය විසින් 2023 ජුනි 22 - 25 දක්වා සංවිධානය කරන ලද BMICH හි පැවැත්වූ කර්මාන්ත ප්‍රදර්ශනය |
| 2. | 2023 අගොස්තු මස 04 - 06 දක්වා BMICH හි පැවැත්වූ PROFOOD PROPACK ප්‍රදර්ශනය |
| 3. | පොල් සංවර්ධන අධිකාරිය, පොල් වගා කිරීමේ මණ්ඩලය හා පොල් පර්යේෂණ ආයතනය එක්ව යාපනේ පලේයිහි 2023/09/02 දින සංවිධානය කරන ලද ජාත්‍යන්තර පොල් දිනය සඳහා පැවැත්වූ ප්‍රදර්ශනය |
| 4. | පූගොඩ සියනෑ ජාතික පාසලේ 2023 සැප්තැම්බර් මස 14 - 15 දෙදින පැවැත්වූ ප්‍රදර්ශනය |
| 5. | රත්නපුර ඇලෝසියස් විදුහලේ 125 වන සංවත්සරය සඳහා 2023 සැප්තැම්බර් මස 19 - 21 දක්වා පැවැත්වූ ප්‍රදර්ශනය |
| 6. | ජාඇල මහපොල අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශනය සඳහා 2023 දෙසැම්බර් මස 13 - 17 දෙදින පැවැත්වූ ප්‍රදර්ශනය |
| 7. | ගාල්ල දිස්ත්‍රික්කයේ 2023 දෙසැම්බර් මස 28 - 30 දක්වා පැවැත්වූ ජාතික කර්මාන්ත හා වෙළඳ ප්‍රදර්ශනය |

*රූපය 14 : සහභාගී වූ ප්‍රදර්ශන*



4) ප්‍රති අපනයන තොග පරීක්ෂා කිරීම සඳහා කර්මාන්තශාලා නිරීක්ෂණය

*වගුව 28 : ප්‍රති අපනයන තොග පරීක්ෂා කිරීම සඳහා කර්මාන්තශාලා නිරීක්ෂණය*

| | කාර්යය | පරීක්ෂා කිරීමේ ප්‍රගතිය (ආදර්ශ) |
|---|---|---|
| 1 | Renuka Agri Food PLC ආයතනයේ පොල්කිරි ආදර්ශ රැස් කිරීම 2023/06/07 හා 2023/08/02 දින සිදු කිරීම හා එම ආදර්ශ පරීක්ෂාව | 06 |
| 2 | CBL Global Food Limited ආයතනයේ පොල්කිරි ආදර්ශ රැස් කිරීම 2023/07/14 දින සිදු කිරීම හා එම ආදර්ශ පරීක්ෂාව | 03 |

**5) ප්‍රමිති සංශෝධන සහ නව ප්‍රමිති සකස් කිරීමේ සාකච්ඡා සඳහා සහ HS Code සකස් කිරීමේ කටයුතු සඳහා සහභාගිවීම.**

**වගුව 29 : ප්‍රමිති සංශෝධන සහ නව ප්‍රමිති සකස් කිරීමේ සාකච්ඡා සහ HS Code සකස් කිරීමේ කටයුතු සඳහා සහභාගිවීම.**

| | කාර්යය | ප්‍රගතිය |
|---|---|---|
| 1 | Coir Fibre Pith Substrate සඳහා ශ්‍රී ලංකා ප්‍රමිතිය සංශෝධනය කිරීම සහ කෙටුම්පත් සකස් කිරීම. | ප්‍රමිතිය සකස් වෙමින් පවතී. |
| 2 | Coconut Oil cakes & Meals සඳහා ශ්‍රී ලංකා ප්‍රමිතිය සංශෝධනය කිරීම සහ කෙටුම්පත් සකස් කිරීම. | ප්‍රමිතිය සකස් වෙමින් පවතී. |
| 3 | Low fat Desiccated Coconut & Partially Defatted Coconut සඳහා ශ්‍රී ලංකා ප්‍රමිතිය සකස් කිරීම. | ප්‍රමිති කෙටුම්පත මහජන අදහස් සඳහා යොමු කර ඇත. |
| 4 | සැකසුම් සංවර්ධන අංශය විසින් HS Code සකස් කිරීමේ කටයුතු සඳහා සම්පත් දායකයෙකු ලෙස සහභාගී වීම. | වැඩසටහන් 07 |

6) බාහිර රසායනාගාරයන්හි සේවක පිරිස වෙනුවෙන් තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය විසින් පුහුණු වැඩසටහන් පැවැත්වීම

| | |
|---|---|
| 1. | නව බඳවා ගැනීම් සිදුකරන ලද පරීක්ෂකවරුන් 05 දෙනෙකු සඳහා රසායනාගාර පුහුණුව ලබාදීම. |
| 2. | එස්. ඒ. සිල්වා ඇන්ඩ් සන්ස් පුද්ගලික සමාගම, ලෝලුවාගොඩ මිල්ස්, ලෝලුවාගොඩ යන දිසිඳි නිෂ්පාදනාගාරය සඳහා සල්ෆර් ඩයොක්සයිඩ් පරීක්ෂාව පිළිබඳ දැනුවත් කිරීම. |

7) අධ්‍යයන වැඩසටහන් පැවැත්වීම

| | |
|---|---|
| 1. | කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ සත්ත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශයේ සිසු සිසුවියන් 13 දෙනෙකු හා උපදේශකවරු තිදෙනෙකු සඳහා තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ රසායනාගාර කටයුතු පිළිබඳ අධ්‍යයන ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කිරීම හා රසායනාගාර කාර්යභාරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම. |

8) විශ්ව විද්‍යාලයන්හි ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා උපාධි සම්පූර්ණ කිරීමට අවශ්‍ය කාර්මික පුහුණු (Industrial Training) අවස්ථාව සැපයීම

වගුව 30 : විශ්ව විද්‍යාලයන්හි ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහා උපාධි සම්පූර්ණ කිරීමට අවශ්‍ය කාර්මික පුහුණු අවස්ථාව සැපයීම

| | විශ්ව විද්‍යාලය | සහභාගි වූ ශිෂ්‍යයන් ගණන |
|---|---|---|
| 1 | ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය - ක්ෂුද්‍රජීවී විශ්ලේෂණ සඳහා | 01 |
| 2 | කැළණිය විශ්ව විද්‍යාලය - ක්ෂුද්‍රජීවී / රසායනික විශ්ලේෂණ සඳහා | 04 |
| 3 | කොළඹ විශ්ව විද්‍යාලය - රසායනික විශ්ලේෂණ සඳහා | 02 |
| 4 | අග්නිදිග විශ්ව විද්‍යාලය , ඔලුවිල් - ක්ෂුද්‍රජීවී / රසායනික විශ්ලේෂණ සඳහා | 04 |
| 5 | නැගෙනහිර විශ්ව විද්‍යාලය, චෙන්කල්ලාඩි - රසායනික විශ්ලේෂණ සඳහා | 03 |
| 6 | Collage of Chemical Science - (IChem) | 02 |
| 7 | University of Vocational Technology - Rathmalana | 02 |
| | සම්පූර්ණ අවස්ථා ගණන | 18 |

9) තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා තත්ත්ව පාලන අංශයේ නිලධාරින් සහභාගි වීම

වගුව 31 : තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා තත්ත්ව පාලන අංශයේ නිලධාරින් සහභාගි වීම

| | කාර්යය | සහභාගි වූ නිලධාරි |
|---|---|---|
| 1 | අධිකාරියේ සේවකයන් සඳහා සෑත්කම් හා රෝහල් ගාස්තු රක්ෂණාවරණය ලබා ගැනීමේ තාක්ෂණික ඇගයීම් කමිටුව | එස්. එස්. පුරසිංහ මිය |
| 2 | 2023 වර්ෂය සඳහා ක්ෂුද්‍රජීවී මාධ්‍ය මිලදී ගැනීම් සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව | මධුරි විජේබණ්ඩාර මිය |
| 3 | 2023 වර්ෂය සඳහා උපකරණ මිලදී ගැනීම් සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව | සමදරා දිසානායක මිය |
| 4 | 2023 වර්ෂය සඳහා වීදුරු භාණ්ඩ හා උපාංග සුළු මිලදී ගැනීම් සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව | අශෝක පුෂ්පකුමාර මයා |
| 5 | 2023 වර්ෂය සඳහා රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීම් සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව | අශෝක පුෂ්පකුමාර මයා |
| 6 | සැකසුම් සංවර්ධන අංශයේ අවිධිමත් කර්මාන්ත සංවර්ධනය - පොල් ආශ්‍රිත නිෂ්පාදන ඒකක පිහිටුවීම සඳහා උපකරණ කට්ටල ලබාදීමේ තාක්ෂණික ඇගයීම් කමිටුව | අශෝක පුෂ්පකුමාර මයා |
| 7 | රසායනාගාර උපකරණ සේවා කිරීම සඳහා සේවා ගිවිසුම් සකස් කිරීම සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව | සමදරා දිසානායක මිය |
| 8 | රසායනාගාර සුළු මිලදී ගැනීම් සහ රසායනාගාර උපකරණ අළුත්වැඩියා සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව | සමදරා දිසානායක මිය<br>මධුරි විජේබණ්ඩාර මිය |
| 9 | අධිකාරියේ පවිත්‍රතා කටයුතු පිළිබඳ තාක්ෂණික ඇගයීම් කමිටුව | මධුරි විජේබණ්ඩාර මිය |

| | | |
|---|---|---|
| 10 | අධිකාරියේ සේවකයන් සඳහා පුද්ගල හදිසි අනතුරු රක්ෂණාවරණය | මධුරි විජේබණ්ඩාර මිය |
| 11 | අධිකාරියේ ආරක්ෂණ සේවාව ලබා ගැනීම පිළිබඳ තාක්ෂණික ඇගයීම් කමිටුව | මධුරි විජේබණ්ඩාර මිය |
| 12 | අධිකාරියේ සුභ සාධක ණය යෝජනා ක්‍රමය සඳහා වූ කමිටුව | මධුරි විජේබණ්ඩාර මිය |
| 13 | 2023 - 2024 වර්ෂය සඳහා වූ අධිකාරියේ සතු වාහන රක්ෂණය කිරීම සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව | මධුරි විජේබණ්ඩාර මිය |
| 14 | අධිකාරියේ කම්කරු වන්දි රක්ෂණ ඔප්පුව ලබා ගැනීම සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව | මධුරි විජේබණ්ඩාර මිය |
| 15 | අධිකාරියේ ගිණි රක්ෂණ ඔප්පුව ලබා ගැනීම සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව | මධුරි විජේබණ්ඩාර මිය |
| 16 | අධිකාරියේ සේප්පු අයකැමි හා මාර්ගස්ථ මුදල් රක්ෂණාවරණය ලබා ගැනීම සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව | මධුරි විජේබණ්ඩාර මිය |

**10.) නිෂ්පාදන දිනයේ සිට දින 60 - 90 තෙක් වයස ඇති දිසිඳි නිෂ්පාදනයන්හි තත්ත්වය පරීක්ෂා කිරීම**

වගුව 32 : දිසිඳි නිෂ්පාදනයන්හි තත්ත්වය පරීක්ෂා කිරීම

| වර්ගය | පරාමිතීන් එක්ව සලකා ප්‍රමිතියෙන් බැහැරවීමේ % | පරාමිතීන් අනුව බැහැර වීම | |
|---|---|---|---|
| | | දිලිර හා පුස් මත | වර්ණය මත |
| සියුම් ආදර්ශ - 08 | 25% | 12.5% | 12.5% |
| මධ්‍යම ආදර්ශ - 04 | 100% | 25% | 100% |
| Special Cuts ආදර්ශ - 08 | 62.5% | 25% | 50% |

තත්ත්ව පාලන අංශයේ සමස්ථ ප්‍රගතිය හා ආදායම ඉපැයීම

වගුව 33 : තත්ත්ව පාලන අංශයේ සමස්ථ ප්‍රගතිය හා ආදායම

| කාර්යය | 2023 | 2022 |
|---|---|---|
| පරීක්ෂා කර ඇති ආදර්ශ ප්‍රමාණය | 18,684 | 20,447 |
| සිදුකර ඇති පරීක්ෂණ ගණන | 76,665 | 84,173 |
| ආදායම් ඉපයීම (රු. මිලියන) | 54.7 | 23.6 |

# 03. අලෙවි සංවර්ධන සහ පර්යේෂණ අංශය

පොල් සංවර්ධන අධිකාරියේ ප්‍රධාන මෙහෙයුම් අංශයක් ලෙස ක්‍රියාකරන අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් 2023 වසරේදී කරනු ලබන සේවාවන් පහත පරිදි වේ:

- පොල් සංවර්ධන අධිකාරියේ ප්‍රධාන මෙහෙයුම් අංශයක් ලෙස ක්‍රියාකරන අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් 2023 වසරේදී කරනු ලබන සේවාවන් පහත පරිදි වේ:
- අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශයට ඇති ප්‍රධාන වගකීම් අතර පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වැඩි අපනයන ආදායමක් ශ්‍රී ලංකාවට ලබා ගැනීම ප්‍රධාන වන අතර එහිදී ජාත්‍යන්තර අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් පිළිබඳව අපනයනකරුවන්/නිෂ්පාදකවරුන් දැනුවත් කිරීම, ඔවුන් සහභාගී කරවීම, හා ඒ සඳහා සහභාගී වීමට සහය ලබාදීම සිදුකරන ලදී.
- පොල් නිෂ්පාදන හා අපනයන ක්ෂේත්‍රයේ යෙදී සිටින කර්මාන්තකරුවන් මෙන්ම අපනයනකරුවන්ගේද දැනුම ඉහල නැංවීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.
- උසස් ප්‍රමිතියකින් යුතු පොල් සහ තැඹිලි ජාත්‍යන්තර වෙළෙඳපොළ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි අපනයනය කිරීම සඳහා අදාල අවසරපත් නිකුත් කිරීම සහ ක්ෂේත්‍රයට පිවිසීමට අපේක්ෂා කරන අපනයනාභිමුඛ ව්‍යවසායකයින් සඳහා තාවකාලික අපනයන අවසරපත් නිකුත් කරන ලදී.
- ජාත්‍යන්තර අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් වලට අත්‍යාවශ්‍යව තිබූ ප්‍රවර්ධන මුද්‍රිත ප්‍රකාශන උසස් ප්‍රමිතියෙන් සකස් කරන ලදී.
- ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තු හා සම්බන්ධ වී සියලුම පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනයන් සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ අනුමැතීන් ලබාදුන් අතර අපනයනයන් අධීක්ෂණ කරන ලදී.
- දේශීය සහ විදේශීය වෙළඳ ආරවුල් නිරාකරණය සහ සමථයන්ට පත්කරන ලදී.
- පොල් හා පොල් ආශ්‍රිත වෙළඳපළ මිල ගණන් මුද්‍රිත මාධ්‍ය වෙත දිනපතා ලබාදෙන ලදී.
- පොල් ආශ්‍රිත නිෂ්පාදන, අපනයන/ආනයන ප්‍රමාණ, වෙන්දේසි මිල ගණන්, ලෝක වෙළඳපලේ පොල් ආශ්‍රිත මිල ගණන් ඇතුළත් වාර්තා නිකුත් කරන ලදී.
- ගෙඩි පොල් වෙන්දේසිය නොකඩවා පවත්වන ලදී.
- පොල් ආශ්‍රිත නිෂ්පාදන දේශීය වෙළෙඳපොළ තුල ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දේශීය වෙළඳ ප්‍රදර්ශන සහ ප්‍රවර්ධන වැඩසටහන් වලට සහභාගී වී පොල් ආශ්‍රිත නිෂ්පාදන සහ ඒවා භාවිතා කිරීමෙන් ලැබෙන සෞඛ්‍යමය ප්‍රතිලාභයන්හි වැදගත්කම පිළිබඳව මහජනතාව සහ පාසැල් සිසුන් දැනුවත් කරන ලදී.
- දේශීය අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් වලට අවශ්‍ය කරන ප්‍රවර්ධන පත්‍රිකා සිංහල සහ දෙමළ භාෂාවලින් සකස් කරන ලදී.
- කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, වාණිජ දෙපාර්තමේන්තුව, විදේශ කටයුතු අමාත්‍යාංශය සහ අනෙකුත් රාජ්‍ය ආයතන සමග වෙළඳ ගිවිසුම් හා බැඳි සාකච්ඡා වටයන්ට සහභාගී වී පොල් ආශ්‍රිත අපනයන භාණ්ඩ පිළිබඳ තොරතුරු සහ අදාල ගිවිසුම් මගින් ලබාගත හැකි ප්‍රතිලාභ පිලිබඳව අදාල අංශ දැනුවත් කරන ලදී.
- පොල් ක්ෂේත්‍රයේ නියැලි සිටින පාර්ශවකරුවන්ට තම කාර්යයන් පොල් සංවර්ධන අධිකාරිය සමග පහසුවෙන් ඉටුකර ගැනීම සඳහා ව්‍යාපාර සේවා අංශයක් ස්ථාපිත කරන ලදී.
- පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනකරුවන් සඳහා විදේශීය වෙළඳ විමසුම් ලබාදීමට කටයුතු කරන ලදී.

- ගෙඩි පොල් සඳහා ආදේශකයක් වන පොල්කිරි හා පොල් කිරිපිටි භාවිතය පිළිබඳව සහ පොල් කටු සහ පොල් ලෙලි අපතේ යාම අවම කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා මුද්‍රිත මාධ්‍ය හරහා දැන්වීම් පළකිරීම, ගුවන් විදුලි පණිවුඩ සහ විද්‍යුත් මාධ්‍යයන්හි වැඩසටහන් පැවැත්වීම කරන ලදී.
- පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ලෝක වෙළෙඳපොළෙහි ඇති ඉල්ලුම, පොල් ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා පොල් සංවර්ධන අධිකාරියේ දායකත්වය, පොල් ක්ෂේත්‍රය සම්බන්ධ කාලීන තොරතුරු සමාජ මාධ්‍ය හරහා ලබාදීම නොකඩවා කරන ලදී.
- දේශීය හා විදේශීය පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන භාවිතයන් හඳුනාගැනීම, පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනයන් සඳහා දැනට ඇති ප්‍රධාන රටවල් හඳුනාගැනීම සහ එක් එක් රටවලින් එක් ඒකකයක් සඳහා ගෙවන මිල පිළිබඳ විශ්ලේෂණයන් කරන ලදී.
- අපනයනකරුවන්, වෙළඳුන්, පොල් වතු හා අතරමැදියන් ලියාපදිංචි කරන ලද අතර ඔවුන්ට අවශ්‍ය උපදේශණ සේවාවන් ලබාදෙන ලදී.

ඉහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයන ආදායම වශයෙන් 2023 වසරේදී රු. බිලියන 229 ක් හෙවත් ඇමරිකානු ඩොලර් මිලියන 700 ක් ලබාගැනීමට හැකි වූ අතර අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශයේ සේවාවන් කාර්යක්ෂමවත්, ඵලදායි ලෙසත් 2023 වර්ෂයේදී ද ඉටු කරන ලදී.

## 1. 2023 වර්ෂය තුළ අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටුකරන ලද කාර්යයන් විස්තර වශයෙන් පහත දක්වා ඇත

### 1.1 ජාත්‍යන්තර වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සහභාගි වීම

පොල් ආශ්‍රිත නිෂ්පාදන ජාත්‍යන්තරව ප්‍රවර්ධනය කිරීම සඳහා යොදා ගන්නා එක් ක්‍රමවේදයක් වන විදේශ රටවල සංවිධානය කරන ලද වැඩි ජාත්‍යන්තර ගැණුම්කරුවන් ප්‍රමාණයක් සහභාගී වෙතැයි බලාපොරොත්තු විය හැකි විදේශීය වෙළඳ ප්‍රදර්ශන සඳහා අපනයන/නිෂ්පාදන ආයතන සම්බන්ධ කරවීම පොල් සංවර්ධන අධිකාරිය විසින් සෑම වසරකම සිදු කර ඇත. මෙසේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන් වලට සහභාගීවීමෙන් විදේශ ඇණවුම් වැඩි වශයෙන් ලබාගැනීමටත්, නව ගැණුම්කරුවන් හඳුනාගැනීමටත්, තරගකාරී භාණ්ඩයන් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමටත්, ජාත්‍යන්තර ප්‍රජාවගේ පොල් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳව ඇති නව ප්‍රවණතා සහ අවශ්‍යතාවයන් හඳුනාගැනීමටත්, දිනෙන් දින යාවත්කාලීන වන භාණ්ඩයන්ගේ ප්‍රමිතීන් පිළිබඳව දැනුවත්වීමටත්, ඇසුරුම්කරණය පිළිබඳ නව ප්‍රවණතා හඳුනාගැනීමටත්, පවතින වෙළඳ පොළ ආරක්ෂා කර ගැනීමටත් හැකියාව ලැබේ. ජාත්‍යන්තර වෙළෙඳපොළ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා නිෂ්පාදන/අපනයනකරුවන් සහභාගී කරවීමෙන් ශ්‍රී ලංකාව සඳහා වූ විදේශ වෙළෙඳපොළ තවදුරටත් පුළුල් වන අතර පොල් කර්මාන්තයේ අපනයන ආදායම වසරින් වසර ඉහල නැංවීමට හැකියාව ලැබීමෙන් ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට හැකියාව ලැබේ.

තවද, එම රටවල තානාපති කාර්යාල, වාණිජ මණ්ඩල හා සම්බන්ධ වෙමින් ශ්‍රී ලාංකික පොල් නිෂ්පාදන සඳහා නව ගැණුම්කරුවන් හඳුනා ගැනීමට පොල් සංවර්ධන අධිකාරිය ක්‍රියා කර ඇත.

2023 වසරේදී ජාත්‍යන්තර අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් වෙනුවෙන් අපනයන ආයතන සඳහා අනුග්‍රාහකත්වය ලබාදීමට අපේක්ෂා කලද පවතින ආර්ථික අර්බුදය මත අනුග්‍රාහකත්වය ලබාදීමට අපොහොසත් වුවත් පොල් ආශ්‍රිත අපනයන/නිෂ්පාදන ආයතන ජාත්‍යන්තර අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් පිළිබඳව දැනුවත් කරන ලද අතර එම අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සහභාගී වීමට අපනයන ආයතන වෙත අවශ්‍ය සහය ලබා දෙන ලදී.

*රූපය 15,16 : China International Import Expo ප්‍රදර්ශනය*





හය වැනි වරට චීනයේ ෂැංහායි හි පැවැත්වූ China International Import Expo ප්‍රදර්ශනය ශ්‍රී ලංකාව වෙනුවෙන් අපනයන සංවර්ධන මණ්ඩලය සහ චීනයේ තානාපති කාර්යාලය හා එක්ව සංවිධානය කල අතර ඒ සඳහා පොල් සංවර්ධන අධිකාරිය ද සහභාගිත්වය ලබාදුනි. එහිදී පොල් ආශ්‍රිත නිෂ්පාදන පිලිබඳව චීන ජාතිකයන් සහ ප්‍රදර්ශනයට සහභාගී වූ අනෙකුත් ආනයනකරුවන් දැනුවත් කිරීම් කරන ලද අතර ලැබී තිබූ වෙළඳ විමසුම් ශ්‍රී ලාංකික අපනයන ආයතන වෙත ලබාදෙන ලද අතර ඒ පිළිබඳ පසු විපරම් කරමින් පවතී.

සෞදි හරිත මුලපිරීම (Saudi Green Initiative) සඳහා ශ්‍රී ලංකාවෙන් කොහු බත් සැපයීමේ හැකියා අවස්ථා සොයා තහවුරු කරගැනීම සඳහා සෞදි අරාබි රජයේ නියෝජිතයන් තිදෙනෙක් පැමිණි අතර ඔවුන්ට ශ්‍රී ලංකාවේ කොහු බත් නිෂ්පාදිත ආයතන වෙත ගොස් ඒ පිලිබඳව සොයා බැලීමට අවස්ථාව සකස්කර දෙන ලදී. එම නිෂ්පාදන සඳහා ඇණවුම් අපනයන ආයතන වෙත ඉදිරියේදී ලැබෙනු ඇතැයි අපේක්ෂා කරයි.

*රූපය 17 : සෞදි අරාබි රජයේ නියෝජිතයන් පැමිණි අවස්ථාව*



චීනයේ නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවේ පොල් ආශ්‍රිත කර්මාන්ත පිලිබඳව සමීක්ෂණයක් කරන ලද අතර, හඳුනාගත් අංශ සඳහා අවශ්‍ය වන තාක්ෂණික දැනුම ලබාදීමට ප්‍රතිපත්තිමය වශයෙන් එකග වී ඇත. ඉදිරියේදී එම දැනුම් උපයෝගී කරගෙන පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත තවත් ඉදිරියට ගෙන යාමට හැකියාවක් පවතී.

*රූපය 18 : ෆීජි හි නියෝජිත පිරිසක් පැමිණි අවස්ථාව*



ජාත්‍යන්තර පොල් ප්‍රජාවට අයත් රටක් වන ෆීජි හි නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවේ පොල් ආශ්‍රිත නිෂ්පාදන පිලිබඳව දැනුවත් වීමට පැමිණි අතර ඒ සඳහා අවශ්‍ය සහයෝගය සහ පහසුකම් ලබාදෙන ලදී.

### 1.2 දේශීය අලෙවි ප්‍රවර්ධන කටයුතු සංවිධානය කිරීම

2023 වසරේදී අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් පරිසර හිතකාමී පොල් හා පොල් ආශ්‍රිත භාණ්ඩ භාවිතය පිළිබඳව මහජනතාවට හා පාසැල් සිසුන්ට හඳුන්වාදීමේ අරමුණින් දේශීය වෙළඳ ප්‍රදර්ශන නවයකට (09) සහභාගී වන ලදී.

වගුව 34 : දේශීය වෙළඳ ප්‍රදර්ශන

| ප්‍රදර්ශනයේ නම | ස්ථානය | සංවිධානය |
|---|---|---|
| ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය - යාපනය | මුත්තුවෙලි ක්‍රීඩාංගණය | ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන සේවා පුද්ගලික සමාගම සහ යාපනය දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය |
| ජාතික කර්මාන්ත හා වැවිලි කර්මාන්ත ප්‍රදර්ශනය - 2023 | සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ප්‍රදර්ශන මධ්‍යස්ථානය | කාර්මික සංවර්ධන මණ්ඩලය |
| ප්‍රෝෆුඩ් ප්‍රෝපැක් හා ඇග්බිස් ප්‍රදර්ශනය | සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ප්‍රදර්ශන මධ්‍යස්ථානය | ශ්‍රී ලංකා ආහාර සැකසුම් කර්මාන්තකරුවන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන සේවා ආයතනය |
| ජාත්‍යන්තර පොල් දිනයට සමගාමීව පවත්වන ලද ප්‍රදර්ශනය | යාපනය පලෙයි | පොල් සංවර්ධන අධිකාරිය / පොල් වගා කිරීමේ මණ්ඩලය |
| විද්‍යා ප්‍රදර්ශනය | දොම්පේ සියනෑ ජාතික පාසල | දොම්පේ සියනෑ ජාතික පාසල |
| රත්නපුර ශාන්ත ඇලෝෂියස් 125 සංවත්සර සැමරුම් ප්‍රදර්ශනය | රත්නපුර ඇලෝෂියස් විද්‍යාලය | රත්නපුර ඇලෝෂියස් විද්‍යාලය |
| රුහුණු රසසරණිය | ගාල්ල නගර ශාලාව | දකුණු පළාත් කෘෂිකර්ම වාරිමාර්ග ගොවි සංවර්ධන, ජල සම්පාදන හා ජලප්‍රවාහන ආහාර සැපයුම් හා බෙදාහැරීම් වෙළඳ හා සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය |
| මහපොළ ප්‍රදර්ශනය | ජා-ඇල නගර සභා ක්‍රීඩාංගණය | වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය |
| ජාතික කර්මාන්ත හා වැවිලි කර්මාන්ත ප්‍රදර්ශනය - 2023 | ගාල්ල සමනල ක්‍රීඩාංගනය | කාර්මික සංවර්ධන මණ්ඩලය |

*රූපය 19,20,21 : පවත්වන ලද දේශීය වෙළඳ ප්‍රදර්ශන*







1.2.1 ගෘහස්ත පොල් අපතේ යාම අවම කර, එතුලින් පොල් නිෂ්පාදන ආයතන සඳහා වැඩි පොල් ප්‍රමාණයක් ලබාදීමේ අරමුණින් ගෙඩි පොල් වෙනුවට පොල් කිරි නිෂ්පාදන භාවිතය සුලබ කිරීම, පොල් කටු හා පොල් ලෙලි එකතු කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල ජනතාවට පැහැදිලි කිරීම, පොල් නිෂ්පාදනවල ඇති වැදගත්කම, තත්ත්ව පරීක්ෂාවෙන් උසස් නිෂ්පාදන සඳහා ඉහල ඉල්ලුමක් ලබාගන්නා ආකාරය, පොල් ආශ්‍රිත නිෂ්පාදන වලින් විදේශ විනිමය උපයා ගන්නා ආකාරය සම්බන්ධයෙන් පුවත්පත් දැන්වීම්, ලිපි, ගුවන් විදුලි දැන්වීම්, රූපවාහිනී දැන්වීම් යොදා ගනිමින් මහජනතාව සහ කර්මාන්තකරුවන් දැනුවත් කරන ලදී.

1.2.2 ගෙඩි පොල් භාවිතයේදී සිදුවන අපතේ යාම අවම කිරීමට පොල් කිරි, පොල් කිරිපිටි හා පොල් ක්‍රීම් භාවිතය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය සහභාගී වූ දේශීය ප්‍රදර්ශනවලදී ප්‍රායෝගික වැඩසටහන් ද සහිතව ඉතා වටිනා වැඩසටහන් පවත්වා ඇති අතර මෙම වැඩසටහන් සඳහා ඉතාමත් ඉහල ජනතා ප්‍රතිචාර ලැබුණි.

1.2.3 පොල්මද ආශ්‍රිත අපනයනකරුවන්/නිෂ්පාදනකරුවන් වෙනුවෙන් තත්ත්වයෙන් සහ ගුණාත්මකභාවයෙන් උසස් සන්නාමයන් සහිත පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ලෝක වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම හා ලෝක වෙළෙඳපොළේ ඒ සඳහා පවතින ඉල්ලුම පිලිබඳ දැනුවත් කිරීමටත්, තැඹිලි අපනයනයේදී ඇති ගැටළු ගැන සොයා බැලීමටත්, කොහු ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනයේදී/අපනයනයේදී අපද්‍රව්‍ය එකතු නොවන ආකාරයෙන් කටයුතු කිරීමටත් සාකච්ඡා වට සිදු කරන ලදී.

1.2.4 රට පුරා විසිරී සිටින පොල් ආශ්‍රිත කර්මාන්තයන්ගේ නිරත විවිධ පාර්ශවකරුවන් සහ අනාගතයේ පොල් ආශ්‍රිත කර්මාන්තයන්හි නිරත වීමට අදහස් කරන පුද්ගලයන්ට පොල් කර්මාන්ත පිලිබඳ දැනුම ලබාදීමට 2023 වසරේදී සමාජ මාධ්‍ය උපයෝගී කරගන්නා ලදී. එහිදී පොල් කර්මාන්ත ක්ෂේත්‍රය තුලින් ශ්‍රී ලංකා ආර්ථිකයට ඇති වැදගත්කම, පොල් ආශ්‍රිත නිෂ්පාදන වල ඇති වැදගත්කම, පොල් නිෂ්පාදන ක්ෂේත්‍රය නගා සිටුවීමට පොල් සංවර්ධන අධිකාරිය විසින් ගනු ලබන ක්‍රියාවන් සහ නිෂ්පාදන ආයතන විසින් තම නිෂ්පාදන වැඩිදියුණු කරගැනීමට අවශ්‍ය මූල්‍යමය ණය සහන පිළිබඳව ජනතාව දැනුවත් කරන ලදී.

1.2.5 2023 ජාත්‍යන්තර පොල් දින සැමරුම් උත්සවය පොල් වගා කිරීමේ මණ්ඩලය හා එක්ව යාපනයේදී ඉතා උත්සවාකාරයෙන් පවත්වන ලදී. එම උත්සවයට සමගාමීව යාපනයේ ජනතාව දැනුවත් කිරීම සඳහා විදේශයන්හි ඉහල ඉල්ලුමක් ඇති පොල් ආශ්‍රිත නිෂ්පාදන පිලිබඳව ප්‍රදර්ශනයක්ද පැවැත්වීමට කටයුතු කරන ලද අතර පොල් කර්මාන්තයේ ප්‍රගතිය, ඉදිරි දැක්ම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා ලිපි පෙලක් මුද්‍රිත සහ සමාජ මාධ්‍යයන් තුලින් ප්‍රකාශයට පත් කරන ලදී.

*රූපය 22 : සමාජ මාධ්‍යයන් තුලින් ප්‍රකාශයට පත් කරන ලද ලිපි පෙලක්*




## 1.3 පොල් හා පොල් ආශ්‍රිත භාණ්ඩ පිළිබඳ නිෂ්පාදනයන්, වෙළඳාම සහ අපනයන පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීම

පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලි සියල්ලන්ට සිය වෙළඳ තීරණ ගැනීමේදී තීරණාත්මක සාධකයක් වනුයේ නිවැරදි තොරතුරු ලබාගෙන ඒවා විශ්ලේෂණය කිරීමය. මෙහිදී අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශයේ තොරතුරු සේවාව 2023 වසරේදී ද විශේෂ කාර්යයභාරයක් පහත දක්වා ඇති අංග තුලින් ඉටුකරන ලදී.

- පොල් හා පොල් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන තොරතුරු, දේශීය හා ජාත්‍යන්තර අපනයන සහ ආනයන දත්ත ලබාගැනීම හා අදාල පාර්ශවකරුවන් වෙත බෙදාහැරීම.
- ගොවිපල මිල ගණන් සම්බන්ධයෙන් අදාළ තොරතුරු සහ දත්ත විධිමත්ව රැස්කිරීම හා බෙදාහැරීම.
- ගෘහස්ත පොල් හා පොල්තෙල් පරිභෝජනය පිළිබඳව දත්ත විධිමත්ව රැස්කර සසඳා බැලීම.
- නවතම අලෙවි ක්‍රම හඳුන්වාදීම මගින් අපනයන ආදායම වැඩිකර ගැනීමට සහය වීම.
- වර්තමාන හා අපේක්ෂිත පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් පිළිබඳව තොරතුරු විධිමත්ව රැස්කිරීම, සටහන් කිරීම හා ප්‍රචාරණය කිරීම.

පහත සඳහන් ආයතන වලින් මෙම තොරතුරු ලබාගැනීමේදී සිය දායකත්වය නොමසුරුව ලබාදෙන ලදී.

- ශ්‍රී ලංකා රේගුව
- ශ්‍රී ලංකා මහ බැංකුව
- ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව
- කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සහ අනෙකුත් රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතන

- තවද, විදේශීය ආයතන වන ජාත්‍යන්තර පොල් ප්‍රජාව (International Coconut Community), විදේශ සඟරා (Cocommunity, Oil World, UCAP, Indian Coconut Journal) ආදියෙන්ද පොල් කර්මාන්තය සඳහා ලබාගන්නා විශේෂිත තොරතුරු නිරතුරුවම ශ්‍රී ලංකා පොල් ප්‍රජාවට ලබාදීමේ කාර්යභාරය 2023 වසරේදීද අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මගින් සාර්ථකව ඉටුකරන ලදී.

- දෛනිකව ලබාගන්නා පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන වල දේශීය මිල ගණන් ඉංග්‍රීසි සහ සිංහල මුද්‍රිත මාධ්‍යයෙන් 2023 වසරේදී ද ප්‍රකාශයට පත් කරන ලදී.

- ගෙඩිපොල් මිලගණන්, දේශීය පොල් ආශ්‍රිත භාණ්ඩ සඳහා වන ගොවිපල මිල ගණන්, තොග මිල ගණන් හා ජාත්‍යන්තර මිල ගණන් ඇතුලත්, Coco Market Focus, සති වාර්තාවේ ප්‍රකාශන හතලිස් අටක් (48) අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මගින් 2023 වසරේදී ප්‍රකාශයට පත්කරන ලදී.

*රූපය 23 : CocoMarket Focus සති වාර්තාව*




- ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත පොල් ආශ්‍රිත භාණ්ඩයන්ගේ අපනයන ප්‍රමාණයන්, මිලගණන්, අපනයනය කරන ලබනු රටවල් සහ ආනයනය කරනු ලබන ඛාද්‍ය තෙල්, පොල්තෙල් ආනයන ප්‍රමාණයන් සහ මිලගණන් ඇතුලත්, Coco Market Focus, මාසික සගරාවේ ප්‍රකාශන දොලහක් (12) අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මගින් පොල් කර්මාන්ත ක්ෂේත්‍රයට සම්බන්ධ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතාවයන්ට අනුව සම්පාදනය කොට 2023 වසරේදී ප්‍රකාශයට පත්කරන ලදී.

*රූපය 24 : Coco Market Focus, මාසික සඟරාව*




- අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මගින් වාර්ෂිකව ප්‍රකාශයට පත්කරන "Sri Lanka Coconut Statistics" ප්‍රකාශනය 2023 වසරේදී ද සම්පාදනය කොට ඉදිරිපත් කරන ලදී. එම ප්‍රකාශනයේ ඇතුලත් වසර පහක (05) දත්තයන් අතර ශ්‍රී ලංකාවෙන් අපනයන කරන ලද සියලුම පොල් ආශ්‍රිත භාණ්ඩ වල අපනයන ප්‍රමාණ හා මිල ගණන්, නිෂ්පාදන ප්‍රමාණයන්, ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ පොල්තෙල් සහ අනෙකුත් ඛාද්‍ය තෙල් වර්ග වල ප්‍රමාණ හා මිලගණන්, අන්තර්ජාතික පොල් එලදාව, නිෂ්පාදන සහ අපනයන තොරතුරු, සඳහන් කල හැක. පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ හා අපනයන ක්ෂේත්‍රයේ නියැලි පාර්ශවකරුවන්ට සිය වෙළඳ තීරණ ගැනීමේදී මෙම ප්‍රකාශන බෙහෙවින් ඉවහල් විය.

රූපය 25 : *Sri Lanka Coconut Statistics* මාසික සඟරාව




## 1.4 පොල් කර්මාන්තයේ අපනයන ආදායම

පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්හී පසුගිය වසර 14ක අපනයන ආදායම (2010 - 2023) පහත දක්වා ඇත.

වගුව 35 : පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්හී අපනයන ආදායම

| වසර | වටිනාකම | |
|---|---|---|
| | (රු. මිලියන) | (ඇ. ඩො. මිලියන) |
| 2010 | 32,433 | 286.86 |
| 2011 | 47,306 | 427.85 |
| 2012 | 46,667 | 365.72 |
| 2013 | 47,952 | 371.40 |
| 2014 | 72,880 | 558.21 |
| 2015 | 75,259 | 553.63 |
| 2016 | 84,702 | 581.74 |
| 2017 | 91,198 | 598.19 |
| 2018 | 94,722 | 583.81 |
| 2019 | 108,946 | 609.77 |
| 2020 | 122,514 | 661.04 |
| 2021 | 166,034 | 834.12 |
| 2022 | 262,93 | 816.99 |
| 2023 | 228,720 | 700.47 |

*ප්‍රස්ථාරය 06 : පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්ගේ අපනයන ආදායම*



2023 වසරේදී පොල් ආශ්‍රිත භාණ්ඩ අපනයනයෙන් ලද ආදායම ඇ.ඩො. මිලියන 700 ක් වූ අතර එය 2022 වසරට සාපේක්ෂව 14% ක අඩුවීමකි. 2022 වසරට සාපේක්ෂව 2023 වසරේදී පොල් නිෂ්පාදනයේ අඩුවීම හේතුවෙන් අපනයන සැකසුම් අංශ වෙත පොල් සැපයීම අඩු වූ අතර එය අපනයනාභිමුඛ පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්හි ආදායමට සෘජුව බලපෑම් ඇති කරන ලදී.

2023 වසරේදී පොල් මද ආශ්‍රිත නිෂ්පාදිතයන්හි අපනයන ආදායම ඇ.ඩො. මිලියන 365.90 ක් වූ අතර අමුද්‍රව්‍ය ස්වරූපයේ කොහු අපනයනයන්හී ආදායම ඇ. ඩො. මිලියන 17.05 ක් විය. එය 2022 වසරට සාපේක්ෂව පිළිවෙලින් 10% ක් සහ 32% ක අඩුවීමක් පෙන්නුම් කරයි.

පොල් කටු ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීමෙන් 2023 වසරේදී ඇ.ඩො.මිලියන 129.13ක ආදායමක් ලබාගෙන ඇති අතර එය 2022 වසරට සාපේක්ෂව 21%ක අඩුවීමක් පෙන්නුම් කරයි.

අගය එකතු කළ කොහු නිෂ්පාදන අපනයනයන්හී ආදායම 2023 වසරේදී ඇ.ඩො. මිලියන 183.38 කි. එය 2022 වසරේ ආදායමට සාපේක්ෂව 15%ක අඩුවීමක් පෙන්නුම් කර ඇත.

2022 වසරට සාපේක්ෂව 2023 වසරේදී සමස්ථ පොල් ඵලදාවේ සිදුවූ අඩුවීම හේතුවෙන් අපනයන සැකසුම් අංශ වෙත පොල් සැපයීම අඩු වූ අතර එය අපනයනාභිමුඛ පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්හි ආදායමට සෘජුව බලපෑම් ඇති කරන ලදී. තවද 2023 වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා රුපියලට සාපේක්ෂව ඩොලරය රු. 370 සිට රු. 328 දක්වා අවප්‍රමාණය වීම මෙන්ම කර්මාන්තයේ නිෂ්පාදන පිරිවැය ඉහල යාම හේතුවෙන් ඇතැම් අපනයන ඇණවුම් අත්හැර දැමීමට සිදුවීම සහ ජාත්‍යන්තර වෙළෙඳපොළ තුල ශ්‍රී ලංකාවේ නිෂ්පාදනවල මිල තරගකාරීත්වය අඩුවීම හේතුවන් අපනයන ඇණවුම් අහිමි වීමද මෙම අපනයන ආදායමේ පහත වැටීමට හේතුවිය.

මෙහිදී විශේෂයෙන් නිෂ්පාදන පිරිවැය සැලකීමේදී, අනෙකුත් තරගකාරී රටවල පොල් මිලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ පොල් මිල ඉහල අගයක පැවතීම මෙන්ම ප්‍රවාහන, විදුලිය ඇතුළු බලශක්ති මිල, ඇසුරුම් ද්‍රව්‍ය මිල ආදී සියල්ලෙහි සිදුවූ මිල ඉහල යාම කර්මාන්තයේ අපනයන ආදායම කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කර ඇත.

එයට අමතරව මෙම අපනයන ආදායමේ පහත වැටීමට හේතු වූ බාහිර සාධක ලෙස අපගේ ප්‍රධාන අපනයන ගැනුම්කාර රටවල පැවති පසු කොවිඩ් ආර්ථික පසුබෑම් තත්ත්වයන් හේතුවෙන් සුපුරුදු අපනයන ඇණවුම් වල සිදුවූ පසුබෑමද සැලකිය හැක.කෙසේ වුවත් සමස්ථ අපනයන ආදායමේ පහත වැටීම හමුවේ වුවද තැඹිලි, පොල් වතුර, පොල් පිටි, පොල් ඇමයිනෝ, මීහිසළු වැනි ඇතැම් නිෂ්පාදන වල අපනයන ආදායමේ වර්ධනයක් පෙන්නුම් කර ඇත.

එහිදී විශේෂයෙන්ම ශ්‍රී ලංකාවට ආවේණික නිෂ්පාදනයක් වන තැඹිලි සඳහා විදෙස් වෙළෙඳපොළ තුළ පවතින ආදේශක නිෂ්පාදන අවම බැවින් පැවති අනන්‍ය ඉල්ලුම හේතුවෙන් සහ අධිකාරිය තැඹිලි අපනයනකරුවන් සමග එක්ව දියත් කල ප්‍රවර්ධන සහ නියාමන වැඩසටහන් හේතුවෙන් 2022 වසරට සාපේක්ෂව 2023 වසරේදී තැඹිලි අපනයන ආදායමේ 56% ක කැපී පෙනෙන වර්ධනයක් අත් කරගෙන ඇත.

*ප්‍රස්ථාරය 07 : පොල් එළදාව සහ අපනයන ආදායම හැසිරීම*




කෙසේ වුවත් 2030 වසර වන විට පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්තයෙහි අපනයන ආදායම ඇ.ඩො. බිලියන 2ක් දක්වා වැඩි කර ගැනීම අපේක්ෂාවයි.

මෙම ඉලක්කය සපුරා ගැනීමේදී දේශීයව වැඩි පොල් එළදාවක් ලබාගැනීම මෙන්ම ගෘහස්තව සිදුවන පොල් අපතේ යාම අවම කර ගැනීමත් තුළින් වැඩි පොල් ප්‍රමාණයක් පොල් ආශ්‍රිත කර්මාන්ත සඳහා යොදා ගැනීම සිදුකල යුතුව ඇත. එසේම, පොල් කර්මාන්තය තුළ වැඩි පොල් ප්‍රමාණයක් මෑතකාලීනව වැඩි විදේශීය ඉල්ලූමක් දක්නට ලැබුණු මද ආශ්‍රිත නිෂ්පාදන වන පොල් කිරි සහ කිරි ආශ්‍රිත අගය එකතුකළ නිෂ්පාදන, පොල් වතුර සහ පොල් වතුර ආශ්‍රිත අගය එකතුකළ නිෂ්පාදන නිපදවීම සඳහා යොමු කිරීම තුළින් මද ආශ්‍රිත නිෂ්පාදන අපනයන ආදායම ඉහල නංවා ගැනීම සිදු කල යුතු වේ.

එසේම, නවීන කෘෂිකර්මාන්තය සඳහා යොදාගන්නා පරිසර හිතකාමී වගා මාධ්‍ය සඳහා වන ගෝලීය පෙළඹුමේ වර්ධනය හේතු කොටගෙන කොහුබත්, පොල් ලෙලි කැබලි, කොහු කෙඳි සහ ඒ ආශ්‍රිතව නිෂ්පාදනය කරනු ලබන වගා මලු ඇතුළු උද්‍යාන වගාව සඳහා යොදාගන්නා කොහු නිෂ්පාදන සඳහා වන ඉල්ලූමේ වර්ධනයක් පවතින අතර ඒ සඳහා වැඩි පොල් ලෙලි ප්‍රමාණයක් යොමු කිරීම තුළින් වැඩි අපනයන ආදායමක් ලගා කර ගත හැක.

තවද, පොල්කටු යොදා ගනිමින් නිෂ්පාදනය කරනු ලබන වඩා වාසිදායක නිෂ්පාදනය වන විදේශ වෙළඳපොල තුල ඉහල ඉල්ලූමක් පවතින පොල් කටු සක්‍රීය කාබන් නිෂ්පාදනය සඳහා වැඩි පොල්කටු ප්‍රමාණයක් යොමු කිරීම තුළින් පොල්කටු ආශ්‍රිත නිෂ්පාදන අපනයන ආදායම ඉහල නංවාගැනීමට කටයුතු කල හැක.

### 1.5 අගය එකතු කිරීම්, වෙළඳපල ප්‍රවර්ධනය, සහ වෙළඳපල ප්‍රවේශය ඉහළ නැංවීම

**1.5.1** ඇණවුම් වැඩි ගණනක් ලැබීම හේතුවෙන් 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ පොල් මද ආශ්‍රිත නිෂ්පාදන අතුරින් පොල්තෙල්, තැඹිලි, පොල්වතුර, පොල්ක්‍රීම්, පොල්පිටි, පොල් බටර්, පොල් සීනි අපනයනයේ සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇත.

**1.5.2** පොල් සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය (www.cda.gov.lk) මගින් වඩාත් විධිමත් ලෙස දත්ත හුවමාරු කර ගැනීමේ කටයුතු 2023 වසරේදීද සිදු කරන ලදී.

**1.5.3** අගය එකතු කළ පොල් මද ආශ්‍රිත නිෂ්පාදන හා පරිසර හිතකාමී පොල් ආශ්‍රිත නිෂ්පාදන භාවිතය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම හා පොල් ආශ්‍රිත නිෂ්පාදන වලට ජනතාව යොමු කිරීමටත් එමගින් පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනයන් වැඩි කරගැනීමේ අරමුණින් සමාජ මාධ්‍ය හරහා ද ප්‍රවර්ධන සේවාවන් 2023 වසරේදී සිදු කරන ලදී.

### 1.6 පොල් හා පොල් ආශ්‍රිත නිමි භාණ්ඩ අලෙවිකරණ සම්බන්ධ සියලු පාර්ශවයන් ලියාපදිංචි කිරීම

2022 වසරට සාපේක්ෂව 2023 වසරේදී පොල් ආශ්‍රිත අපනයන ආයතනයන්ගේ ලියාපදිංචිය 8%කින් අඩුවී ඇත. එයට පාදක වී ඇත්තේ පොල් ඵලදාව අඩුවීමත්, නිෂ්පාදන පිරිවැය ඉහල යාම හේතුකොටගෙන අපනයන ඇණවුම් අඩුවීමත්ය. මේ අනුව අපනයනකරුවන් අඩු ප්‍රමාණයක් 2023 වසරේදී ලියාපදිංචිය ලබාගෙන ඇත. පොල් ඵලදාව අඩුවීම හේතුවෙන් 2022 වසරට සාපේක්ෂව 2023 වසරේදී පොල් වෙන්දේසිය සඳහා ද ගෙඩි පොල් ලැබීම 32% කින් අඩු වී තිබුනු අතර වෙන්දේසියට සහභාගීවන්නන්ගේ ලියාපදිංචියද 2022 වසරට සාපේක්ෂව 2023 වසරේදී අඩුවීමක් දක්නට ලැබේ.

වගුව 36 : ලියාපදිංචි කටයුතු - 2021/2022/2023

| ලියාපදිංචි කිරීම් | 2021 | 2022 | 2023 |
|---|---|---|---|
| අපනයන කරුවන් | 704 | 868 | 801 |
| බ්‍රෝකර්වරුන් | 17 | 23 | 17 |
| වෙළඳුන් | 31 | 69 | 67 |
| පොල් වතු | 99 | 135 | 123 |

### 1.7 පොල් වෙන්දේසි පැවැත්වීම

#### 1.7.1 කොළඹ ගෙඩි පොල් වෙන්දේසිය

1994 වසරේදී ආරම්භ කරන ලද ගෙඩි පොල් වෙන්දේසිය 2023 වසරේදී ද පවත්වන ලදී. පොල් වගාකරුවා හා ගැණුම්කරුවා යන දෙපාර්ශවයටම අවාසියක් නොවන ආකාරයට වෙන්දේසි 50ක් 2023 වසරේදී පැවැත්වීමට කටයුතු කරන ලදී.

වගුව 37 : කොළඹ ගෙඩි පොල් වෙන්දේසිය

| වර්ෂය | ගෙඩි ප්‍රමාණය | | සාමාන්‍ය මිල රු. (ගෙඩි 1000 කට) |
|---|---|---|---|
| | ඉදිරිපත් කළ ප්‍රමාණය | විකුණු ප්‍රමාණය | |
| 2021 | 34,784,736 | 23,530,226 | 56,512.88 |
| 2022 | 58,305,234 | 39,164,730 | 60,137.20 |
| 2023 | 39,459,341 | 29,539,384 | 70,890.79 |

#### 1.7.2 වෙළඳ ආරවුල් සම්බන්ධ කටයුතු

පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනයේදී ඇති වු වෙළඳ ආරවුල් නිරාකරණය කිරීම සඳහා 2023 වසරේදී ද අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය සිය දායකත්වය ලබා දෙන ලද අතර පොල් වෙන්දේසිය ක්‍රියාත්මක කිරීමේ දී අලෙවිකරුවන් හා ගැණුම්කරුවන් අතර ඇතිවන වෙළඳ ආරවුල් සමථයකට පත්කිරීම සඳහා මැදිහත්කරු ලෙස අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය 2023 වසරේදීද සුවිශේෂි කාර්යයභාරයක් ඉටු කරන ලදී.

# පොල් නිෂ්පාදිත අපනයන - 2022 /2023
## Comparative Statistics

වගුව 38 : පොල් නිෂ්පාදිත අපනයන සංසන්දනාත්මක සංඛ්‍යාලේඛන

| නිෂ්පාදන වර්ගය | ප්‍රමාණය (මෙ.ටො.) | | | වටිනාකම (ඇ.ඩො.මිලියන) | | |
|---|---|---|---|---|---|---|
| | 2022 | 2023 | % වෙනස | 2022 | 2023 | % වෙනස |
| **1. පොල් මද නිෂ්පාදිතයන්** | | | | | | |
| 1) පොල් තෙල් | 4,712 | 5,518 | 17 | 12.24 | 11.83 | -3 |
| 2) නැවුම් පොල්තෙල් | 14,965 | 14,728 | -2 | 62.86 | 55.06 | -12 |
| 3) දිසිදි පොල් | 43,791 | 37,988 | -13 | 96.11 | 73.69 | -23 |
| 4) කොප්පරා | 2,080 | 979 | -53 | 2.67 | 1.26 | -53 |
| 5) ගෙඩි පොල් (ගෙඩි '000) | 13,376 | 14,127 | 6 | 6.38 | 6.62 | 4 |
| 6) තැඹිලි (ගෙඩි) | 10,872,878 | 12,909,100 | 19 | 6.51 | 10.19 | 56 |
| 7) පුන්නක්කු | 30,886 | 25,647 | -17 | 13.61 | 8.28 | -39 |
| 8) ඔයිල් කේක් | 174 | 177 | 2 | 0.10 | 0.10 | -2 |
| 9) පොල් කිරම | 17,137 | 20,673 | 21 | 36.66 | 36.09 | -2 |
| 10) පොල් කිරි | 52,765 | 58,013 | 10 | 92.31 | 86.97 | -6 |
| 11) පොල් කිරිපිටි | 8,621 | 8,407 | -2 | 42.09 | 40.36 | -4 |
| 12) මේදය ඉවත් කළ පොල් | 5,324 | 2,366 | -56 | 6.12 | 2.43 | -60 |
| 13) පොල් වතුර | 26,484 | 29,220 | 10 | 23.61 | 25.41 | 8 |
| 14) පොල් අරක්කු (ලීටර්) | 28,870 | 34,723 | 20 | 0.22 | 0.19 | -11 |
| 15) විනාකිරි (ලීටර්) | 17,525 | 43,403 | 148 | 0.07 | 0.14 | 118 |
| 16) ෆැටි ඇසිඩ් | 198 | 253 | 28 | 0.22 | 0.18 | -16 |
| 17) පොල් බටර් | 143 | 182 | 27 | 0.49 | 0.61 | 25 |
| 18) පොල් පිටි | 3,055 | 3,594 | 18 | 3.00 | 3.10 | 3 |
| 19) පොල් සීනි / පැණි / සිරප් | 78 | 118 | 51 | 0.25 | 0.34 | 36 |
| 20) පොල් ඇමයිනෝ | 609 | 622 | 2 | 2.75 | 3.05 | 11 |
| ***උප එකතුව - පොල් මද නිෂ්පාදිතයන්*** | **11,143,671** | **13,209,838** | **236** | **408.27** | **365.90** | **-10** |
| **2. කෙඳි නිෂ්පාදිතයන්** | | | | | | |
| 21) ගුදිරි කෙඳි | 73,342 | 68,888 | -6 | 17.39 | 11.43 | -34 |
| 22) බ්‍රිස්ටල් කෙඳි | 2,108 | 1,853 | -12 | 2.55 | 2.05 | -20 |
| 23) අඹරන ලද කෙඳි | 13,769 | 13,315 | -3 | 5.18 | 3.57 | -31 |
| ***උප එකතුව - කෙඳි නිෂ්පාදිතයන්*** | **89,219** | **84,057** | **-5.8** | **25.12** | **17.05** | **-32** |
| **3. පොල් කටු නිෂ්පාදිතයන්** | | | | | | |
| 24) පොල් කටු අඟුරු | 14,110 | 9,975 | -29 | 7.54 | 5.01 | -34 |
| 25) පොල් කටු කැබලි හා කුඩු | 241 | 285 | 18 | 0.14 | 0.15 | 6 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 26) සක්‍රිය කාබන් | 54,830 | 51,540 | -6 | 154.84 | 123.97 | -20 |
| **උප එකතුව - පොල් කටු නිෂ්පාදිතයන්** | **69,181** | **61,800** | **-11** | **162.52** | **129.13** | **-21** |
| **4. නිමි භාණ්ඩ නිෂ්පාදිතයන් (කොහු කෙදි ආශ්‍රිත)** | | | | | | |
| 27) කොහු ලණු | 975 | 801 | -18 | 0.74 | 0.53 | -29 |
| 28) කොහු කඹ | 9,080 | 6,678 | -26 | 11.43 | 7.81 | -32 |
| 29) තවාෂි බුරුසු (සංඛ්‍යාව'000) | 22,382 | 20,918 | -7 | 4.12 | 3.88 | -6 |
| 30) කොසු හා බුරුසු (සංඛ්‍යාව'000) (තවාෂි බුරුසු හැර) | 13,165 | 12,452 | -5 | 9.60 | 8.83 | -8 |
| 31) රබර් මිශ්‍ර කොහු පැඩි හා ඇඳන් මෙට්ට (සංඛ්‍යාව) | 1,007,247 | 661,575 | -34 | 0.81 | 0.64 | -21 |
| 32) කොහු ලණු පැදුරු හා බුමුතුරුණු (වර්ග මීටර්) | 381,771 | 268,665 | -30 | 1.55 | 1.09 | -29 |
| 33) කොහු කලාල (වර්ග මීටර්) | 1,778 | 5,450 | 207 | 0.01 | 0.02 | 220 |
| 34) කොහු බත් | 34,923 | 23,915 | -32 | 8.57 | 5.99 | -30 |
| 35) පොල් ලෙලි කැබලි | 2,316 | 3,352 | 45 | 0.94 | 1.16 | 23 |
| 36) මිහිසළු | 3,746 | 4,197 | 12 | 4.41 | 4.49 | 2 |
| 37) උද්‍යාන වගා සඳහා යොදා ගන්නා කොහු නිෂ්පාදිතයන් | 292,364 | 303,022 | 4 | 173.41 | 148.94 | -14 |
| **උප එකතුව - කොහු ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදිතයන්** | **1,769,747** | **1,311,025** | **116** | **215.59** | **183.38** | **-15** |
| **5. වෙනත් නිෂ්පාදිතයන්** | | | | | | |
| 38) පොල් ඉරටු | 16,170 | 14,113 | -13 | 5.33 | 4.96 | -7 |
| 39) පොල් ලී | 32 | 9 | -73 | 0.16 | 0.06 | -61 |
| **උප එකතුව - වෙනත් නිෂ්පාදිතයන්** | **16,202** | **14,122** | **-13** | **5.49** | **5.02** | **-9** |
| **මුළු අපනයන ආදායම** | | | | **817** | **700.48** | **-14** |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව*

# 04. පරිපාලන අංශය

පරිපාලන අංශයේ මූලික පරමාර්ථය වනුයේ ආයතනයේ සියළු අංශයන් සඳහා සහය සේවාවන් ලබාදීම හා පහසුකම් සැපයීම, අධිකාරියේ මනා පැවැත්ම හා ප්‍රවර්ධනය වෙනුවෙන් අදාළ වන සියළුම ආයතනික කටයුතු, මානව සම්පත් සංවර්ධනය හා පරිපාලන කටයුතු මෙහෙයවීම මගින් ආයතනයේ අනෙකුත් ක්‍රියාකාරී අංශවලට ස්වකීය කාර්යභාරය ඉටු කිරීමේදී සහය වීම මෙන්ම සමස්ත ආයතනයේ සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක වීමයි.

## 4.1 සේවක සංඛ්‍යාව

මෙම අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 259 කි. 2023 වර්ෂයේදී සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව 188ක් වූ අතර එම සේවක සංඛ්‍යාවෙන් තිස් එක් දෙනෙකු (31) කළමනාකරණ මට්ටමේ අය වූහ. සේවක සංඛ්‍යාව පහත සේවා ශ්‍රේණියන්ගෙන් සමන්විත විය.

1. ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ශ්‍රේණිය
2. කළමනාකාර සේවා ශ්‍රේණිය
3. කනිෂ්ඨ කළමනාකාර සේවා ශ්‍රේණිය
4. ආශ්‍රිත නිලධාරී සේවා ශ්‍රේණිය
5. කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ශ්‍රේණිය
6. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ශ්‍රේණිය
7. ප්‍රාථමික ශිල්පීය සේවා ශ්‍රේණිය
8. ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ශ්‍රේණිය
9. ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ශ්‍රේණිය

මෙම අධිකාරිය සඳහා අනුමත කාර්යය මණ්ඩලයේ පවතින පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම සහ බඳවා ගැනීමේ සිට විශ්‍රාම යාම දක්වා කාර්යය මණ්ඩල පරිපාලනයට අදාළ සියළුම කටයුතු සිදු කිරීම පරිපාලන අංශය මගින් සිදු කරනු ලබයි.

වගුව 39 : 2023.12.31 දිනට කාර්යය මණ්ඩල තොරතුරු

| | තනතුරු නාමය | සේවා ගණය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණය | | | | | |
| 1 | අධ්‍යක්ෂ ජනරාල් | HM 2-1 | 01 | 01 | - |
| 2 | අධ්‍යක්ෂ (පරිපාලන) | HM 1-1 | 01 | - | 01 |
| 3 | අධ්‍යක්ෂ (මුදල්) | HM 1-1 | 01 | 01 | - |
| 4 | අධ්‍යක්ෂ (සැකසුම් සංවර්ධන) | HM 1-1 | 01 | - | 01 |
| 5 | අධ්‍යක්ෂ(තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ) | HM 1-1 | 01 | 01 | - |
| 6 | අධ්‍යක්ෂ(අලෙවි සංවර්ධන හා පර්යේෂණ) | HM 1-1 | 01 | - | 01 |
| 7 | අධ්‍යක්ෂ - අලෙවිකරණ (ජාත්‍යන්තර) | HM 1-1 | 01 | - | 01 |
| කළමනාකාර සේවා ගණය | | | | | |
| 8 | සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) | MM 1-1 | 01 | 01 | - |
| 9 | සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) | MM 1-1 | 01 | - | 01 |
| 10 | සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැකසුම් සංවර්ධන) | MM 1-1 | 04 | 04 | - |
| 11 | සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ) | MM 1-1 | 02 | 02 | - |
| 12 | සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (අලෙවි සංවර්ධන හා පර්යේෂණ) | MM 1-1 | 02 | 02 | - |
| 13 | අභ්‍යන්තර විගණක | MM 1-1 | 01 | - | 01 |
| 14 | රසඥ | MM 1-1 | 01 | 01 | - |
| 15 | ඉංජිනේරු(සිවිල්) | MM 1-1 | 01 | 01 | - |
| 16 | නීති නිලධාරි | MM 1-1 | 01 | 01 | - |
| කණිෂ්ඨ කළමනාකාර සේවා ගණය | | | | | |
| 17 | පරිපාලන නිලධාරි/මානව සම්පත් නිලධාරි | JM1-2 | 01 | - | 01 |
| 18 | පර්යේෂණ නිලධාරි | JM1-2 | 01 | 01 | - |
| 19 | අලෙවි නිලධාරි | JM1-2 | 01 | - | 01 |
| 20 | තොරතුරු නිලධාරි | JM1-2 | 01 | 01 | - |
| 21 | අභ්‍යන්තර විගණන නිලධාරි | JM1-2 | 01 | 01 | - |
| 22 | තත්ත්ව පාලන නිලධාරි | JM1-2 | 01 | 01 | - |
| 23 | ජ්‍යෙෂ්ඨ පරීක්ෂක | JM1-2 | 09 | 09 | - |
| 24 | මූල්‍ය නිලධාරි | JM1-2 | 01 | 01 | - |
| 25 | ආර්ථික පර්යේෂණ නිලධාරි | JM1-2 | 01 | - | 01 |
| 26 | සැකසුම් සංවර්ධන නිලධාරි | JM1-2 | 05 | 02 | 03 |
| 27 | සභාපති - ලේකම් | JM1-2 | 01 | - | 01 |
| ආශ්‍රිත නිලධාරි සේවා ගණය | | | | | |
| 28 | වැඩසටහන් සහකාර (තත්ත්ව පාලන) | MA 3 | 07 | 02 | 05 |
| 29 | වැඩසටහන් සහකාර (අලෙවි පර්යේෂණ) | MA 3 | 03 | 01 | 02 |
| 30 | වැඩසටහන් සහකාර (සැකසුම් සංවර්ධන) | MA 3 | 02 | - | 02 |
| 31 | වැඩසටහන් සහකාර (ආර්ථික පර්යේෂණ) | MA 3 | 01 | 01 | - |
| 32 | වැඩසටහන් සහකාර (තොරතුරු) | MA 3 | 01 | 01 | - |
| 33 | වැඩසටහන් සහකාර (අභ්‍යන්තර විගණන) | MA 3 | 02 | 02 | - |
| 34 | වැඩසටහන් සහකාර (තාක්ෂණික සේවා) | MA 3 | 25 | 10 | 15 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **කළමනාකරණ සහකාර(තාක්ෂණ) සේවා ගණය** | | | | | |
| 35 | පොත් තබන්නා | MA2-2 | 02 | 02 | - |
| 36 | කාර්මික සහකාර (ප්‍රවාහන) | MA2-2 | 01 | - | 01 |
| 37 | කාර්මික සහකාර (යාන්ත්‍රික විදුලි) | MA2-2 | 01 | 01 | - |
| 38 | පරීක්ෂක | MA2-2 | 30 | 26 | 04 |
| 39 | රසායනාගාර කාර්මික ශිල්පී | MA2-2 | 11 | 09 | 02 |
| **කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන ) සේවා ගණය** | | | | | |
| 40 | කළමනාකරණ සහකාර | MA1-1 | 58 | 49 | 09 |
| 41 | අධ්‍යක්ෂ ජනරාල්- ලේකම් | MA1-1 | 01 | - | 01 |
| 42 | ක්ෂේත්‍ර සහකාර | MA1-1 | 02 | - | 02 |
| 43 | රසායනාගාර ක්ෂේත්‍ර සහකාර | MA1-1 | 02 | - | 02 |
| **ප්‍රාථමික ශිල්පීය සේවා ගණය** | | | | | |
| 44 | රියදුරු | PL-3 | 20 | 18 | 02 |
| **ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය** | | | | | |
| 45 | රසායනාගාර සහායක | PL-2 | 13 | 09 | 04 |
| **ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය** | | | | | |
| 46 | කාර්යාල සහායක | PL-1 | 18 | 13 | 05 |
| 47 | ක්ෂේත්‍ර සහායක | PL-1 | 15 | 13 | 02 |
| | එකතුව | | **259** | **188** | **71** |

### 4.2 මානව සම්පත් සංවර්ධන වැඩසටහන්

මානව සම්පත, අධිකාරියේ මෙහෙවර හා අරමුණු ලගා කර ගැනීම සඳහා වඩා ඵලදායීව හා සඵලදායීව යොදා ගැනීමට හැකිවන පරිදි මෙම අධිකාරියේ සේවක මහත්ම මහත්මීන්ගේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා 2023 වර්ෂයේ දේශීය පුහුණු සංවර්ධන පාඨමාලා විවිධ විෂයන් ඔස්සේ සංවිධානය කිරීමට කටයුතු කරන ලදී. මෙහිදී පුහුණු සංවර්ධන පාඨමාලා මෙහෙයවනු ලබන රාජ්‍ය ආයතන සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින් පාඨමාලා සංවිධානය කිරීමට කටයුතු කර ඇත. 2023 වර්ෂයේ දී අධිකාරියේ කාර්යය මණ්ඩලය වෙත පසුගිය වර්ෂයන්වල දී ලබා දීමට නොහැකි වූ හා අත්‍යාවශයෙන්ම ලබා දිය යුතු පුහුණු පාඨමාලා සඳහා සහභාගී කරවීම පාලන අංශයේ අරමුණ විය.

පුද්ගල ආකල්ප හා කුසලතා වර්ධනය, නවක කාර්යය මණ්ඩලය සඳහා රාජ්‍ය සේවය පිළිබඳ අවබෝධය ලබා දීම, කණ්ඩායම් හැගීම වර්ධනය, රැකියා පරිසරයේ ඇති වී තිබෙන නව්‍යතා හඳුන්වා දීම හා ආයතනික පරිසරය කෙරෙහි හැඩගැස්වීම පුහුණු පාඨමාලා සඳහා සහභාගී කරවීමේ අරමුණ වී ඇත.

ඒ අනුව කාර්යය මණ්ඩලය වෙනුවෙන් පුහුණු හා සංවර්ධන කටයුතු සඳහා වැය කරන මුදල් අනාගත ආයෝජනයක් සේ සළකා පුහුණු අවශ්‍යතා හඳුනාගෙන අදාළ පුහුණු කටයුතු සඳහා යොමු කිරීම සිදු කර ඇත.

## දේශීය පුහුණු සංවර්ධන කටයුතු

වගුව 40 : දේශීය පුහුණු සංවර්ධන කටයුතු

| අංකය | පාඨමාලාවේ නම | පවත්වන ලද ආයතනය | සහභාගී වූ ගණන |
|---|---|---|---|
| **01** | ප්‍රසම්පාදන පටිපාටිය | Prag Service (pvt) ltd | 04 |
| **02** | The Seminar on Procurement Plan | Prag Service (pvt) ltd | 01 |
| **03** | VAT Changes Workshop | Skill Development Institute | 02 |
| **04** | Expenditure & Payment Procedure | Prag Service (pvt) ltd | 04 |
| **05** | විනය කළමනාකරණය | Prag Service (pvt) ltd | 01 |
| **06** | Chartered Qualification in HRM | CIPM | 01 |
| **07** | Chartered Intermediate in HRM | CIPM | 02 |
| **08** | වරලත් බදුකරණය | Chartered Institute of Taxation of Sri Lanka | 01 |
| **09** | වැවිලි ව්‍යාපෘත කළමනාකරණ ජාතික ඩිප්ලෝමාව | NIPM | 01 |
| **10** | දෙමළ භාෂා පුහුණු වැඩසටහන | NIPM | 118 |
| **11** | නව පත්වීම්ලාභීන්ට සහ අධිකාරියේ කාර්යය මණ්ඩලය සඳහා ලිපිගොනු කළමනාකරණය, ධනාත්මක චින්තනය පිළිබඳ පුහුණු වැඩසටහන | පොල් සංවර්ධන අධිකාරිය මගින් බාහිර සම්පත් දායක දේශකවරුන්ගේ සහභාගිත්වයෙන් | 40 |

*රූපය 26,27,28,29 : නව පත්වීම්ලාභීන්ට සහ අධිකාරියේ කාර්යය මණ්ඩලය සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන*









## පාලන අංශයේ වෙනත් කාර්යයන්

- ආයතනයේ ස්ථාවර වත්කම් සම්බන්ධ වත්කම් ලේඛන පවත්වාගෙන යාම, වාර්ෂික තොග සමීක්ෂණ සම්බන්ධ සියළු  කටයුතු ඉටු කිරීම.
- අධිකාරියට අවශ්‍ය සියළුම ප්‍රාග්ධන භාණ්ඩ ලිපිද්‍රව්‍ය සහ තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයෙහි ස්ථාපිත කර ඇති ක්ෂුද්‍ර ජීවී විශ්ලේෂණ අංශය, රසායනික විශ්ලේෂණ අංශය හා සංවේදී රසායනාගාරය යන මූලික රසායනාගාර හා ඊට අනුබද්ධව පවතින මාධ්‍ය සැකසුම් ඒකකය, සංවේදී උපකරණ අංශය හා සේදුම් ඒකකය වැනි තත්ත්ව පාලන ඒකක සඳහා අවශ්‍ය රසායනාගාර උපකරණ, රසායනික ද්‍රව්‍ය සහ ක්ෂුද්‍ර ජීවී මාධ්‍ය මිලදී ගැනීම.
- සේවකයින් ආයතනික පරිපාලනමය නීතිරීති වලට අවනත නොවීම යන කරුණු කාරණා වලදීත් ආයතනයේ විනය පාලනයට අවශ්‍ය සියළුම ක්‍රියා පරිපාටි සහ කම්කරු විනිශ්චය සභා කාර්මික අධිකරණයේ නීති කටයුතු සිදු කිරීම.
- ප්‍රවාහන කළමනාකරණය සම්බන්ධ සියළු කටයුතු සිදුකිරීම.
- ඉදිකිරීම්, නඩත්තු හා සේවා සම්බන්ධ සියළු කටයුතු සිදුකිරීම.
- අධිකාරියට අවශ්‍ය ආරක්ෂක සේවාව,පවිත්‍රතා සේවාව, කාර්යය මණ්ඩලය ප්‍රවාහන සේවාව ලබා ගැනීම සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම හා අධීක්ෂණ කටයුතු සිදු කිරීම.
- අධිකාරියේ කාර්යය මණ්ඩලය සම්බන්ධව හා රථවාහන සඳහා රක්ෂණාවරණය ලබා ගැනීම සම්බන්ධව කටයුතු සිදු කිරීම.
- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, කළමනාකාරණ සේවා දෙපාර්තමේන්තුව ආදී ආයතන වෙත ඉල්ලූම් කරන අවස්ථාවලදී අදාළ වාර්තා, ප්‍රගතිය සම්බන්ධ වාර්තා සකස් කර ඉදිරිපත් කිරීම.
- අධිකාරියේ එක් එක් අංශවලින් ලබා ගන්නා ලද දත්ත ඇසුරින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල හා අමාත්‍යාංශ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම.
- එක් එක් අංශවලින් ලබා ගන්නා ලද තොරතුරු හා විගණකාධිපති වාර්තා ඇතුලත් කර වාර්ෂික වාර්තාව සකස්කිරීම, අදාළ අනුමැතීන් ලබා ගැනීම හා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- අධිකාරියේ එක් එක් අංශවලට අදාළ වන සියළුම මුද්‍රණ කටයුතු සිදු කිරීම සඳහා වන ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම.
- අධිකාරියට භාණ්ඩ හා සේවා ලබා ගැනිම සඳහා වාර්ෂිකව සැපයුම්කරුවන් ලියාපදිංචි  කිරීම.
- අධිකාරියේ ගබඩාව නිසි තොග පාලනයක් යටතේ පවත්වා ගෙන යෑම.

# 05. මුදල් අංශය

පොල් සංවර්ධන අධිකාරියේ මුදල් අංශය මගින් විවිධ අංශවලට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැලසීමේ වගකීම දරයි. ඒ අනුව, අයවැය සහ මූල්‍ය කාර්ය සැලසුම්වලට අනුකුල වූ අනුමත වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා මූල්‍ය පහසුකම් සැලසීම සම්බන්ධයෙන් මුදල් අංශය වගකීම දරයි. වරින් වර මූල්‍ය වාර්තා සහ ප්‍රගති වාර්තා පිළියෙල කිරීම ඇතුළුව මූල්‍ය වාර්තා පවත්වාගෙන යාම වැනි කටයුතු ඉටු කිරීම සම්බන්ධයෙන් ද මුදල් අංශය වගකීම උසුලයි. ආයෝජන කළමනාකරණය ඇතුලුව එහි අරමුදල් භාරව කටයුතු කරන්නේ ද මුදල් අංශයයි. මුළු වත්කම් පාලනය කිරීම හා සම්බන්ධයෙන් වාර්තා තබා ගැනීම මුදල් අංශයේ වගකීම වේ. කළමනාකරණ අවශ්‍යතා සඳහා විවිධ මූල්‍ය වාර්තා පිළියෙල කිරීම ද මාසික, ත්‍රෛමාසික, අර්ධ වාර්ෂික සහ වාර්ෂික වාර්තා පිළියෙල කිරීම මෙම අංශය මගින් සිදුකෙරේ.

### 5.1 සාමාන්‍ය මෙහෙයුම් කටයුතු

- 2023 වර්ෂයේ රජයේ පුනරාවර්තන ප්‍රදාන ලෙස රු. මිලියන 92 ක් ලැබී ඇති අතර රු. මිලියන 525.3 ක් අභ්‍යන්තර ආදායම් උපයා ඇත.
- සාමාන්‍ය මෙහෙයුම් කටයුතු සඳහා පුනරාවර්තන වියදම රු. මිලියන 298.9 ක් සහ ප්‍රාග්ධන වියදම් රු. මිලියන 34.667 ක් දරා ඇති අතර, ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා වැය කර ඇති මුදල රු. මිලියන 23.64 ක් වේ (Working progress ඇතුළුව).

### 5.2 ප්‍රාග්ධන සංවර්ධන වැඩසටහන

- අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය, සැකසුම් සංවර්ධන අංශය සහ තත්ත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශය යටතේ අනුමත ක්‍රියාකාරී සැලැස්මට අනුකුලව අදාල ව්‍යාපෘතීන් සඳහා අරමුදල් වියදම් කිරීම සිදු කරන අතර, ඒ සම්බන්ධව වෙනම ගිණුම් පොත්පත් පවත්වාගෙන යාම සිදු කරයි.

**2023 වර්ෂයේ දී ද පහත සඳහන් කටයුතු නිම කිරීමට අධිකාරියේ මුදල් අංශයට හැකි වී ඇත.**

- අරමුදල් කළමනාකරණය සහ සංවර්ධන ව්‍යාපෘති යන වැඩසටහන් පිළිබඳ මූල්‍ය වාර්තා සැපයීම.
- මෝල් සංවර්ධන අරමුදලේ දිසිඳි පොල් මෝල් හිමියන් නමින් පවත්වාගෙන යන ආරක්ෂිත ඇප තැන්පත් කේවල ගිණුම් එක් එක් මෝල් හිමියන්ගේ නමින් විවෘත කර ඇති කේවල ඉතිරි කිරීමේ ගිණුම්වල මනා කළමනාකාරීත්වයකින් යුතුව පවත්වාගෙන යෑම.
- පොල්තෙල් මිල ස්ථායීකරණ අරමුදල උපයෝගී කර ගනිමින් පොල් කර්මාන්තයේ නියුතු ව්‍යවසායකයින් සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමග එක්ව "කප්රුක ජය ඉසුර" ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට සහය වීම.
- පොල් සංවර්ධන අධිකාරියේ සේවක අර්ථසාධක අරමුදලේ මුදල් නිසි පරිදි කළමනාකරණය කිරීම, සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින්ට ණය මුදල් ගෙවීම් කටයුතු කිරීම හා අවුරුදු 55 ඉක්ම වූ සේවකයින්ගේ ඉල්ලීම මත 75% සීමාවට යටත්ව සාමාජික මුදල් නිදහස් කිරීම.
- මනා කළමණාකාරිත්වයකින් යුතුව දැනට ආයෝජනය කර ඇති අරමුදල් භාණ්ඩාගාර බිල්පත් සහ රජයේ බැංකු වල ස්ථාවර තැන්පතු මනා ක්‍රියාකාරීත්වයකින් පවත්වාගෙන යාම හා ඉතිරි මුදල් ඉතිරි කිරීමේ ගිණුම් වල තැන්පත් කිරීම.

මුදල් අංශය විසින් වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික අවසාන ගිණුම් ප්‍රකාශ, මාසික මූල්‍ය ප්‍රගති වාර්තා සහ අනෙකුත් සංඛ්‍යාලේඛන තොරතුරු සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලය, අමාත්‍යාංශය, භාණ්ඩාගාරය, රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව සහ අනෙකුත් අදාළ ආයතන වෙත නියමිත කාලසීමාව තුළ ඉදිරිපත් කිරීමෙන් එහි වගකීම ඉටුකර ඇත.

පොල් සංවර්ධන අධිකාරිය
2023.12.31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන් අංකය | 2023.12.31 | 2022.12.31 |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | රු. | රු. |
| දේපළ, පිරියත හා උපකරණ | 1 | 571,878,566 | 910,341,039 |
| අඩු කළා: සමුච්චිත ක්ෂයකිරීම් | | (223,562,434) | (202,750,872) |
| | | **348,316,132** | **707,590,167** |
| කෙරීගෙන යන වැඩ | | 6,477,909 | 1,688,826 |
| මායිම් බිත්තිය සහ ජලවහන මාර්ග පද්ධතිය | | 252,860 | 690,552 |
| කාර්ය මණ්ඩල ණයගැතියන් | 2 | 22,726,851 | 20,604,320 |
| බීසීසී ලංකා ආයතනයට ලබා දුන් ණය | | - | 58,265,037 |
| බීසීසී ලංකා ආයතනයෙන් ලැබිය යුතු පොලිය | | - | 60,174,135 |
| සැක සහිත ණයකරුවන් සඳහා ප්‍රතිපාදන | | - | (60,174,135) |
| කප්රුක නිපයුම් දිරිය වෙත ලබා දුන් ණය | 3 | 213,475,980 | 155,781,634 |
| | | **242,933,601** | **237,030,370** |
| **ජංගම වත්කම්** | | | |
| **ඉන්වෙන්ටරි / තොග** | | | |
| තොග | 4 | 25,252,914 | 22,219,934 |
| | | **25,252,914** | **22,219,934** |
| **වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දේ** | | | |
| සුභසාධන ණය අරමුදල | | 1,700,000 | 2,007,438 |
| විවිධ ණයගැතියන් | 5 | 58,304,960 | 88,133,311 |
| කාර්ය මණ්ඩල ණයගැතියන් | 2 | 6,112,026 | 5,816,636 |
| විවිධ අත්තිකාරම් | | 641,350 | 720,970 |
| විවිධ තැන්පත් | 6 | 1,511,157 | 1,510,613 |
| **ආයෝජන දේපල (මාස 3 ක කාලය)** | | | |
| බැංකු තැන්පතු | 8 | 683,859,278 | 655,084,328 |
| භාණ්ඩාගාර බිල්පත් | 7 | 15,799,451 | 22,590,872 |
| | | **767,928,223** | **775,864,169** |
| පෙරගෙවීම් | 9 | **767,928,222** | **3,139,392** |
| **මුදල් සහ මුදල් සමාන දෑ** | | | |
| **ආයෝජන දේපල ( මාස 3 ක කාලය)** | | | |
| බැංකු තැන්පතු | 8 | 264,276,891 | 189,593,522 |
| භාණ්ඩාගාර බිල්පත් | 7 | 886,459 | 3,477,558 |
| බැංකුවේ ඇති මුදල් | 10 | 171,659,278 | 39,975,089 |
| සුළු මුදල් | 11 | 30,000 | 40,550 |
| මුද්දර තැබීමේ යන්ත්‍රය | | 33,967 | 4,378 |
| | | **171,723,244** | **40,020,017** |
| අන්තර් ජංගම ගිණුම | 12 | 260,937,529 | 184,751,887 |
| **මුළු ජංගම වත්කම්** | | 1,496,422,575 | 1,219,066,479 |
| | | **2,087,672,308** | **2,163,687,016** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික දීමනා සඳහා ප්‍රතිපාදන | | **(50,957,084)** | (46,071,296) |
| **ජංගම වගකීම්** | | | |
| **ගෙවිය යුතු දෑ** | | | |
| විවිධ ණයහිමියන් | 13 | (13,482,091) | (4,680,595) |
| ආපසු ගෙවිය හැකි තැන්පතු | 14 | (1,702,096) | (1,171,870) |
| අත්තිකාරම් ලැබීම් | 15 | (10,373,827) | (10,340,171) |
| උපචිත වියදම් | 16 | (18,896,085) | (16,893,686) |
| අන්තර් ජංගම ගිණුම | | (260,937,554) | (184,751,887) |
| **මුළු ජංගම වගකීම්** | | **(305,391,653)** | **(217,838,209)** |
| | | **1,731,323,571** | **1,899,777,510** |
| **අරමුදල් සපයනු ලබන්නේ** | | | |
| ඉඩම් සඳහා ප්‍රත්‍යාගණන සංචිතය | | 17,727,100 | 391,733,330 |
| ගොඩනැගිලි සඳහා ප්‍රත්‍යාගණන සංචිතය | | 210,614,731 | 169,048,375 |
| මෝටර් වාහන සඳහා ප්‍රත්‍යාගණන සංචිතය | | 144,184,980 | 144,184,980 |
| | | **372,526,811** | **704,966,685** |
| ප්‍රදාන සහ දායක මුදල් | | 88,943,221 | 88,943,221 |
| ප්‍රාග්ධන සංවර්ධන පදනමින් ලැබුනු ප්‍රදාන | | 77,652,767 | 77,652,767 |
| සමුච්චිත අරමුදල | 17 | 1,192,200,771 | 1,028,214,837 |
| | | | |
| | | **1,731,323,570** | **1,899,777,510** |

පිටු 10-15 හි ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 16-34 හි සටහන්, මූල්‍ය ප්‍රකාශනයේ අනිවාර්ය අංගයකි. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශන 2024.02.28 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

.................................................

එම්.පී.සන්ද්‍යා කාන්ති
අධ්‍යක්ෂ මුදල්

..............................................

අචාර්ය සී.එම්.පී.පී.රොෂාන් ප්‍රියංකර පෙරේරා
සභාපති

.................................................

ජනක ප්‍රේමරත්න
අධ්‍යක්ෂ ජනරාල්
28/02/2024

..............................................

එන්.එස්.වනසිංහ
අධ්‍යක්ෂක

## පොල් සංවර්ධන අධිකාරිය

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (අරමුදල් අනුව විශ්ලේෂණය කරන ලදී)

| වසර | 2022 | | | | |
|---|---|---|---|---|---|
| | පුනරාවර්තන රු. | ප්‍රාග්ධන සංවර්ධන අරමුදල රු. | පී.එස්.එස්.ඔයිල් අරමුදල රු. | පොල් සංවර්ධන අරමුදල රු. | එකතුව රු. |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| **දේපළ, පිරියත හා උපකරණ** | 841,983,831 | 68,357,208 | - | - | 910,341,039 |
| අඩු කළා: සමුච්චිත ක්ෂයකිරීම් | (199,845,654) | (2,905,218) | - | - | (202,750,872) |
| | **642,138,177** | **65,451,990** | **-** | **-** | **707,590,167** |
| කෙරීගෙන යන වැඩ | 689,226 | 999,600 | | | 1,688,826 |
| සීමා පවුර සහ ජලාපවහන පද්ධතිය | 690,552 | - | - | | 690,552 |
| කාර්ය මණ්ඩල ණයගැතියන්(වසර 1කට වැඩි කාලයක් තුළ අයකරගත හැකි කාල සීමාව) | 20,604,320 | - | - | - | 20,604,320 |
| බීසීසී ආයතනයට ලබා දුන් ණය | - | 31,550,000 | 26,715,037 | - | 58,265,037 |
| බීසීසී ආයතනයෙන් ලැබිය යුතු ණය පොලිය | - | - | 60,174,135 | - | 60,174,135 |
| සැක සහිත ණයකරුවන් සඳහා ප්‍රතිපාදන( ණය පොලිය ) | - | - | (60,174,135) | - | (60,174,135) |
| කප්රුක නිපයුම් දිරිය වෙත ලබා දුන් ණය/ජය ඉසිර ණය අරමුදල | - | - | 705,000 | 155,076,634 | 155,781,634 |
| | **21,984,099** | **32,549,600** | **27,420,038** | **155,076,634** | **237,030,370** |
| **ජංගම වත්කම්** | | | | | - |
| **ඉන්වෙන්ටරි / තොග** | | | | | - |
| තොග | 22,219,934 | - | - | - | 22,219,934 |
| **වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දේ** | - | - | - | - | - |
| සුභසාධන ණය අරමුදල | 2,007,438 | - | - | - | 2,007,438 |
| විවිධ ණයගැතියන් | 39,787,628 | 8,031,281 | 36,180,915 | **4,133,488** | **88,133,311** |
| කාර්ය මණ්ඩල ණයගැතියන්(වසර 1කට අඩු කාලයක් තුළ අයකරගත හැකි) | 5,816,636 | - | - | - | 5,816,636 |
| විවිධ අත්තිකාරම් | 720,970 | - | - | - | 720,970 |
| විවිධ තැන්පත් | 1,150,613 | 360,000 | - | - | 1,510,613 |
| **ආයෝජන දේපල (මාස 3 ක කාලය)** | | | | | - |
| භාණ්ඩාගාර බිල්පත් | - | - | 22,595,873 | | 22,595,873 |
| බැංකු තැන්පතු | 285,790,902 | - | 250,000,000 | 120,288,540 | 656,079,442 |
| | **335,274,186** | **8,391,281** | **308,776,788** | **124,422,028** | **776,864,283** |
| **පෙරගෙවීම්** | **3,139,392** | **-** | **-** | **-** | **3,139,392** |
| **මුදල් සහ මුදල් සමාන දෑ** | | | | | - |
| **Iආයෝජන දේපල ( මාස 3ක කාලය)** | | | | | - |
| භාණ්ඩාගාර බිල්පත් | 3,472,558 | | | | 3,472,558 |
| බැංකු තැන්පතු | 109,944,149 | 55,416,883 | 23,237,376 | | 188,598,408 |
| මුද්දර තැබීමේ යන්ත්‍රය | 4,378 | | - | - | 4,378 |
| බැංකුවේ ඇති මුදල් | 23,034,213 | 1,193,925 | 15,746,951 | - | 39,975,089 |
| සුළු මුදල් | 40,550 | - | - | - | 40,550 |
| | **136,455,298** | **56,610,808** | **38,984,327** | **-** | **232,050,433** |
| අන්තර් ජංගම ගිණුම (ප්‍රාග්ධන සංවර්ධන අරමුදල/පීබිඔ) | 172,936,681 | 4,070,000 | 5,793,795 | 1,951,411 | 184,751,887 |
| **මුළු ජංගම වත්කම්** | 670,066,040 | 69,072,088 | 353,554,910 | 126,373,440 | 1,219,066,479 |
| | **1,334,188,316** | **167,073,678** | **380,974,948** | **281,450,073** | **2,163,687,016** |
| **ජංගම නොවන වගකීම්** | | | | | - |
| පාරිතෝෂිත දීමනා සඳහා ප්‍රතිපාදන ගෙවීම් | (46,071,296) | - | - | - | (46,071,296) |
| | | | | | - |
| **ජංගම වගකීම්** | | | | | - |
| **ගෙවිය යුතු දෑ** | | | | | - |
| විවිධ ණයහිමියන් | (4,345,785) | (334,810) | - | - | (4,680,595) |
| ආපසු ගෙවිය හැකි තැන්පතු | (1,171,870) | | - | - | (1,171,870) |
| අත්තිකාරම් ලැබීම් | (10,340,171) | | - | - | (10,340,171) |
| උපචිත වියදම් | (14,113,436) | (2,780,250) | - | - | (16,893,686) |
| අන්තර් ජංගම ගිණුම | (2,792,803) | (6,715,330) | (4,070,000) | (171,173,754) | (184,751,887) |
| **මුළු ජංගම වගකීම්** | **(32,764,065)** | **(9,830,390)** | **(4,070,000)** | **(171,173,754)** | **(217,838,209)** |
| | **1,255,352,955** | **157,243,288** | **376,904,948** | **110,276,319** | **1,899,777,510** |
| **අරමුදල් සපයනු ලබන්නේ** | | | | | - |
| ඉඩම් සඳහා ප්‍රත්‍යාගණන සංචිතය | 337,955,830 | 53,777,500 | - | - | 391,733,330 |
| ගොඩනැගිලි සඳහා ප්‍රත්‍යාගණන සංචිතය | 169,048,375 | - | - | - | 169,048,375 |
| මෝටර් වාහන සඳහා ප්‍රත්‍යාගණන සංචිතය | 144,184,980 | - | - | - | 144,184,980 |
| ප්‍රදාන සහ දායක මුදල් | 88,943,221 | - | - | - | 88,943,221 |
| ප්‍රාග්ධන සංවර්ධන පදනමින් ලැබුනු ප්‍රදාන | 77,652,767 | - | - | - | 77,652,767 |
| සමුච්චිත අරමුදල / අතිරික්තය | 437,567,782 | 103,465,788 | 376,904,947 | 110,276,319 | 1,028,214,837 |
| | **1,255,352,955** | **157,243,288** | **376,904,947** | **110,276,319** | **1,899,777,510** |

## පොල් සංවර්ධන අධිකාරිය

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (අරමුදල් අනුව විශ්ලේෂණය කරන ලදී)

| වසර | | 2023 | | | | |
|---|---|---|---|---|---|---|
| | සටහන් අංකය | පුනරාවර්තන රු. | ප්‍රාග්ධන සංවර්ධන අරමුදල රු. | පී.එස්.එස්.ඔයිල් අරමුදල රු. | මොල් සංවර්ධන අරමුදල රු. | එකතුව රු. |
| **ජංගම නොවන වත්කම්** | | | | | | |
| **දේපළ, පිරියත හා උපකරණ** | **1** | 499,725,798 | 72,152,768 | - | - | 571,878,566 |
| අඩු කළා: සමුච්චිත ක්ෂයකිරීම් | | (221,638,414) | (1,924,019) | - | - | (223,562,434) |
| | | **278,087,383** | **70,228,749** | **-** | **-** | **348,316,132** |
| කෙරීගෙන යන වැඩ | | 5,478,309 | **999,600** | | | 6,477,909 |
| සීමා පවුර සහ ජලාපවහන පද්ධතිය | | 252,860 | **-** | **-** | | 252,860 |
| කාර්ය මණ්ඩල ණයගැතියන්( වසර 1 කට වැඩි කාලයක් තුළ අයකරගත හැකි ) | **2** | 22,726,851 | - | - | **-** | 22,726,851 |
| බීසීසී ආයතනයට ලබා දුන් ණය | | - | - | - | **-** | - |
| බීසීසී ආයතනයෙන් ලැබිය යුතු ණය පොලිය | | - | - | - | **-** | - |
| සැක සහිත ණයකරුවන් සඳහා ප්‍රතිපාදන( ණය පොලිය ) | | - | - | - | **-** | - |
| කප්රුක නිපයුම් දිරිය වෙත ලබා දුන් ණය/ ජය ඉසිර ණය අරමුදල | **3** | - | - | 110,000 | 213,365,980 | 213,475,980 |
| **-** | | **28,458,021** | **999,600** | **110,000** | **213,365,980** | **242,933,601** |
| **ජංගම වත්කම්** | | | | | | |
| **ඉන්වෙන්ටරි** | | | | | | |
| තොග | **4** | **25,252,914** | - | - | - | **25,252,914** |
| **වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දේ** | | - | - | - | - | - |
| සුභසාධන ණය අරමුදල | | 1,700,000 | - | - | - | 1,700,000 |
| විවිධ ණයගැතියන් | **5** | 24,129,049 | 7,404,488 | 24,779,893 | 1,991,531 | 58,304,960 |
| කාර්ය මණ්ඩල ණයගැතියන්( වසර 1 කට අඩු කාලයක් තුළ අයකරගත හැකි) | **2** | 6,112,026 | - | - | - | 6,112,026 |
| විවිධ අත්තිකාරම් | | 641,350 | - | - | - | 641,350 |
| විවිධ තැන්පත් | **6** | 1,151,157 | 360,000 | - | - | 1,511,157 |
| **ආයෝජන දේපල (මාස 3 ක කාලය)** | | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් | **7** | - | - | 15,799,451 | | 15,799,451 |
| බැංකු තැන්පතු | **8** | 344,586,098 | - | 306,382,500 | 32,890,680 | 683,859,278 |
| **-** | | **378,319,680** | **7,764,488** | **346,961,843** | **34,882,211** | **767,928,222** |
| **පෙරගෙවීම්** | **9** | **5,417,315** | **-** | **-** | **-** | **5,417,315** |
| **මුදල් සහ මුදල් සමාන දෑ** | | | | | | - |
| **lආයෝජන දේපල ( මාස 3ක කාලය)** | | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් | **7** | - | - | 886,459 | | 886,459 |
| බැංකු තැන්පතු | **8** | 127,391,502 | 65,864,559 | | 71,020,831 | 264,276,891 |
| මුද්දර තැබීමේ යන්ත්‍රය | | 33,967 | - | - | - | 33,967 |
| බැංකුවේ ඇති මුදල් | **10** | 148,178,785 | 505,376 | 4,500,922 | 18,474,195 | 171,659,278 |
| සුළු මුදල් | **11** | 30,000 | - | - | - | 30,000 |
| | | **275,634,254** | **66,369,934** | **5,387,381** | **89,495,026** | **436,886,595** |
| අන්තර් ජංගම ගිණුම (ප්‍රාග්ධන සංවර්ධන අරමුදල/ජීබිඹ) | **12** | 202,139,543 | 4,070,000 | 54,014,054 | 713,932 | 260,937,529 |
| **මුළු ජංගම වත්කම්** | | 886,763,705 | 78,204,422 | 406,363,278 | 125,091,169 | 1,496,422,575 |
| | | **1,193,309,109** | **149,432,771** | **406,473,278** | **338,457,150** | **2,087,672,308** |
| **ජංගම නොවන වගකීම්** | | | | | | |
| පාරිතෝෂිත දීමනා සඳහා ප්‍රතිපාදන ගෙවීම් | **සටහ- 29** | (50,957,084) | - | - | - | (50,957,084) |
| | | | | | | - |
| **ජංගම වගකීම්** | | | | | | - |
| **ගෙවිය යුතු දෑ** | | | | | | - |
| විවිධ ණයහිමියන් | **13** | (11,839,942) | (1,642,149) | - | - | (13,482,091) |
| විවිධ තැන්පත් | **14** | (1,702,096) | | - | - | (1,702,096) |
| අත්තිකාරම් ලැබීම් | **15** | (10,373,827) | | - | - | (10,373,827) |
| උපචිත වියදම් | **16** | (18,077,806) | (818,280) | - | - | (18,896,085) |
| අන්තර් ජංගම ගිණුම | | **-** | (41,218,313) | (4,070,000) | (215,649,241) | (260,937,554) |
| **මුළු ජංගම වගකීම්** | | **(41,993,670)** | **(43,678,742)** | **(4,070,000)** | **(215,649,241)** | (305,391,653) |
| | | **1,100,358,354** | **105,754,031** | **402,403,278** | **122,807,908** | **1,731,323,571** |
| **අරමුදල් සපයනු ලබන්නේ** | | | | | | |
| ඉඩම් සඳහා ප්‍රත්‍යාගණන සංචිතය | | - | 17,727,100 | - | - | 17,727,100 |
| ගොඩනැගිලි සඳහා ප්‍රත්‍යාගණන සංචිතය | | 169,048,375 | 41,566,356 | - | - | 210,614,731 |
| මෝටර් වාහන සඳහා ප්‍රත්‍යාගණන සංචිතය | | 144,184,980 | - | - | - | 144,184,980 |
| ප්‍රදාන සහ දායක මුදල් | | 88,943,221 | - | - | - | 88,943,221 |
| ප්‍රාග්ධන සංවර්ධන පදනමින් ලැබුනු ප්‍රදාන | | 77,652,767 | - | - | - | 77,652,767 |
| සමුච්චිත අරමුදල / අතිරික්තය | **17** | 620,529,010 | 46,460,575 | 402,403,278 | 122,807,908 | 1,192,200,772 |
| | | **1,100,358,354** | **105,754,031** | **402,403,278** | **122,807,908** | **1,731,323,571** |

ගිණුම්කරණ ප්‍රතිපත්ති (10-15 පිටු) සහ සටහන් (16-34 පිටු), මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. මූල්‍ය ප්‍රකාශන 2024.02.28 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

............................................................ ............................................................

**එම්.පී.සන්ද්‍යා කාන්ති**
**අධ්‍යක්ෂ මුදල්**

**අචාර්ය සී.එම්.පී.පී.රොෂාන් ප්‍රියංකර පෙරේරා**
**සභාපති**

................................................. .................................................

**ජනක ප්‍රේමරත්න**
**අධ්‍යක්ෂ ජනරාල්**

**එන්.එස්.වනසිංහ**
**අධ්‍යක්ෂක**

-

## පොල් සංවර්ධන අධිකාරිය

## ඒකාබද්ධ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය (සාරාංශගත)

| 2022(තථ්‍ය) | | 2023(අයවැයගත) | 2023(තථ්‍ය) |
|---|---|---|---|
| රු. | | | රු. |
| | **ප්‍රදාන** | | |
| 142,000,000 | රාජ්‍ය ප්‍රදාන (පුනරාවර්තන) | 159,400,000 | 92,000,000 |
| 17,500,000 | ජීවනොපාය වැඩසටහන/ප්‍රාග්ධන ප්‍රදාන | - | - |
| 59,500,000 | ප්‍රාග්ධන සංවර්ධන කටයුතු සඳහා අභ්‍යන්තර අරමුදල් හුවමාරුව | - | - |
| **219,000,000** | | **159,400,000** | **92,000,000** |
| | **මෙහෙයුම් කටයුතුවලින් ලැබෙන ආදායම** | | |
| | ලියාපදිංචි ගාස්තු - අලෙවි අංශය | | 24,229,452 |
| 28,613,496 | ලියාපදිංචි ගාස්තු - සැකසුම් අංශය | 20,000,000 | 10,945,777 |
| | ලියාපදිංචි ගාස්තු - පාලන අංශය | | 464,227 |
| 21,835,668 | රසායනාගාර ආදායම් | 17,500,000 | 57,100,886 |
| 42,518,032 | පරීක්ෂණ සහ සැකසුම් ගාස්තු - පොල් | 125,000,000 | 139,609,500 |
| 68,763,267 | පරීක්ෂණ සහ සැකසුම් ගාස්තු - තැඹිලි | | 128,571,217 |
| 5,114,626 | බහාලුම් පරීක්ෂණ ගාස්තු | | 3,486,423 |
| 1,742,121 | විවිධ ආදායම් | 1,800,000 | 9,362,627 |
| 6,129,330 | වෙන්දේසි ක්‍රියාවලිය | 6,000,000 | 1,117,741 |
| 905,455 | දුන්කන්නාව පොල් වත්ත සහ ආදර්ශ මෝල | | 2,558,001 |
| **147,008,499** | | **170,300,000** | **377,445,849** |
| | **වෙනත් කටයුතුවලින් ලැබෙන ආදායම** | | |
| - | අබලි ද්‍රව්‍ය විකිණීමs/ යන්ත්‍ර උපකරණ | | 169,545 |
| 109,941,287 | පොලී ආදායම | 40,000,000 | 147,502,962 |
| 4,011,609 | පොළිය - B.C.C. ණය | | - |
| 232,320 | කුලී ආදායම | | 232,320 |
| **114,185,216** | **මුළු වෙනත් ආදායම්** | **40,000,000** | **147,904,827** |
| **508,807,211** | **මුළු ආදායම්** | **369,700,000** | **617,350,676** |
| | **වියදම්** | | |
| (254,119,521) | මෙහෙයුම් වියදම් | (193,635,000) | (298,775,600) |
| - | රඳවාගැනීමේ බද්ද | (7,160,000) | (21,904) |
| (60,488) | මූල්‍ය වියදම් | (53,200,000) | (63,656) |
| (83,685) | අබලි ද්‍රව්‍ය / යන්ත්‍රෝපකරණ විකිණීම | (16,900,000) | - |
| (83,685) | | (55,510,000) | - |
| **(227,858)** | | **(326,405,000)** | **(298,861,160)** |
| | **ප්‍රාග්ධන සංවර්ධන වියදම්** | | |
| (20,930,621) | සැකසුම් සහ සංවර්ධන අංශය | (74,600,000) | (9,117,257) |
| (10,280,152) | අලෙවිකරණ පර්යේෂණ සහ සංවර්ධන අංශය | (34,000,000) | (20,208,549) |
| (5,585,168) | තත්ත්ව පාලන සහ තත්ත්ව සහතික කිරීමේ අංශය | (5,000,000) | (5,341,852) |
| (36,795,942) | | (113,600,000) | (34,667,658) |
| (17,475,560) | **ජීවනෝපාය වියදම්** | - | - |
| **(271,822,940)** | | **(440,005,000)** | **(333,528,818)** |
| 144,158,071 | මෙහෙයුම් ලාභය | | **283,821,858** |
| (37,879,178) | වසර සඳහා ක්ෂයවීම | | (42,067,852) |
| (437,692) | සීමා පවුරේ ඉදිකිරීම් පිරිවැය, ජලාපවහන පද්ධතියේ අලුත්වැඩියා පිරිවැය සහ තාවකාලික ඉදිකිරීම් කපා හැරීම | | (1,807,269) |
| (3,177,596) | විධිවිධාන යටතේ - පාරිතෝෂික | | (10,893,378) |
| - | මහ භාණ්ඩාගාරයට අරමුදල් මාරු කිරීම | | (58,265,037) |
| **98,651,996** | | | **170,788,322** |
| | | | |

පිටු 10-15 හි ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 16-34 හි සටහන්, මූල්‍ය ප්‍රකාශනයේ අනිවාර්ය අංගයකි. අධ්‍යක්ෂ මණ්ඩලය. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීම දරයි. මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. 2024.02.28 දින සහ ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

............................................... ...............................................

**එම්.පී.සන්ද්‍යා කාන්ති**
**අධ්‍යක්ෂ මුදල්**

**අචාර්ය සී.එම්.පී.පී.රොෂාන් ප්‍රියංකර පෙරේරා**
**සභාපති**

............................................... ...............................................

**ජනක ප්‍රේමරත්න**
**අධ්‍යක්ෂ ජනරාල්**
**28/02/2024**

**එන්.එස්.වනසිංහ**
**අධ්‍යක්ෂක**

**පොල් සංවර්ධන අධිකාරිය**

| | මදය නොවන අගය එකතු කළ නිෂ්පාදන | 4,775,000 | |
| | මදය නොවන අගය එකතු කළ නිෂ්පාදන | 1,190,000 | |
| | මදය නොවන නිෂ්පාදන | 115,784 | |
| | වෙනත් පොල් නිෂ්පාදන | 71,500 | |
| | සැකසුම් නොකළ පොල් ගෙඩි | 1,740,000 | |
| | තැඹිලි | 2,957,680 | |
| | වෙළෙඳුන් ලියාපදිංචි කිරීම | 97,500 | |
| | වතු ලියාපදිංචිය | 72,225 | |
| | තැරැව්කරුවන් ලියාපදිංචි කිරීම | 34,590 | |
| | වෙනත් | 483 | |
| | ගාස්තු නිකුත් කිරීම සඳහා විරෝධතා නොදක්වන බවට ලිපි | 1,684,040 | **24,229,452** |
| | | | |
| 2 | **ලියාපදිංචි ගාස්තුව - සැකසුම් අංශය** | | |
| | දිසිදි පොල් | 1,509,300 | |
| | නැවුම් පොල්තෙල් | 1,136,051 | |
| | පොල්තෙල් | 915,736 | |
| | කුරුටු පොල්තෙල් | 202,500 | |
| | කාර්මික පොල්තෙල් | 10,000 | |
| | සුදු පොල්තෙල් | 532,670 | |
| | කොප්පරා මෝල්කරු | 22,000 | |
| | පිරිපහදු කළ විරංජනය කළ දුර්ගන්ධීකරණය කරන ලද පොල්තෙල් | 272,400 | |
| | පොල්කිරි | 395,000 | |
| | පොල්කිරි පිටි | 320,000 | |
| | පොල්කිරි සකසනය | 57,500 | |
| | පොල් විනාකිරි | 16,719 | |
| | පොල් ක්‍රීම් | 327,500 | |
| | පොල්කිරි ආශ්‍රිත නිෂ්පාදනය | 190,000 | |
| | පොල් බටර් | 157,500 | |
| | පොල් තැවරුම | 87,500 | |
| | පොල් ඇමිනෝ | 108,000 | |
| | පොල් පිටි | 294,000 | |
| | පොල් ක්‍රීම් | 265,000 | |
| | පොල් සීනි | 140,000 | |
| | පොල් සිරප් | 35,000 | |
| | පොල් මද කැබලි | 105,000 | |
| | ශීත කළ ගාන ලද පොල් | 70,000 | |
| | පොල් මෘදු ජෙල් | 6,000 | |
| | පොල් පැණි | 24,000 | |
| | දිසිදි පොල් නැවත ඇසුරුම්කරණය | 239,700 | |
| | පොල්තෙල් නැවත ඇසුරුම්කරණය | 17,500 | |
| | පොල් වතුර | 495,000 | |
| | තැඹිලි වතුර | 100,000 | |
| | කොහු මෝල් | 259,951 | |
| | කොහුබත් උපස්ථරය | 1,370,650 | |
| | පොල් කොහු | 111,500 | |

**2023.12.31 දිනෙන් අවසන් වූ වසර සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට සටහන්**

| | | | |
|---|---|---|---|
| | කපන ලද කෙඳි | 100,000 | |
| | සක්‍රීය කාබන් | 180,000 | |
| | කටු අඟුරු | 101,100 | |
| | කටු අඟුරු බ්‍රිකට්ස් | 45,000 | |
| | කටු කැබලි සහ කුඩු | 17,000 | |
| | විසිතුරු භාණ්ඩ | 24,000 | |
| | ඉදල් සහ ඉරටු | 92,000 | |
| | කොහු ලණු / කොහු නූල් | 246,000 | |
| | පොල් රා | 10,500 | |
| | MCT පොල් තෙල් | 60,000 | |
| | MCT තෙල් කුඩු | 85,000 | |
| | පොල් ආශ්‍රිත මධ්‍යසාර | 80,000 | |
| | කටු අඟුරු කැබලි | 9,000 | |
| | පොල් ලෙලි | 52,500 | |
| | පොල් සම්බෝල | 10,000 | |
| | පොල් චිප්ස් | 20,000 | |
| | පොල් ක්‍රීම් | 20,000 | **10,945,777** |
| | | | |
| **3** | **රසායනාගාර ආදායම්** | | |
| | DC සාම්පල ලබා ගැනීමේ සහ පරීක්ෂණ ගාස්තු | 29,184,004 | |
| | PDDC සාම්පල පරීක්ෂණ ගාස්තු | 1,183,010 | |
| | DC නැවත ඇසුරුම් කිරීමේ සාම්පල පරීක්ෂණ ගාස්තු | 853,972 | |
| | තත්ත්ව සහතික පරීක්ෂණ ගාස්තු | 2,517,125 | |
| | ජල සාම්පල පරීක්ෂණ ගාස්තු | 1,547,120 | |
| | කොහු කෙඳි පරීක්ෂණ ගාස්තු | 3,842,658 | |
| | පොල්තෙල් පරීක්ෂණ ගාස්තු | 5,984,250 | |
| | පොල් කිරි පරීක්ෂණ ගාස්තුව | 1,217,861 | |
| | පොල් කටු අඟුරු පරීක්ෂණ ගාස්තුව | 16,582 | |
| | පුන්නක්කු සාම්පල පරීක්ෂණ ගාස්තුව | 34,755 | |
| | R.B.D. පොල්තෙල් පරීක්ෂණ ගාස්තුව | 3,712,400 | |
| | සුදු පොල්තෙල් පරීක්ෂණ ගාස්තුව | 25,155 | |
| | උපස්ථර සාම්පල පරීක්ෂණ ගාස්තුව | 2,439,898 | |
| | VCO පරීක්ෂණ ගාස්තුව | 649,910 | |
| | WCO පරීක්ෂණ ගාස්තු | 185,000 | |
| | කොප්පරා සාම්පල පරීක්ෂණ ගාස්තු | 27,650 | |
| | පොල් කිරිපිටි පරීක්ෂණ ගාස්තු | 235,992 | |
| | හදිසි ගාස්තු | 1,414,303 | |
| | පොල් ක්‍රීම් පරීක්ෂණ ගාස්තු | 717,765 | |
| | ආපසු එවන ලද තොග පරීක්ෂණ ගාස්තු | 867,523 | |
| | පොල් ලෙලි සාම්පල පරීක්ෂණ ගාස්තු | 182,850 | |
| | තැඹිලි වතුර පරීක්ෂණ ගාස්තු | 176,150 | |
| | පොල් සීනි පරීක්ෂණ ගාස්තු | 44,750 | |
| | වගා බෑග් පරීක්ෂණ ගාස්තු | 37,650 | |
| | සක්‍රිය කාබන් පරීක්ෂණ ගාස්තු | 2,555 | 57,100,886 |
| | | | |
| **4** | **විවිධ ආදායම්** | | |
| | | | |
| | නිවේදන පත්‍රිකා විකිණීම | 58,490 | |
| | ප්‍රදර්ශන කුටි ගාස්තු | 110,191 | |
| | විවිධ ආදායම | 643,007 | |
| | ලේබල් පොත් සහ ස්ටිකර් ගාස්තු | 8,550,939 | **9,362,627** |

**2023.12.31 දිනෙන් අවසන් වූ වසර සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට සටහන්**

| | | | |
|---|---|---|---|
| 5 | **වෙන්දේසි ක්‍රියාවලිය** | | |
| | තොග ගාස්තු ආදායම - කොප්පරා සහ ගෙඩි පොල් | | 1,443,498 |
| | අඩු කළා: වෙන්දේසි ගාස්තුව | 163,533 | |
| | සන්නිවේදන වියදම් | 31,279 | |
| | වෙනත් | 130,945 | (325,757) |
| | | | **1,117,741** |
| | | | |
| 6 | **දූන්කන්නාව පොල් වත්ත** | | |
| | පොල්, කෙඳි සහ පැළ විකිණීම | | 6,136,593 |
| | අඩු කළා: වියදම් | | |
| | වැටුප් සහ වේතන | (445,977) | |
| | සේ.අ.අ. සහ සේ.භා.අ. | (628,410) | |
| | පොහොර | (824,063) | |
| | විදුලිය | (244,544) | |
| | රක්ෂණ | (4,013) | |
| | දුරකථන ගාස්තු | (673) | |
| | අලුත්වැඩියාව, නඩත්තුව සහ අනෙකුත් | (1,150,914) | |
| | ඇඳගෙන යෑමේ වියදම් | (280,000) | **(3,578,593)** |
| | | | **2,558,001** |
| | | | |
| 7 | **පොලී ආදායම** | | |
| | පුනරාවර්තන | | |
| | සේවක ණය මත පොලී | 1,252,635 | |
| | ආයෝජන මත පොලී (භාණ්ඩාගාර බිල්පත්) | 675,685 | |
| | ආයෝජන මත පොලී - ඉතිරිකිරීමේ ගිණුම් | 643,992 | |
| | ස්ථාවර ගිණුම් මත පොලී | 67,548,099 | **70,120,411** |
| | | | |
| | ප්‍රාග්ධන සංවර්ධන අරමුදල | රු. | රු. |
| | ස්ථාවර ගිණුම් මත පොලී | 9,820,883 | |
| | | | **9,820,883** |
| | P.S.S.තෙල් අරමුදල | රු. | රු. |
| | භාණ්ඩාගාර බිල්පත් මත පොලී | 4,650,749 | |
| | **බැංකු ණය මත පොලී** | 12,153 | |
| | ස්ථාවර ගිණුම් මත පොලී | 47,403,649 | |
| | ඉතිරිකිරීමේ ගිණුම් මත පොලී | 153,955 | |
| | | | **52,220,506** |
| | එම්ඩීඑෆ් අරමුදල | | |
| | ස්ථාවර ගිණුම් මත පොලී | 9,176,898 | |
| | **බැංකු ණය මත පොලී** | 5,856,422 | |
| | ඉතිරිකිරීමේ ගිණුම් මත පොලී | 307,842 | |
| | | | **15,341,162** |
| | | | **132,161,800** |

## මෙහෙයුම් වියදම්

රු.

| 2,022 | 2,023 | DESCRIPTION | උප එකතුව | 2023 |
|---|---|---|---|---|
| තථ්‍ය | ඇස්තමේන්තුගත | | | මුළු |
| | | **පුද්ගලික පාරිශ්‍රමික** | | රු. |
| 92,421,713 | 110,000,000 | වැටුප් සහ වේතන | 94,886,713 | |
| 18,388,844 | 20,000,000 | ජීවන වියදම් සහ අනෙකුත් දීමනා | 17,141,129 | |
| 44,656 | 375,000 | නිවාඩු දින ගෙවීම් | 413,157 | |
| 10,768,575 | 12,000,000 | මාසික දීමනාව | 10,975,522 | |
| 139,320 | | ආවරණ රාජකාරි දීමනාව | - | |
| 16,410,904 | 19,500,000 | සේ.අ.අ. | 16,855,339 | |
| 3,191,225 | 3,900,000 | සේ.භා.අ. | 3,196,720 | |
| 1,369,000 | 2,600,000 | වෘත්තීය දීමනාව | 1,038,000 | |
| 4,413,403 | 6,700,000 | ඉන්ධන හා වාහන දීමනාව | 2,991,311 | |
| 66,780 | | භාෂා / අකුරු දීමනාව | 688,414 | |
| 963,292 | | දුරකථන දීමනාව | 1,111,979 | |
| 8,601,170 | 8,460,000 | අතිකාල | 9,713,614 | |
| 3,773,815 | 6,500,000 | සුභසාධන වියදම් | 6,037,260 | |
| 354,163 | **1,800,000** | පුහුණුවීම් හා සම්මන්ත්‍රණ | 906,111 | |
| 7,169,601 | 8,460,000 | වෛද්‍ය රක්ෂණය | 7,236,452 | |
| - | | නව පත්වීම් වියදම් | - | |
| 149,758 | 140,000 | සාමාජික දායකත්වය | 4,500 | **173,196,222.03** |
| | | | | |
| | | **ප්‍රවාහන වියදම්** | | |
| 4,456,783 | 6,600,000 | ප්‍රවාහන වියදම් (දේශීය) | 10,496,096 | |
| 336,000 | 560,000 | වාහන නැවැත්වීමේ වියදම් | 542,850 | **11,038,946** |
| | | | | |
| | | **සැපයුම් හා අවශ්‍යතා** | | |
| 15,440,528 | 11,650,000 | ලිපි ද්‍රව්‍ය සහ අනෙකුත් අවශ්‍යතා | 12,734,712 | |
| 7,333,306 | 9,500,000 | ඉන්ධන සහ ලිහිසි තෙල් | 10,281,172 | |
| 664,654 | 750,000 | නිල ඇඳුම් | 939,635 | |
| 9,517,414 | 29,900,000 | රසායනාගාර රසායනික ද්‍රව්‍ය අනෙකුත් පාරිභෝගික | 26,201,542 | |
| 708,370 | 1,400,000 | අනෙකුත් අවශ්‍යතා | 1,203,171 | **51,360,232** |
| | | | | |
| | | **අලුත්වැඩියා කිරීම් සහ නඩත්තුව** | | |
| 8,229,080 | 9,400,000 | වාහන | 15,538,074 | |
| 2,701,549 | 2,800,000 | යන්ත්‍රෝපකරණ කාර්යාල උපකරණ සහ ගෘහ භාණ්ඩ | 5,692,174 | |
| 6,972,505 | 4,700,000 | ව්‍යුහයන් / ගොඩනැගිලි | 6,250,248 | **27,480,497** |
| | | | | |
| | | | | |
| | | **ප්‍රවාහනය, සන්නිවේදනය, උපයෝගිතා සහ අනෙකුත් සේවා** | | |
| 4,056,362 | 4,700,000 | ප්‍රවාහනය | 3,982,150 | |
| 479,900 | | තැපැල් ගාස්තු සහ මුද්දර ගාස්තු | 420,411 | |
| 2,193,291 | 2,800,000 | සන්නිවේදනය | 2,414,496 | |
| 6,121,401 | 13,100,000 | විදුලිය | 11,745,786 | |
| 907,563 | 2,800,000 | ජලය | 1,248,960 | |
| 1,971,621 | | කල්බදු කුලී | | |
| 776,172 | 4,220,000 | රක්ෂණ -වාහන, ගිනි, පුද්ගලික අනතුරු | 1,741,553 | |
| 3,719,305 | 4,700,000 | ආරක්ෂක සේවා | 3,243,941 | |
| 4,363,284 | 4,700,000 | පිරිසිදු කිරීමේ සේවා | 3,580,764 | |
| 149,520 | 1,600,000 | නීති ගාස්තු | 63,700 | |
| 545,400 | 940,000 | විගණන ගාස්තු | 600,000 | |
| 1,315,273 | 1,900,000 | සහරා සඳහා වෙළඳ දැන්වීම්/ දායක ගාස්තු | 2,261,021 | |
| 504,046 | | අධ්‍යක්ෂක මණ්ඩල හා ක හා වි කමිටු රැස්වීම් වියදම් | 62,000 | **31,364,781** |
| | | | - | |
| | | **බදු සහ අනෙකුත් බදු** | | |
| 3,508 | - | මුද්දර ගාස්තු | 16,550 | |
| 1,372,777 | 1,900,000 | වරිපනම් සහ බදු | 1,559,380 | **1,575,930** |
| | | | | |
| - | | **වෙනත් වියදම්** | | |
| 127,200 | 450,000 | සභාපති සංග්‍රහ වියදම් හා අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් / වි.ක කමිටු රැස්වීම් වියදම් | 999,543 | |
| 476,000 | 1,750,000 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික දීමනාව | 688,096 | |
| 150,000 | 600,000 | විගණන සහ කළමනාකරණ රැස්වීම් දීමනාව සහ ප්‍රවාහන දීමනාව | 104,000 | |
| 212,825 | | පරිවර්තන වියදම් | | |
| | 450,000 | පුවත්පත් වියදම් | 516,860 | |
| 30,750 | 50,000 | වෙනත් වියදම් | 348,653 | |
| **28,678** | 500,000 | ප්‍රාදේශීය කාර්යාල වියදම් | 101,842 | **2,758,993** |
| 28,240 | | හම්බන්තොට ව්‍යාපෘති වියදම් | - | |
| **254,119,521** | **324,855,000** | **මුළු වියදම** | | **298,775,600** |

පොල් සංවර්ධන අධිකාරිය
මෝල් ඉතිරිකිරීමේ ගිණුම - 2023

| මෝල් අංක | ගිණුම් අංක | මෝලේ නම | 2023.01.01 දිනට ශේෂය | තැන්පතු - නොවැම්බර් 21 | තැන්පතු - දෙසැම්බර් 21 | පොළී 2023 (ජනවාරි - ජූනි) | මුදල් ආපසු ගැනීම | 2023 සඳහා බදු | 2023.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|
| M 62 | 1-0065-30-0926-2 | ඩෙසිකෝ ලංකා (පුද්.) සමාගම | 392,996.80 | 7,744.84 | 5,264.22 | 10,974.39 | | 548.72 | 416,431.53 |
| M 63 | 1-0065-30-0928-9 | හලාවත ඩී.සී. සහ ඔයිල් මෝල් | 1,045,480.65 | 380.00 | 0.00 | 29,034.69 | | 1,451.73 | 1,073,443.61 |
| M 64 | 1-0065-30-0929-7 | රත්කරව්ව ඩී.සී. සහ ඔයිල් මෝල් | 640,613.89 | 8,981.20 | 12,390.00 | 17,888.75 | | 894.43 | 678,979.41 |
| M 67 | 1-0065-30-0932-7 | මාරවිල පොල් නිෂ්පාදකයින් සමුපකාර සමිතිය ලිමිටඩ්. | 163,203.56 | 22,105.00 | 20,867.00 | 4,733.64 | | 236.68 | 210,672.52 |
| M 69 | 1-0065-30-0933-5 | බඳුවත්ත මෝල් (පුද්.) සමාගම | 1,021,804.42 | 11,917.02 | 13,922.87 | 28,495.41 | | 1,424.79 | 1,074,714.93 |
| M 71 | 1-0065-31-8518-4 | මාදම්පේ මෝල් | 666,658.77 | 0.00 | 0.00 | 18,512.97 | | 925.65 | 684,246.09 |
| M 72 | 1-0065-30-0935-1 | ශාන්ත ජෝසප් ඩී.සී. මැනුෆැක්චර්ස් (පුද්.) සමාගම | 368,897.41 | 13,713.40 | 11,138.63 | 10,360.42 | | 518.02 | 403,591.84 |
| M 75 | 1-0065-30-0936-0 | සිරියංගනී ඩී.සී. සහ ෆයිබර් මෝල් | 785,149.75 | 15,305.40 | 13,869.72 | 21,939.68 | | 1,096.97 | 835,167.58 |
| M 76 | 1-0065-30-0937-8 | එස්.ඒ. සිල්වා ඇන්ඩ් සන්ස් ලංකා (පුද්.) සමාගම | 2,819,788.49 | 21,362.28 | 42,672.44 | 78,600.14 | | 3,930.02 | 2,958,493.33 |
| M 77 | 1-0065-30-0938-6 | ශාන්ත ආනා කර්මාන්තශාලාව | 425,347.58 | 8,660.00 | 2,010.00 | 11,862.89 | | 593.15 | 447,287.32 |
| M 79 | 1-0065-30-0939-4 | ෆාතිමා මෝල් ලිමිටඩ්. | 496,250.87 | 8,800.00 | 6,950.00 | 13,854.43 | | 692.73 | 525,162.57 |
| M 80 | 1-0065-30-0940-8 | දුනගහ පොල් නිෂ්පාදකයින් සමුපකාර සමිතිය ලිමිටඩ්. | 1,893,957.93 | 14,300.00 | 18,263.00 | 52,746.34 | | 2,637.32 | 1,976,629.95 |
| M 84 | 1-0065-30-2204-8 | සෝනික් එක්ස්පෝ (පුද්.) සමාගම (සොන්ලක් (පුද්.) සමාගම) | 1,250,342.98 | 16,116.39 | 13,807.27 | 34,861.79 | | 1,743.10 | 1,313,385.33 |
| M 85 | 1-0065-30-0941-6 | මොඩර්න් ෆුඩ් ෆැක්ටරි (වීවී ප්ලාන්ටේෂන්) | 489,678.97 | 0.00 | 1,300.00 | 13,603.99 | | 680.20 | 503,902.76 |
| M 86 | 1-0065-30-0942-4 | ජේ.පී.එම්. පින්ටෝ ඇන්ඩ් කම්පනි (පුද්.) සමාගම | 611,435.34 | 12,583.00 | 12,301.60 | 17,095.52 | | 854.78 | 652,560.68 |
| M 87 | 1-0065-30-0943-2 | ශාන්ත වැලන්ටයින් ඩී.සී. කර්මාන්තශාලාව | 732,824.60 | 4,455.00 | 4,585.00 | 20,392.65 | | 1,019.64 | 761,237.61 |
| M 88 | 1-0065-30-0945-9 | ශාන්ත ක්‍රිස්ටෝපර් ඩී.සී. මෝල් | 689,706.53 | 7,900.00 | 4,467.00 | 19,211.18 | | 960.57 | 720,324.14 |
| M 89 | 1-0065-30-0946-7 | කුඩාවැව මෝල් | 888,020.23 | 6,570.00 | 6,320.00 | 24,720.30 | | 1,236.02 | 924,394.51 |
| M 90 | 1-0065-30-0947-5 | නාදුන්ගමුව මෝල් | 1,393,136.41 | 2,230.00 | 4,240.00 | 26,950.42 | 1,368,136.41 | 1,347.54 | 57,072.88 |
| M 91 | 1-0065-30-0948-3 | සඳලංකා පොල් නිෂ්පාදකයින් සමුපකාර සමිතිය ලිමිටඩ්. | 1,038,237.67 | 10,805.40 | 15,195.40 | 28,952.30 | | 1,447.62 | 1,091,743.15 |
| M 93 | 1-0065-30-0949-1 | ග්‍රීන් පාම් ඩී.සී. මෝල් | 1,926,850.99 | | | 53,508.66 | | 2,675.44 | 1,977,684.21 |

| මෝල් අංක | ගිණුම් අංක | මෝලේ නම | 2023.01.01 දිනට ශේෂය | තැන්පතු - නොවැම්බර් 21 | තැන්පතු - දෙසැම්බර් 21 | පොලී 2023 (ජනවාරි - ජුනි) | මුදල් ආපසු ගැනීම | 2023 සඳහා බදු | 2023.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|
| M 94 | 1-0065-30-0950-5 | සිරිකත ඩී.සී. මෝල් | 618,524.24 | | | 17,176.27 | | 858.82 | 634,841.69 |
| M 95 | 1-0065-30-0951-3 | බෙලිගල පොල් නිෂ්පාදකයින් (සී.බී.එල්. කොකෝස්) | 1,358,335.65 | 13,935.27 | 8,939.46 | 37,828.06 | | 1,891.38 | 1,417,147.06 |
| M 98 | 1-0065-30-0953-0 | එච්.සී.ඊ. සෝයිසා ඇන්ඩ් කෝ. (සෙරන්ඩිබ් සුපර් ෆුඩ්ස්) | 1,268,148.05 | 12,125.00 | 13,874.00 | 35,336.86 | | 1,766.85 | 1,327,717.06 |
| M 102 | 1-0065-34-3528-8 | නාරා කොකෝ (පුද්.) සමාගම | 349,969.97 | | | 9,718.47 | | 485.93 | 359,202.51 |
| M 103 | 1-0065-30-0957-2 | ශාන්ත තෙරේසා ඩී.සී. මෝල් | 68,358.74 | 14,690.79 | 10,739.51 | 2,018.02 | | 100.90 | 95,706.16 |
| M 105 | 1-0065-30-0959-9 | ඩයි ඇන්ඩ් ඩු රාජපක්ෂ (හේනේගම මෝල්) | 728,015.04 | 4,995.80 | 6,720.00 | 3,392.61 | 681,312.04 | 169.66 | 61,641.75 |
| M 107 | 1-0065-30-0960-2 | චන්ද්‍රා ඩී.සී. ෆයිබර් සහ ටයිල් මෝල් | 270,625.71 | | | 7,515.14 | | 375.77 | 277,765.08 |
| M 108 | 1-0065-30-0962-9 | බත්තුළුඔය මෝල් | 433,243.49 | | | 12,030.87 | | 601.53 | 444,672.83 |
| M 110 | 1-0065-30-0964-5 | උණගහදෙණිය මෝල් (රේණුකා ඇග්‍රි ඔර්ගැනික්ස්) | 991,557.81 | 16,104.00 | 16,289.00 | 27,686.52 | | 1,384.34 | 1,050,252.99 |
| M 111 | 1-0065-30-0965-3 | කුදිරිප්පුව ඩී.සී. මෝල් | 1,001,926.68 | 13,025.00 | 10,920.00 | 27,935.02 | | 1,396.75 | 1,052,409.95 |
| M 113 | 1-0065-30-0967-0 | බෙලුම්මහර ඩී.සී. මෝල් | 104,734.06 | 25,605.90 | 20,743.49 | 3,125.89 | | 156.30 | 154,053.04 |
| M 114 | 1-0065-30-1243-3 | නත්තන්ඩිය මෝල් (පුද්.) සමාගම | 825,027.97 | 10,340.00 | 10,430.00 | 23,007.77 | | 1,150.38 | 867,655.36 |
| M 115 | 1-0065-30-0968-8 | බෝගමුව ඩී.සී. මෝල් | 446,810.42 | 10,375.00 | 11,720.00 | 8,147.56 | 421,810.42 | 407.40 | 54,835.16 |
| M 119 | 1-0065-30-0970-0 | මාතම්මන ඩී.සී. මෝල් | 1,509,987.71 | 24,941.66 | 20,515.86 | 42,144.62 | | 2,107.23 | 1,595,482.62 |
| M 120 | 1-0065-30-0971-8 | ෆාතිමා ඩී.සී. සහ ඔයිල් මෝල් | 117,462.10 | 17,844.00 | 12,455.00 | 3,404.24 | | 170.22 | 150,995.12 |
| M 122 | 1-0065-30-0972-6 | ශාන්ත ජෝසප් ඩී.සී. සහ ෆයිබර් මෝල් | 1,545,210.98 | 27,421.56 | 24,060.18 | 43,150.91 | | 2,157.55 | 1,637,686.08 |
| M 124 | 1-0065-30-0973-4 | මිනුවන්ගොඩ මෝල් | 106,420.69 | | | 2,955.23 | | 147.78 | 109,228.14 |
| M 126 | 1-0065-30-0974-2 | ඩේවිඩ් ඩී.සී. මෝල් (ලක්ෂ්මී ඩී.සී. මෝල්) | 1,026,048.07 | 9,250.00 | 9,350.00 | 28,580.07 | | 1,429.00 | 1,071,799.14 |
| M 127 | 1-0065-30-0976-9 | වික්ටෝරියා ඩී.සී. මෝල් (ඩබ්ලිව්.එම්. ප්‍රනාන්දු ඇන්ඩ් සන්ස්) | 912.54 | | | 25.29 | | 1.28 | 936.55 |
| M 130 | 1-0065-30-0978-5 | බෝයාගනේ ඩී.සී. මෝල් (පුද්.) සමාගම | 721,982.57 | 11,138.40 | 12,623.20 | 20,159.98 | | 1,008.00 | 764,896.15 |
| M 131 | 1-0065-30-0979-3 | ජයකොඩි ඩී.සී. මෝල් (පුද්.) සමාගම | 119,080.40 | 12,467.40 | 6,351.00 | 3,395.81 | | 169.79 | 141,124.82 |
| M 132 | 1-0065-30-0980-7 | ඒෂියන් ඇග්‍රෝ ප්‍රොඩක්ට්ස් (පුද්.) සමාගම | 1,495,279.27 | 21,815.11 | 16,832.99 | 41,704.68 | | 2,085.23 | 1,573,546.82 |
| M 133 | 1-0065-34-3527-0 | උපාලි ඩී.සී. මෝල් | 124,772.10 | 0.00 | 0.00 | 3,464.69 | | 173.24 | 128,063.55 |

| මෝල් අංක | ගිණුම් අංක | මෝලේ නම | 2023.01.01 දිනට ශේෂය | තැන්පතු - නොවැම්බර් 21 | තැන්පතු - දෙසැම්බර් 21 | පොලී 2023 (ජනවාරි - ජූනි) | මුදල් ආපසු ගැනීම් | 2023 සඳහා බදු | 2023.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|
| M 134 | 1-0065-30-0981-5 | ගුණවර්ධන ඩී.සී. මෝල් | 1,039,228.13 | 12,815.00 | 12,678.00 | 28,978.09 | | 1,448.92 | 1,092,250.30 |
| M 136 | 1-0065-30-0982-3 | වෙල්වින් ඩී.සී. මෝල් | 478,342.81 | | | 13,283.46 | | 664.17 | 490,962.10 |
| M 138 | 1-0065-30-0984-0 | කම්මල්පට්ටු පොල් නිෂ්පාදකයින් සමුපකාර සමිතිය ලිමිටඩ්. | 1,048,533.62 | | | 29,117.80 | | 1,455.89 | 1,076,195.53 |
| M 139 | 1-0065-31-0919-4 | සන්හින්ද මෝල් (පුද්.) සමාගම | 826,214.09 | 19,945.00 | 30,716.00 | 23,178.49 | | 1,158.93 | 898,894.65 |
| M 144 | 1-0065-31-2830-0 | ස්වානී මෝල් ලිමිටඩ්. | 1,345,033.05 | 29,465.07 | 20,156.04 | 37,584.06 | | 1,879.21 | 1,430,359.01 |
| M 145 | 1-0065-31-8981-3 | දූනගහ පොල් නිෂ්පාදකයින් සමුපකාර සමිතිය ලිමිටඩ්. | 1,302,964.44 | 17,135.00 | 12,360.00 | 36,321.45 | | 1,816.05 | 1,366,964.84 |
| M 148 | 1-0065-32-9122-7 | ආර්.එම්.පී. කොකෝනට් ප්‍රොඩක්ට්ස් (පුද්.) සමාගම | 717,310.53 | | | 19,919.52 | | 995.98 | 736,234.07 |
| M 149 | 1-0065-34-3526-1 | මාවික්සාල් ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම | 1,227,154.34 | 20,420.00 | 19,755.00 | 34,265.27 | | 1,713.27 | 1,299,881.34 |
| M 150 | 1-0065-34-4854-1 | එන්.ඩී.සී. එක්ස්පෝට් (පුද්.) සමාගම | 600,376.59 | 7,485.00 | 5,892.38 | 16,734.72 | | 836.72 | 629,651.97 |
| M 151 | 1-0065-34-4855-0 | වායඹ ඩී.සී. සහ ඔයිල් මෝල් | 379,003.14 | 8,585.00 | 8,945.00 | 10,606.42 | | 530.33 | 406,609.23 |
| M 152 | 1-0065-34-7387-2 | සන්මික් ෆුඩ් (පුද්.) සමාගම | 53,724.86 | 2,477.50 | 3,824.50 | 1,521.02 | | 76.06 | 61,471.82 |
| M 153 | 1-0065-34-7389-9 | නාවික් මෝල් (පුද්.) සමාගම | 203,820.82 | | | 5,659.88 | | 283.00 | 209,197.70 |
| M 155 | 1-0065-34-8482-3 | වගුරුවෙල ඔයිල් මෝල් (පුද්.) සමාගම | 30,857.47 | 7,200.00 | | 891.46 | | 44.57 | 38,904.36 |
| M 156 | 1-0065-34-9029-7 | වී.එස්.එස්. ප්‍රොඩක්ට්ස් (පුද්.) සමාගම | 4,029.10 | | | 111.73 | | 5.59 | 4,135.24 |
| | | | **44,229,411.09** | **565,531.39** | **536,454.76** | **1,200,378.51** | **2,471,258.87** | **60,019.14** | **44,000,497.74** |

# 06. අභ්‍යන්තර විගණන අංශය

2023 වර්ෂයට අදාළ අභ්‍යන්තර විගණන සැලැස්ම, අධිකාරියේ ක්‍රියාකාරී අංශ වන සැකසුම් සංවර්ධන අංශය, අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය සහ තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයන්හි ක්‍රියාකාරී සැලැස්ම ආවරණය වන පරිදි සහ ඊට අමතරව පරිපාලන අංශය සහ මුදල් අංශවල කටයුතු ආවරණය වන ආකාරයට විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සහ භාණ්ඩාගාරයේ නියෝජිත මහත්මියගේ උපදෙස් පරිදි සකස් කර ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, අනුමත කල විගණන සැලැස්ම පරිදි විගණන පරීක්ෂාවන් සිදුකර වාර්තාවන් 25 ක් ඉදිරිපත් කරන ලදී. කළමනාකාරිත්වය විසින් පවරන ලද විශේෂ විමර්ශන වර්ෂය තුල සිදුකරන ලද අතර, මෙම විමර්ශන වලට අදාළ වාර්තාවන් වර්ෂය තුල සිදුකර කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කර ඇත.

## 6.1 විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

### 6.1.1 සංයුතිය සහ ගණපූර්ණය

රජය සතු ව්‍යවසාය සඳහා ආයතනික පාලනය පිළිබඳව මාර්ගෝපදේශය නම් වූ 2021.11.16 දිනැතිව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත්කර ඇති චක්‍රලේඛය ප්‍රකාරව පොල් සංවර්ධන අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා, එම චක්‍රලේඛ විධිවිධාන අනුව එම කමිටුවේ කටයුතු පවත්වාගෙන යාම සිදුකෙරේ. විගණන හා කළමනාකරණ කමිටු මණ්ඩලය අධ්‍යක්ෂවරුන් සිව්දෙනෙකුගෙන් සමන්විත වේ. සමාලෝචනයට බඳුන්වන වර්ෂයෙහි දී පහත නම් සඳහන් අධ්‍යක්ෂවරුන් කමිටු සාමාජිකයන් ලෙස කටයුතු කරන ලදී.

**2023.02.08 දින පැවති 2023/01 විගණන හා කළමනාකරණ ප්‍රගති සමාලෝචන රැස්වීම**

| | | | |
|---|---|---|---|
| 1. | එම්.සී.එන්. බාලසූරිය මිය | - | භාණ්ඩාගාර නියෝජිත (කමිටු සභාපති) |
| 2. | කේ.එම්.බී.ටී. කරුණාසේන මිය | - | රාජ්‍ය අමාත්‍යංශ නියෝජිත |
| 3. | ප්‍රියලත් කිඹියහෙට්ටිගේ මයා | - | සාමාජික |
| 4. | උපාලි ධම්මික ද සිල්වා මයා | - | සාමාජික |

**2023.06.07 දින පැවති 2023/02 විගණන හා කළමනාකරණ ප්‍රගති සමාලෝචන රැස්වීම**

| | | | |
|---|---|---|---|
| 1. | එම්.සී.එන්. බාලසූරිය මිය | - | භාණ්ඩාගාර නියෝජිත (කමිටු සභාපති) |
| 2. | එන් එස්. වනසිංහ මයා | - | අමාත්‍යංශ නියෝජිත |
| 3. | ප්‍රියලත් කිඹියහෙට්ටිගේ මයා | - | සාමාජික |

**2023.09.06 දින පැවති 2023/03 විගණන හා කළමනාකරණ ප්‍රගති සමාලෝචන රැස්වීම**

| | | | |
|---|---|---|---|
| 1. | එම්.සී.එන්. බාලසූරිය මිය | - | භාණ්ඩාගාර නියෝජිත (කමිටු සභාපති) |
| 2. | එන් එස්. වනසිංහ මයා | - | අමාත්‍යංශ නියෝජිත |
| 3. | ප්‍රියලත් කිඹියහෙට්ටිගේ මයා | - | සාමාජික |

විගණකාධිපතිවරයාගේ නියෝජිතයකු සහ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක 2023 වර්ෂයේ පවත්වන ලද සියළුම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා සහභාගි වී ඇත. ප්‍රධාන අභ්‍යන්තර විගණක වර්ෂයේ පළමු රැස්වීමට සහභාගී වී ඇති අතර, අභ්‍යන්තර විගණක - රා.ආ. විසින් අනෙකුත් සියළුම රැස්වීම් සඳහා සහභාගී වී ඇත. කමිටුවෙහි, කළමනාකරණය නියෝජනය කරන සාමාජිකයින් කිසිවෙකු නොමැත. සභාපති ද වර්ෂයේ එක් රැස්වීමක් සඳහා ආරාධනයෙන් සහභාගීවී ඇති අතර, අධ්‍යක්ෂ ජනරාල් ආරාධනයෙන් රැස්වීම සඳහා සහභාගි වේ. කළමනාකරණයේ අනෙකුත් සාමාජිකයින්ගේ සහභාගීත්වය කමිටුවට අවශ්‍ය වූ විට, රැස්වීම සඳහා සහභාගී වීමට ආරාධනා කරනු ලබයි. කමිටුවෙහි ගණපූර්ණය සාමාජිකයින්ගේ සරල බහුතරය වේ.

### 6.2 කමිටුවෙහි කාර්යය භාරය

- පූර්ව අවසාන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව සමාලෝචනය කරමින් කමිටු උපදෙස් සහ නිර්දේශ නිසි පරිදි ක්‍රියාත්මක කිරීම පිළිබඳ විමසා බැලීම.
- ආකෘති සහ අන්තර්ගතය සමාලෝචනය කිරීම සහ පොල් සංවර්ධන අධිකාරියෙහි මූල්‍ය වාර්තාකරණ ක්‍රමයෙහි විශ්වසනීයත්වය අධීක්ෂණයට ලක් කිරීම.
- බාහිර සහ අභ්‍යන්තර විගණන කාර්යයෙහි විෂය මූලිකත්වය හා සඵලදායකත්වය සහතික කිරීම සඳහා යොදා ඇති ක්‍රියා මාර්ග නියාමනය හා සමාලෝචනය කිරීම.
- අභ්‍යන්තර පාලනයන්හි යෝග්‍යතාවය සහ සාර්ථකත්වය සමාලෝචනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.
- අභ්‍යන්තර විගණන වාර්තා, බාහිර විගණන විමසුම් හා ඒ සඳහා ගන්නා ලද පියවර සමාලෝචනය කිරීම.
- නියාමන සහ මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා සමග අනුගත විම සහ අදාළ නියාමන අධිකාරීන් සමග පවත්නා සම්බන්ධතා සහතික කිරීම සඳහා වන ආචාර ධර්මානුකූල ප්‍රමිතීන් හා ක්‍රියාපටිපාටීන් පිළිබඳ සමාලෝචනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

### 6.3 රැස්වීම් සහ ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂය තුල තුන්වරක් (03) කමිටු රැස්වීම පවත්වන ලදී. රැස්වීම සඳහා කමිටු සාමාජිකයන්ගේ පැමිණීම පහත සඳහන් පරිදි වේ.

වගුව 41 - ප්‍රගති සමාලෝචන රැස්වීම්

| කමිටු සාමාජිකයාගේ නම | සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|
| එම්.සී.එන්. බාලසූරිය මිය | 03 |
| කේ.එම්.බී.ටී. කරුණාසේන මිය | 01 |
| එන් එස්. වනසිංහ මයා | 02 |
| ප්‍රියලත් කිඹියහෙට්ටිගේ මයා | 03 |
| උපාලි ධම්මික ද සිල්වා මයා | 01 |

සමාලෝචිත වර්ෂය කමිටුව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාවට නංවන ලදී.

### 6.3.1 අභ්‍යන්තර විගණනය

- අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු වලට අදාළව 2023 වර්ෂය සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිර්දේශයන්ද සැළකිල්ලට ගනිමින් පිළියෙල කරනු ලැබූ අභ්‍යන්තර විගණන වැඩසටහන සහ විගණන සැලැස්ම සාකච්ඡාවට භාජනය කර, වැඩිදුරටත් විගණනයට භාජනය කලයුතු ක්ෂේත්‍රයන් පිළිබඳ උපදෙස් දීම සහ විගණන වැඩසටහන සහ විගණන සැලැස්ම මණ්ඩලීය අනුමැතිය සඳහා නිර්දේශ කිරීම.
- 2022 වර්ෂය සඳහා වන අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙහි සඵලදායකත්වය අධීක්ෂණයට ලක් කරන ලදී.
- අභ්‍යන්තර විගණන විමසුම් වලට පිළිතුරු ලබාදීමේ ප්‍රගතිය ඇගයීම.
- අනාගතයේදී නැවත සිදුවීම් වලක්වනු පිණිස කාලීන නිරවද්‍ය පියවරයන් ගැනීමේ අරමුණින් යුතුව විශේෂ අභ්‍යන්තර විගණන සොයාගැනීම් හා ඒවා සඳහා කළමනාකරණයේ ප්‍රතිචාර සමාලෝචනයට ලක් කරන ලදී.

### 6.3.2 බාහිර විගණනය

- 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පොල් සංවර්ධන අධිකාරිය සම්බන්ධයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම්වලට අදාළව පිළිතුරු යැවීමේ ප්‍රගතිය ඇගයීම සහ කළමනාකරණය විසින් දක්වන ලද පිළිතුරු සමාලෝචනයට ලක් කරන ලද අතර, විශේෂයෙන් පෙන්වාදෙන ලද ගැටළු නැවත ඇති වීම වළක්වනු පිණිස කළමනාකරණය විසින් ගන්නා ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳව පසු විපරම් කරන ලදී. 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළිබඳ 2018 අංක 19 දරණ විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර වාර්තාව සහ 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහිත එහි කටයුතු පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව සභාපති වෙත ඉදිරිපත් කරන ලද විස්තරාත්මක විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳ කමිටුව විසින් අවධානය යොමුකල අතර, එම කරුණු වලට අදාළව ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව පසුවිපරම් සිදුකර ඇත.

- 2023.07.06 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා කමිටු රැස්වීමේදී ලබාදී ඇති නිර්දේශ පිළිබඳව සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව කමිටුව විසින් අවධානය යොමු කොට ඇති අතර, ඒවා සම්බන්ධව පසු විපරම් කටයුතු සිදුකරන ලදී.

6.3.3 මූල්‍ය වාර්තාකරණය

- වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණ හා නියාමන අධිකාරිය විසින් නියම කරන ලද අවශ්‍යතාවයන්ට හා අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇති බවට සහතික කිරීමේදී අධිකාරියට සහයවන ලදී.

6.3.4 රැස්වීම් වාර්තා/අධිකාරියට වාර්තා කිරීම්

- කමිටු පැවැත්වීම පිළිබඳ යෝග්‍ය රැස්වීම් වාර්තා අභ්‍යන්තර විගණන අංශය මගින් පවත්වාගෙන යනු ලැබේ. රැස්වීම්වල සියළුම වාර්තා සභාගත කරන ලද අතර, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සම්මත කර ගන්නා ලදුව කමිටුව විසින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලීය අනුමැතිය ලබා ගනු ලැබේ. ක්‍රමික පදනමක් මත කැපී පෙනෙන කරුණු සම්බන්ධයෙන් පසු පියවරයන් ගනු ලැබේ. අධිකාරියෙහි අනුගත රාමුවට සහ යෝග්‍ය අවස්ථාවන්හිදී ගන්නා ලද නිවැරදි කිරීමේ සහ වළක්වාලීමේ පියවරයන් සම්බන්ධයෙන් පසුවිපරම් සිදුකර ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීඑල්/එෆ්/සීඩීඒ/01/2023/10 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2024 ජූලි 19 දින

සභාපති

පොල් සංවර්ධන අධිකාරිය

පොල් සංවර්ධන අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පොල් සංවර්ධන අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 48 ඡේදය අනුව අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවද, රු.24,129,049 ක විවිධ ණයගැති ශේෂය තුළ රු.2,464,299ක බැර ශේෂයක් ඇතුළත් වී තිබුණි.

(ආ) පොල් සංවර්ධන අධිකාරිය සතු දුන්කන්නාව වත්තේ භාවිතයට ගන්නා වත්කම් අයිතම 101 ක වටිනාකම ගණනය කර දේපළ පිරියත යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) අධිකාරියේ කොටුව කාර්යාලයේ ස්ථාපිත කර ඇති ව්‍යාපාරික සේවා මධ්‍යස්ථානයට සමාගම් 7කින් රු.4,869,826 ක් වටිනා වත්කම් පරිත්‍යාග ලෙස 2023 වර්ෂයේදී ලැබී තිබුණද එම වත්කම් ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ) අපනයනකරුවන්ගේ ලියාපදිංචි ගාස්තු හා අලෙවිකරණ අංශයේ ආදායම රු.28,305,500 ක් වුවද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ එම ආදායම රු.34,970,431 ක් වූයෙන් රු.6,664,931 ක වෙනසක් හා අපනයන සේවා ගාස්තු ආදායම රු.269,307,360 ක් වුවද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ එම ආදායම රු.268,180,717ක් වූයෙන් රු.1,126,643 ක වෙනසක් ද විය.

(ඉ) 2023 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ හඳුනානොගත් බැර ශේෂ රු.8,018,127 ක් හා හඳුනා නොගත් හර ශේෂ රු 5,184,737 ක් පැවතියද එම අගය වෙන වෙනම ගිණුම් ගත නොකර එහි ශුද්ධ අගය වූ රු.2,833,390 ක් හඳුනා නොගත් බැර ශේෂ ලෙස ජංගම වගකීම් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ඊ) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.170,788,322 ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සමුච්චිත අරමුදලට රු.167,993,514 ක් බැර කර තිබුණු බැවින් සමුච්චිත අරමුදල රු.2,794,808 කින් අවප්‍රමාණ වී තිබුණි.

(උ) රාජ්‍ය සමාගමකට අධිකාරිය විසින් ලබාදුන් රු.58,265,037 ක ණය මුදල එම සමාගමෙන් සෘජුවම මුදල් අමාත්‍යාංශය වෙත නැවත ගෙවීම් කර තිබුණි. එම ණය නිරවුල් කිරීම ගිණුම් තැබීමේදී එම මුදල අධිකාරියේ සමාලෝචිත වර්ෂයේ ආදායමට හර කිරීම නිසා අතිරික්තය එම ප්‍රමාණයෙන් අවප්‍රමාණය වී තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2

## 1.3 අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

3

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2.** වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (අ), (ඈ), (ඇ), (ඊ), (ක) හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.2** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව

| | නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 33 (4) වගන්තිය | පොල් පිළිබඳ සෙස් බද්ද පැනවීම, අය කර ගැනීම, ක්‍රියාත්මක කිරීම හා ගෙවීම් කිරීම සඳහා අවශ්‍ය සියළු කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය යුතු වුවද අධිකාරිය විසින් ඒ සම්බන්ධයෙන් කිසිදු නියෝගයක් සකස් කර නොතිබුණි. එසේ වුවද 2007 වර්ෂය දක්වා මෝල් සංවර්ධන අරමුදලට සෙස් ආදායමින් හා ඊට පසු වර්ෂවලදී භාණ්ඩාගාර ප්‍රදානවලින් ලැබූ අපනයනය කරන සෑම කි. ග්‍රෑ 1 කට ශත 20 බැගින් වූ මුදලක් අපනයනය කරන මෝල් හිමියන් නමින් ඉතිරිකිරීමේ ගිණුම් පවත්වාගෙන ගොස් තිබූ අතර වර්ෂය අවසානයේ ගිණුම් 58 ක රු.44,000,497 ක ශේෂයක් විය. 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා එම ගිණුම් වලින් රු.11,814,955 ක මුදලක් එම මෝල් හිමියන් වෙත ආපසු ගෙවා තිබුණි. |
| (ආ) | 1975 අංක 24 දරන පනතින් සංශෝධිත 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 51 වගන්තිය හා 1979 දෙසැම්බර් 31 දිනැති අංක 69/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළමු වන උපලේඛනයේ 3 වන ඡේදය | අපනයනය කරනු ලබන පොල් නිෂ්පාදනවල ගුණාත්මක ප්‍රමිති නියම කිරීම හා පවත්වාගෙන යාම අධිකාරිය විසින් කළ යුතු වුවද 2023 වර්ෂයේදී ඇ.එ.ජ. ඩොලර් 277,510 ක් වූ පොල් ආශ්‍රිත නිෂ්පාදන (දිසිදි පොල් හැර) මෙ.ටො. 172,685 ක් අපනයනය කර තිබුණද ඒ පිළිබඳ කිසිදු තත්ත්ව පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |
| (ඇ) | 1987 දෙසැම්බර් 10 දිනැති අංක පොසංඅ/දිපො/මෝ/87/15 අභ්‍යන්තර චක්‍රලේඛයෙහි 3 හා 4 වගන්ති | දිසිදි පොල් නිෂ්පාදනයන් පරීක්ෂා කිරීම, ආදර්ශ ගැනීම, තත්ත්වය සහතික කිරීම හා අපනයනය කිරීමට අදාළව ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය වැනි විශේෂ වෙළඳපලවල් සඳහා අපනයනය කරන්නා වූ දිසිදි පොල් නිෂ්පාදනයන් පරීක්ෂා කිරීමට දෛනික නිෂ්පාදනයෙන් සියයට 25ක ආදර්ශ එකතු කිරීමත් එසේ එකතු කරනු ලබන |

ආදර්ශ ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර වලට අනුකූල දැයි පරීක්ෂා කිරීමත් සිදු කළ යුතු වුවද 2023 වර්ෂය තුළදී දිසිදි පොල් මෙ.ටෝ 5,082 ක් එම රටවලට අපනයනය කර තිබුණද පරීක්ෂා කිරීම සඳහා ආදර්ශ එකතු කිරීම සියයට 10 ක් පමණක් සිදු කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ද) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඪ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

පරිගණක ටැබ්ලට් 50 ක් මිලදී ගැනීම සඳහා වූ ප්‍රසම්පාදනයේදී එක් ආයතනයකින් මුලදී රු.117,700 කට මිල ගණන් ලැබී පසුව එය නොසලකා නැවත මිල කැඳවා එම ආයතනයෙන්ම ටැබ්ලට් 46 ක් රු.150,800 කට මිලදී ගැනීමට කටයුතු කිරීමෙන් අධිකාරියට රු.1,522,600 ක මූල්‍ය පාඩුවක් සිදු වී තිබුණි.

## 2.3 වෙනත් කරුණු

කොහු කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා පුහුණු මධ්‍යස්ථානයක් වශයෙන් 2006 වර්ෂයේදී දූන්කන්නාව කොහු සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය ආරම්භකර තිබුණද 2023 වර්ෂයේ පුහුණු පාඨමාලාවන් එකක් හෝ පවත්වා නොතිබීම, කර්මාන්ත ශාලාවේ පවතින යන්ත්‍ර 18 න් 14ක්ම අක්‍රිය තත්ත්වයේ පැවතීම හා ක්‍රියාකාරී මට්ටමේ පවතින යන්ත්‍ර ද අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින බැවින් පුහුණු මධ්‍යස්ථානය පිහිටු වීමේ අරමුණු ඉටු නොවන බවත් පවතින වත්කම් සියල්ල නිශ්කාර්යව දිරායමින් පවතින බවත් නිරීක්ෂණය විය.

ලිව්.පී.සී. වික්‍රමරත්න
කාධිපති